# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2018



සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**DEPARTMENT OF SAMURDHI DEVELOPMENT**

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Primary Industries and Social Empowerment

පිටුව


| | |
|---|---|
| ❖ අන්තර්ගතය | 01 |
| ❖ ස්තුතිය | 02 |
| ❖ දැක්ම හා මෙහෙවර | 03 |

| | |
|---|---|
| 01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | 4-8 |
| 02. පාලන හා ආයතන අංශයේ කාර්යසාධනය | 9-17 |
| 03. මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යසාධනය | 18-26 |
| 04. විමර්ශන අංශයේ කාර්යසාධනය | 27-28 |
| 05. 2018 - සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය | 29 |
| 06. සමාජ සුබසාධන අංශයේ කාර්යසාධනය | 30-36 |
| 07. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යසාධනය | 37-45 |
| 08. සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය | 46-57 |
| 09. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යසාධනය | 58-64 |
| 10. ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශයේ කාර්යසාධනය | 65-73 |
| 11. ව්‍යවසාය සංවර්ධන අංශයේ කාර්යසාධනය | 74-80 |
| 12. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යසාධනය | 81-85 |
| 13. මාධ්‍ය අංශයේ කාර්යසාධනය | 86-91 |
| 14. ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යසාධනය | 92-120 |
| 15. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය | 121 |
| 16. ගිණුම් වාර්තා | 122-123 |

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# ස්තූතිය

2017 අංක 02 දරණ දිවිනැගුම (සංශෝධන) පනතින් සංශෝධිත , 2013අංක1 දරණ දිවිනැගුම පනතින් පිහිටුවා ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගනිමින්, රටටත්, රටේ දිළිඳු ජනතාවටත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ඉටුකිරීම සඳහා, 2018 වර්ෂයේදී ඇපකැපවී කටයුතු කළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යමණ්ඩලයට පළමුව කෘතඥතාවය පලකරමි.

තවද, ඉහත පරිදි වන ජනතා සේවයන් සැලසීමේදී, නිසි මගපෙන්වීම් ලබාදෙමින්, මෙම දෙපාර්තමේන්තුව වෙත දැක්වූ කාරුණික සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන් ඇතුළු අදාල සියලු නිලධාරීන්ටත්, සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පිරිනමමි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු, සහනාධාර සහ සමාජ සුබසාධන සේවා නිසිපරිදි පවත්වාගෙන යාමට දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් දැක්වූ කාරුණික සහයෝගය හා රාජකාරී කැපවීම් කෘතවේදීව සිහිපත්කරමි.

අවසාන වශයෙන්, 2018 වසරේ අප දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී, නන් අයුරින් සහයෝගය දැක්වූ සියලුම අදාල රාජ්‍ය ආයතනවලටත්, අනෙකුත් අදාල ආයතන හා පුද්ගලයන්ටත් ස්තූතිය පුදකරමි.

**මහේෂ් පෙරේරා**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්,මෙහෙයුම් හා ඇගයුම්)**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

## අපගේ දැක්ම

**"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"**

## අපගේ මෙහෙවර

**අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජයීය, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.**

## 01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

1995 අංක 30 දරණ පනත මගින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරී තුන සහ උඩරට ගැමිපුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ද ඇතුලුව, රාජ්‍ය ආයතන 05ක් ඒකාබද්ධ කරමින්, 2013 අංක 01 දරණ දිවිනැගුම පනතට අනුව, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවනලදි. දිවිනැගුම පනතේ විධිවිධාන අනුව, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2014 ජනවාරි 03 දිනැති අංක 1843/47 දරණ ගැසට් නිවේදනය පළ කිරීමෙන් පසු, මෙම දෙපාර්තමේන්තුව නිල වශයෙන් ස්ථාපිත කරන ලදි. අනතුරුව, ඉහත ආයතන 05 හි සේවය කරන ලද 26,000 කට අධික සේවකයින් නව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලදි. ඉන් අනතුරුව, 2017 අංක 02 දරණ දිවිනැගුම සංශෝධන පනත මගින් දෙපාර්තමේන්තුවේ නාමය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය කරණ ලදි. මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය දිවයිනේ දිස්ත්‍රික් 25 තුළ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331ක් තුළ සහ ග්‍රාම නිලධාරී වසම් 14,022 ක් ආවරණය වන පරිදි පැතිර පවතී. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක කිරිම සඳහා දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ද, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ද, ප්‍රාදේශීය ලේකම්වරුන් ද සෘජුව දායක වේ.

දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ළඟා කර ගැනීම සඳහා, දිළිඳු බව තුරන්කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කරමින් පුද්ගලයා, පවුල, කණ්ඩායම සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන අරමුණකි. මේ සඳහා, දිවයින පුරා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කොට, ජාතික, දිස්ත්‍රික් හා ප්‍රදේශීය මට්ටමේ සම්බන්ධීකරණ ජාලයන් ගොඩනැගීම, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය ප්‍රවර්ධනය කිරීම මගින් ඉලක්කගත ප්‍රජාවට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම හා ජාතික සංවර්ධන ක්‍රියාවලියට ජනතාව ඒකරාශි කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තවත් මූලික අරමුණකි. මේ සඳහා, 2013 අංක 01 දරණ දිවි නැගුම(සමෘද්ධි) පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

(I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
(II) ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
(III) ප්‍රජාමූල සංවිධාන ධාරාව

## (I) නිල ව්‍යුහය සහිතදෙපාර්තමේන්තු ධාරාව

දෙපාර්තමේන්තුවේ නිල ව්‍යුහයේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ ප්‍රධාන අංශ 16 ක ප්‍රධානින් මගින් ක්‍රියාත්මක එනම් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(2), පාලන හා ආයතන, සමාජ ආරක්ෂණ හා සුබසාධන හා සමාජ සංවර්ධන හා පරිසර සංවර්ධන, ප්‍රජාමූල සංවිධාන, ව්‍යවසාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, ආර්ථික සවිබල

ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන හා ප්‍රජා මූල බැංකු යන අංශ භාර අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය යන අංශ භාර ප්‍රධානින් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 අවරණය වන ලෙසින් තම අංශ වල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින්, දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික්ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් (සමෘද්ධි) අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මගින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් දිවිනැගුම(සමෘද්ධි) පනතේ අරමුණු ළඟා කර ගැනීමට අදාල රාජකාරි ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජා මූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන්, සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි.

## (II) ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මගින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 කට අදාල මූලස්ථාන කාර්යාල හා ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාමනිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1074 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මගින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මගින්, සමෘද්ධි සහනාධාර බෙදාදීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීමේ තැන්පතු පවත්වාගෙන යාම,ප්‍ර තිලාභීන්ට හා අඩු ආදායම් ලාභීන්ට ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

2018 වර්ෂය තුළදී, ජීවනෝපාය කටයුතු සඳහා ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණයක්‍රම 21 ක් මඟින් ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි. 43,645.93කි. ඊට අදාල ණය සංඛ්‍යාව 666,051කි. 1999 සිට 2018 වර්ෂය අවසාන වන විටප්‍ර තිලාභීන්ට ලබා දී තිබූ මුළු ණයවල සමුච්චිත වටිනාකම රු.මි. 264,519.13 කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 8,868,512 කි. තවද මෙම අංශයේ සියලු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවලි ගතකොට, ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අපේක්ෂිතය. මෙම අංශයට අදාල කාර්යසාධනය සම්බන්ධ තොරතුරු අංක 14 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

## (III) ප්‍රජාමූලසංවිධානධාරාව

2017 අංක 2 දරණ සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක1 දරණ දිවිනැගුම පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුලත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටුකිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘදිධි පනතේ 9වන වගන්තිය), ප්රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය), සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත්, (සමෘද්ධි පනතේ 19වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා

ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2018 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 30,211 ක් ද ප්‍රාදේශීය සංවිධාන 331ක් සහ දිස්ත්‍රික් කමිටු 25 ක් ක්‍රියාත්මකව පවතී. පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සඳහා, 2018 වසර තුලදී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ නිළධාරීන් 132 ක්, මූලස්ථාන කළමණාකරුවන් 331ක්, ප්‍රජාමූල සංවිධාන විෂය භාර නිළධාරීන් 25ක්, ඇතුළුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සියලුම සමෘද්ධි කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් දැනුවත් කිරීම් සිදුකර ඇත. මීට අමතරව ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන්, ලේකම්වරුන්, භාන්ඩාගාරිකවරුන් සහ ගණන් පරික්ෂකවරුන් යන ප්‍රජා නියෝජිතයින් 1,324 ක් සඳහා ප්‍රජාමූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවිධානවල ක්‍රියාකාරිත්වය සහ කාර්ය භාරයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 26 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම අංශයට අදාල 2018 වසරේ කාර්යසාධනය සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු අංක 09 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

එමෙන්ම, 2018 වසරට අදාලව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලඟා කර ගත් කාර්යසාධනය පිළිබඳ සාරාංශ විස්තරයක් පහත දක්වා ඇත.

## ජීවනෝපාය සංවර්ධනය මූලික කොටගත් සංවර්ධන ව්‍යාපෘති

2016-2030 ට අදාලව ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කර ඇති තිරසර සංවර්ධන ඉලක්ක 17 තුල ප්‍රධාන කරුණක් ලෙස දිළිඳුකම පිටුදැකීම හා කුසගින්න ශුන්‍ය කිරීම යන කරුණු ඇතුලත් කර ඇත.

2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ද දිළිඳු පවුල් සවිබල ගන්වා ඔවුන් දිළිඳු බවින් මුදවා ගැනීමේ ප්‍රධාන අරමුණ පෙරදැරි කරගනිමින්, දෙපාර්තමේන්තුවේ සියලු ව්‍යාපෘති සැලසුම් කරණ ලදි. මෙහිදී දිළිඳු පවුල් සවිබලගැන්වීම තුලින් බලාපොරොත්තු වනුයේ ඔවුන් ආර්ථික, සමාජයීය, ශාරීරික, මානසික හා නෛතික යන සියලු ක්ෂේත්‍රයන්ගෙන් ඒකාබද්ධ වූ සමස්ත වශයෙන් සවිබල ගැන්වූ ශක්තිමත් පිරිසක් බවට පත්කිරීමයි. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර නව මාවතකට යොමුකර ඇති අතර, එම දැක්ම හා එයට අදාල අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම ආරම්භ කරණ ලදි.

ඒ අනුව, 2018 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, මහා භාණ්ඩාගාරයෙන් සෘජුව රු.මි. 2,000.00 ක ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවට ලැබුණි. ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතර, කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති, සත්ත්ව පාලන ව්‍යාපෘති, ධීවර සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා කර්මාන්ත සංවර්ධන වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම තුළින් දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභි පවුල්වල හා අඩු අදායම්ලාභි පවුල්වල අදායම් මට්ටම ඉහල නැංවීමත්, එම පවුල්වල සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරිමත්, රැකියා වෙළඳපොළට උචිත ශ්‍රමිකයින් සැපයීම සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමත් ප්‍රධාන කාර්යයන් වේ.

2018 වර්ෂයතුළ, මෙම දෙපාර්තමේන්තුවේ සියලු සංවර්ධන අංශ මගින්, නිම කිරීමට සැලසුම් කරණ ලද ව්‍යාපෘති සංඛ්‍යාව 50,830 ක් වූ අතර වර්ෂය අවසානයේ ව්‍යාපෘති 41,789 ක් නිම කිරීමට හැකිවිය. ඒ අනුව

වර්ෂය අවසානයේ රු.මි. 1,006.89 ක් වැය කරමින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, 2018 වර්ෂය තුළදී ළඟාකර ගත් මූල්‍ය ප්‍රගතිය 63% ක් වන අතර, භෞතික ප්‍රගතිය 82% කි.

මෙම අංශ යටතේ, ඉහත දැක්වූ උප අංශ සහ දිස්ත්‍රික් වශයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති, ඒ සඳහා වැයකල මුදල්, ව්‍යාපෘති හා ප්‍රතිලාභීන් පිළිබඳ වැඩිදුර තොරතුරු අංක 08 සිට 13 දක්වා වන පරිච්ඡේද යටතේ දැක්වේ.

## අනෙකුත් අංශවල කාර්යසාධනය

2018 වර්ෂය තුළදි අනෙකුත් සේවා හා සංවර්ධන අංශවල කාර්යසාධනය පිළිබඳ දත්ත හා තොරතුරු පහත පරිදි මෙම වාර්තාව තුළ ඇතුලත් කර ඇත. එනම්, සහායක සේවා වශයෙන් 2018 වසර තුළ දි පාලන හා ආයතන, මානව සම්පත් සංවර්ධන හා විමර්ශණ අංශ ළඟාකරගත් කාර්යසාධනය පිළිවෙලින් අංක 02, 03 හා 04 පරිච්ඡේද යටතේ ද, සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ අංශයට අදාලව ළඟාකරගත් කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පිළිවෙලින් අංක 06 හා 07 පරිච්ඡේද යටතේද, සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු අංක 08 පරිච්ඡේදය යටතේද, ව්‍යවසාය සංවර්ධන අංශයේ කාර්යසාධනය අංක 11 පරිච්ඡේදය යටතේ ද දක්වා ඇත. ඊට අමතරව, තොරතුරු හා තාක්ෂණ අංශයේ කාර්යසාධනය අංක 12 පරිච්ඡේදය යටතේද, මාධ්‍ය අංශයේ කාර්යසාධනය අංක 13 පරිච්ඡේදය යටතේද, ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශයේ හා ගිණුම් වාර්තා සම්බන්ධ විස්තර අංක 15 හා 16 පරිච්ඡේදය යටතේද දක්වා ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානම වැඩසටහනක් වන සමෘද්ධි සහනාධාර වැඩසටහනේ 2018 වර්ෂයට අදාළ සාරාංශ ගත ප්‍රගතිය පහත පරිදි වේ. එනම්, සහනාධාරලාභී පවුල් 1,384,021 දෙනෙකුට ලබාදුන් මුළු සහනාධාර වටිනාකම රු.මි. 39,238.79 ක් වන අතර, එම මුදල වැය කරනු ලැබුවේ, මෙම වසරේ සහනාධාර වෙනුවෙන් දෙපාර්තමේන්තුවට වෙන් කරනු ලැබු රු.මි 39,600.00 ක මුළු ප්‍රතිපාදන මුදලිනි.

මීට අමතරව, සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ 2018 වර්ෂය තුලදී, සමාජ ආරක්ෂණ අරමුදලින් රු.මි.1,159.47 ක් වැය කොට, ප්‍රතිලාභීන් 282,013 දෙනෙකුට ඔවුන්ගේ දෛනික ජීවිතයේ උපතේ සිට මරණය දක්වා වු වැදගත් සිදුවීම්වලට අදාළව පහත සඳහන් ලෙස ප්‍රතිලාභ ලබාදීමටහැකිවිය.

| | |
|---|---|
| උපත් සඳහා 7,500.00 බැගින් | 6,707 දෙනෙකුට |
| මරණ සඳහා 15,000.00 බැගින් | 29,620 දෙනෙකුට |
| විවාහ සඳහා 7,500.00 බැගින් | 29,544 දෙනෙකුට |
| රෝග සඳහා 7,500.00 බැගින් | 58,578 දෙනෙකුට |
| (දිනකට රු. 250.00 බැගින් උපරිම දින 30 ට) | |
| ශිෂ්‍යත්ව සඳහා 1,500.00 බැගින්මාස 24 ක් | 10,000 දෙනෙතුට |
| විශේෂ උපත් සඳහා | 12,722 දෙනෙකුට ආදී වශයෙන් |
| (නිවුන් දරු උපත් 02 ට රු.5,000.00 ක් සහ | |
| නිවුන් දරු උපත් 03 ට හෝ ඊට වැඩි රු.10,000.00 බැගින්) | |

ඉහතින් දැක්වූ වැඩසටහන් වලට අමතරව, 2018 වසරේ කාර්ය මණ්ඩල පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු සඳහා රු.මි. 86 ක් වෙන් කරනු ලැබූ අතර, ඉන් රු.මි. 33.24 ක් වැය කොට, කාර්යමණ්ඩල සාමාජිකයින්

27,576 දෙනෙකුට පුහුණු අවස්ථා / ප්‍රතිලාභ ලබා දෙන ලදී. ඒ අනුව, ඊට අදාලව ලඟාකරගත් මූල්‍ය ප්‍රගතිය 39% කි. මෙම අංශය මඟින් ව්‍යාපෘති 442ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කරගෙනතිබූ අතර, නිම කල ව්‍යාපෘති ගණන 397කි.

මීට අමතරව, 2018 වර්ෂයේදි, මුලින් සඳහන් කල රාජ්‍ය ආයතන 05 න් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය හා අග්‍රහාර රක්ෂණ පහසුකම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අදාල ලිපිගොනු සකස් කිරීමේ කටයුතුද, දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීමේ පටිපාටිය හා ආයතනික පාරිපාලන ව්‍යුහය සකස් කිරීමේ කටයුතු, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය සේවා කොමිසම් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අඛණ්ඩව ඉටුකරනලදී.

ඉහත දැක්වූ පසුබිම තුළ, දෙපාර්තමේන්තුව සංවිධානමය හා පරිපාලනමය වශයෙන් ස්ථාවර කිරීමට අදාලව විවිධ ප්‍රායෝගික අපහසුතා සහ ගැටලුවලට මුහුණ දෙමින්, ප්‍රතිලාභීන්ගේ ජීවන මට්ටම උසස්කරලීමට රු.මි.1,006.89 ක් වැයකොට, සංවර්ධන ව්‍යාපෘති 41,789 ක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට හැකිවීමද විවිධ ක්‍රම මඟින් ප්‍රතිලාභීන් 666,051 ට රු.මි. 43,645.93 ක ණය ලබාදීමට හැකිවීමද දෙපාර්තමේන්තුව ළඟාකරගත් ජයග්‍රහණයකි. ඒ ඔස්සේ දිවිනැගුම පනතේ 04 වගන්තියේ සඳහන් පරමාර්ථ යම්තාක් දුරකට ළඟාකර ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි. එමෙන්ම, අප රටේ දිවිනැගුම (සමෘද්ධි) සහනාධාරලාභී හා අඩු ආදායම්ලාභී ජනතාව සවිබල ගන්වමින්, ඔවුන්ගේ ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන කටයුතු වේගවත් කරමින්, ඔවුන් දිළිඳු බවින් මුදවාලීමටත්, ඔවුන් රටේ ප්‍රධාන ආර්ථික ධාරාවේ සක්‍රීය හා ස්ථාවර කොටස්කරුවන් බවට පත්කරලීමේත් උදාර අරමුණු ළඟාකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව 2018 වසරේ ක්‍රියාත්මක වන ලදී. එම අරමුණු යථාර්තවාදීව, මුළුමනින්ම ළඟා කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව ඉදිරියටත් දැඩි කැපවීමකින් ක්‍රියාකරන බව සතුටින් සඳහන් කරමි. ඉදිරි වර්ෂවලදී එම අරමුණු ළඟාකරගැනීම සඳහා අභිප්‍රේරණය වූ සහ කැපවූ මානව සම්පතක් නිර්මාණය කරලීමේ අරමුණද ඇතිව ඉදිරි සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කරන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

**එස්.ඊ.ආර්.ටී.එම්. එස්.පී. බණ්ඩාර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

# 02 පාලන හා ආයතන අංශයේ කාර්යසාධනය - 2018

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන හා ආයතන අංශය - පාලන, ආයතන, නීති හා විමර්ශනවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරි වේ.**

## 2.1.1. ප්‍රධාන අරමුණු

- ❖ බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ❖ ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

## 2.1.2. දෛනික රාජකාරි

- ❖ දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීම.
- ❖ අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- ❖ මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- ❖ සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ❖ ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- ❖ සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලූම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- ❖ නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛණ වාර්තා නඩත්තු කිරීම.
- ❖ අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු රාජකාරි කටයුතු.
- ❖ නිලධාරින් හා සම්බන්ධ විනය පරිපාලන රජකාරි කටයුතු

## 2.1.3. විශේෂ පැවරුම්

- ❖ පාලන අංශයට අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- ❖ මහජන පෙත්සම් කාරක සභා රාජකාරි කටයුතු.
- ❖ පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් වලින් පැන නගින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනිකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- ❖ පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරින් බඳවා ගැනීම.
- ❖ සමාජ සවිබලගැන්වීම් පිළිබඳ අධීක්ෂණ කාරක සභාව මගින් ඉදිරිපත් වන ගැටළු සඳහා පිළිතුරු ලබාදීම.

2.1.4 සංවිධාන ව්‍යුහය

## Organizational Chart – National Level:



## Organizational Chart – District Level:




**SSM** – Senior Samurdhi Manager

**SDO** – Samurdhi Development Officer

### 2.1.4. කාර්ය මණ්ඩලය

ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය 25,794 කි.

**සංඛ්‍යා සටහන-2.1 - යෝජිත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු (සාරාංශය)**

| අනු අංකය | තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ යෙදීසිටින සංඛ්‍යාව | පුරප්පාඩුසංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 0 | 1 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2 | 2 | 0 |
| | | 1 | 1 | 0 |
| 3 | අධ්‍යක්ෂ | 7 | 0 | 7 |
| 4 | අධ්‍යක්ෂ | 5 | 1 | 4 |
| 5 | අධ්‍යක්ෂ | 1 | 1 | 0 |
| 6 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 7 | ප්‍රධාන අභ්‍යන්තර විගනක | 1 | 1 | 0 |
| 8 | සහකාර අධ්‍යක්ෂ | 3 | 3 | 0 |
| 9 | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 426 | 29 | 397 |
| 10 | දිස්ත්‍රික් අධ්‍යක්ෂ | 20 | 20 | 0 |
| 11 | දිස්ත්‍රික් අධ්‍යක්ෂ | 5 | 5 | 0 |
| 12 | ගණකාධිකාරි | 28 | 6 | 22 |
| 13 | අභ්‍යන්තර විගණක | 2 | 2 | 0 |
| 14 | නීති නිලධාරි | 1 | 1 | 0 |
| 15 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 16 | පද්ධති විශ්ලේෂක | 1 | 1 | 0 |
| 17 | මුදල් සහකාර | 1 | 1 | 0 |
| 18 | ප්‍රවෘත්ති නිලධාරි | 1 | 1 | 0 |
| 19 | අභ්‍යන්තර විගණන නිලධාරි | 10 | 8 | 2 |
| 20 | සමෘද්ධිකළමනාකරු (විශේෂ ශ්‍රේණිය) | 2011 | 1850 | 161 |
| 21 | පෝෂ්‍ය සම්බන්ධීකරණ නිලධාරි | 20 | 20 | 0 |
| 22 | සම්බන්ධීකරණ නිලධාරි | 56 | 52 | 4 |
| 23 | සමෘද්ධිකළමනාකරු (VI a ශ්‍රේණිය) | 388 | 549 | |
| 24 | සංවර්ධන නිලධාරි | 48 | 48 | 0 |
| 25 | සංවර්ධන සහකාර | 7 | 7 | 0 |
| 26 | ප්‍රවර්ධන නිලධාරි | 27 | 27 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | සංවර්ධන සහකාර | 4 | 4 | 0 |
| 28 | සංවර්ධන නිලධාරි | 4 | 4 | 0 |
| 29 | ගිණුම් සහකාර | 1 | 1 | 0 |
| 30 | තොරතුරු තාක්ෂණ නිලධාරි | 1 | 1 | 0 |
| 31 | තොරතුරු තාක්ෂණ සහකාර | 365 | 0 | 365 |
| 32 | ගිණුම් සහකාර | 6 | 6 | 0 |
| 33 | මාධ්‍ය සහකාර | 1 | 1 | 0 |
| 34 | භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1 | 1 | 0 |
| 35 | අභ්‍යන්තර විගණන නිලධාරි | 95 | 95 | 0 |
| 36 | අභ්‍යන්තර විගණන සහකාර | 54 | 0 | 54 |
| 37 | වීඩියෝ කැමරාකරු/සංස්කාරක | 1 | 1 | 0 |
| 38 | පොත් තබන්නා | 1 | 1 | 0 |
| 39 | පරිගණක සහකාර | 1 | 1 | 0 |
| 40 | කාර්මික නිලධාරි | 9 | 9 | 0 |
| 41 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 282 | 226 | 56 |
| 42 | කළමනාකරණ සහකාර | 163 | 163 | 0 |
| 43 | සමෘද්ධිසංවර්ධන නිලධාරි | 22611 | 21856 | 755 |
| 44 | රියදුරු | 88 | 88 | 0 |
| 45 | රියදුරු | 19 | 19 | 0 |
| 46 | සංචාරක බංගලා භාරකරු | 1 | 1 | 0 |
| 47 | කාර්යාල කාර්ය සහායක | 38 | 38 | 0 |
| 48 | කාර්යාල කාර්ය සහායක | 339 | 336 | 3 |
| 49 | ලොරි සහායක | 9 | 9 | 0 |
| 50 | කම්කරු | 8 | 8 | 0 |
| 51 | මුරකරු | 2 | 2 | 0 |
| 52 | ආරක්ෂක නියාමක | 6 | 6 | 0 |
| 53 | අරක්කැමි | 6 | 0 | 6 |
| | **එකතුව** | **27191** | **25515** | **1837** |

**මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර**

## 2.1.5 අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් සහ පාලක මණ්ඩල සමාජිකයින්

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය - පී.හැරිසන් මහතා

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍ය- රංජන් රාමනායක මහතා

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම් - ශිරාණි වීරකෝන් මිය

**2.1.5.1 ජාතික සභා සමාජික නාම ලේඛණය**

**නිලධාරියාගේ නම**

1. ජිනසිරි දඩල්ලගේ මහතා - අධ්‍යක්ෂ ජනරාල් -සභාපති
2. එස්.ඩී.උඩවත්ත මහතා - අතිරේක ලේකම් (පාලන)
3. සෝමසිරි ලියන්වල මහතා - (සාමාජික)
4. ආචාර්ය එස්. එල්. ඒ. ඩැනියෙල් මහතා - (සාමාජික)
5. ජී. එල්. පී. ජිනසෝම මහතා - (සාමාජික)
6. බී.ඒ.ටී. රොද්‍රිගෝ මහතා - (සාමාජික)
7. එච්. කේ. ඒ.රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
8. ඒ.ජී. වෙල්ලප්පිලි මහතා - අධ්‍යක්ෂ (සමාජ සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)
9. පී.ආර්.ඩී.එච්. අනුරවංශ මහතා - නි. අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවර්ධන)
10 එස්. ඒ. ඩී. එස්. එල්. වීරසිංහ මහතා - (සාමාජික)
11 ආර්. ගනේෂරාජ් මහතා - (සාමාජික)
12 අයි.ඩි.එන්. සංජීවනි මිය - ලේකම්

**2.1.5.2 බැංකු කළමනාකරණ මණ්ඩලයේ සමාජික නාම ලේඛණය**

**නිලධාරියාගේ නම**

1. නිමල් කොටවල ගෙදර මහතා - අධ්‍යක්ෂ ජනරාල්(රා.ඉ.)- සභාපති
2. යූ. වී. සරත් රූපසිරි මහතා -අතිරේක ලේකම්(නිල සාමාජික)
3. එච්. කේ. ඒ.රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
4. ටී.වී වීරසේන මහතා - ( රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව-මුදල් අමාත්‍යංශය) නිල සාමාජික
5. වී. ඒ.ඒ. එන්.ද සිල්වා මිය - අතිරේක අධ්‍යක්ෂ- නිල සාමාජික
6. එච්.එල්.තිසේරා මහතා - පත්කල සාමාජික
7. කේ. පී. පී. එච්. මිහිරිපැන්න මහතා - පත්කල සාමාජික
8. ජේ සමරතුංග මහතා - පත්කල සාමාජික

### 2.1.5.3 සමාජ ආරක්ෂණ අරමුදල් භාරකාර මණ්ඩලයේ සමාජික නාම ලේඛණය

**නිලධාරියාගේ නම**

1. නිමල් කොටවල ගෙදර මහතා - අධ්‍යක්ෂ ජනරාල්(රා.ඉ.)- සභාපති
2. එච්.කේ.රණවීර මහතා - අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
3. යූ.ජී. රත්නසිරි මහතා - අතිරේක ලේකම් (ප්‍රති. හා ආර්ථික කටයුතු අමා.)
4. එස්.ඩී. උඩවත්ත මහතා - අතිරේක ලේකම්(පාලන)
5. එම්. ඒ. නාලනී මහත්මිය - අතිරේක ලේකම් (පාලන හා මුදල්- සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්.අමා. )
6. ඩී. කේ. රත්නායක මහත්මිය - අධ්‍යක්ෂ (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව)
7. එච්.එම්. රත්නායක මහතා - සමාජික
8. සුමිත් වීරසූරිය මහතා - සමාජික
9. අසංක පුංචිහේවා මහතා - සමාජික
10. මුතුවේලු මන්මුත්තු මහතා - සමාජික
11. එම්. ඩබ්.එම්. යාසීන් මහතා - සමාජික

### 2.1.6 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ නාම ලේඛණය -2018

**1. අධ්‍යක්ෂ ජනරාල්**

1. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - 2018.05.16 දින දක්වා
2. ජේ. දඩල්ලගේ මහතා - 2018.09.18 දින දක්වා
3. නිමල් කොටවලගෙදර මහතා (වැ.බ.) -

**2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**

1. එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර මහතා
2. එන්.ඒ.පී. නිශ්ශංක මහත්මිය

**3. ප්‍රධාන ගණකාධිකාරි**

1. ආර්. මනම්පේරි මෙනවිය

**4.** **අධ්‍යක්ෂ තනතුරු**

1. සී.ඩී. කළුආරච්චි මහතා - 2018.09.28 දින දක්වා
2. ඒ.ජී. වෙල්ලප්පිලි මහතා - අධ්‍යක්ෂ (සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)
3. රංජිත් උදයසිරි මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) 2017.07.27 දින සිට 2018.11.27 දක්වා
4. බී.කේ. නිශාන්ත මහතා - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

**5.** **ගණකාධිකාරි තනතුරු**

1. පී.ඒ.එස්.ජේ. කුමාර මහතා (මුදල් හා ගෙවීම්)

**6.** **ප්‍රධාන අභ්‍යන්තර විගණක**

1. ආර්.පී.පී. අබේකෝන් මිය

**7. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂතනතුරු සඳහා**

| අනු අංකය | නම | | ශ්‍රේණිය | දිස්ත්‍රික්ක |
|---|---|---|---|---|
| 1 | කේ.ඒ.එම්.පෙරේරා මයා | | ශ්‍රී.ලං.ප.සේ. iii | ගම්පහ (වැ.ආ) |
| 2 | බී.ඒ.එස්.උදයංගනී මිය | | ශ්‍රී.ලං.ප.සේ. i | කළුතර |
| 3 | කේ.එස්.ප්‍රේමචන්ද්‍ර මිය, | | ශ්‍රී.ලං.ප.සේ. i | මහනුවර |
| 4 | ඩබ්.එම්.සී.කේ.වන්නිනායක මයා | | ශ්‍රී.ලං.ප.සේ. i | කුරුණෑගල |
| 5 | ජේ.ඒ.එස්.පී.ජයසිංහ මයා | | ශ්‍රී.ලං.ප.සේ. i | රත්නපුර |
| 6 | ඒ.ටී.පී.කුසුම්සිරි මිය | | ශ්‍රී.ලං.ප.සේ. i | කෑගල්ල |
| 7 | එෆ්.ආර්.එම්.රියාල්දින් මිය | | ශ්‍රී.ලං.ප.සේ.1 | මාතලේ |
| 8 | කේ.එල්.එම්.සී.කුලරත්න මිය, | | ශ්‍රී.ලං.ප.සේ. i | නුවරඑළිය |
| 9 | එස්. සුදිස්නර් මිය | | ශ්‍රී.ලං.ප.සේ. i | ත්‍රිකුණාමලය |
| 10 | ඒ. තවබාලන් මිය | | ශ්‍රී.ලං.ප.සේ. iii | කිලිනොච්චිය |
| 11 | ඒ.ජී.එස්.අශෝක මයා | | ශ්‍රී.ලං.ප.සේ. i | කොළඹ |
| 12 | එම්.එම්.සෆ්රාස් මයා | | ශ්‍රී.ලං.ප.සේ. iii | අම්පාර රා.ආ. |
| 13 | ඩී.එස්. විතානගේ මිය | | ශ්‍රී.ලං.ප.සේ. i | ගාල්ල |
| 14 | ඩී.පී.ඒ.එස්.දිසානායක මයා | | ශ්‍රී.ලං.ප.සේ. iii | අනුරාධපුර (වැ.ආ) |
| 15 | ජෙයභවානිකනේෂමූර්ති මිය | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. ii | මුලතිව් (වැ.ආ) |
| 16 | ඩබ්.එම්.පී. විජයබණ්ඩාර මයා | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. i | බදුල්ල |
| 17 | ඒල්.ඒ. සෝමරත්න මයා | | ශ්‍රී.ලං.ප.සේ.1 | මොණරාගල (වැ.බ) |

| | | | | |
|---|---|---|---|---|
| 18 | කේ.ඒ.එල්.සිරිල් මයා | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. i | මාතර |
| 19 | එන්.ජී.ජේ.පී.රෝහිත මයා | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. i | හම්බන්තොට |
| 20 | පි.පක්කියරාජන් මිය | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. i | මඩකලපුව |
| 21 | එස්.පි.විරසේකර මයා | | ශ්‍රී.ලං.ප.සේ.iii | පුත්තලම (ර.ආ) |
| 22 | ඩබ්.පී.ඩබ්.වනසිංහ මයා | | ශ්‍රී.ලං.ප.සේ i | පොලොන්නරුව (වැ.බැ) |
| 23 | කේ. මහේෂ්වරන් මයා | | ශ්‍රී.ලං.ක්‍ර.සේ.i | යාපනය (වැ.බ) |
| 24 | සරෝජනිදේවි පද්මරංජන් මිය | | ශ්‍රී.ලං.ක්‍ර.සේ.i | වවුනියාව |
| 25 | එස්.ගුණපාලන් මයා | | ශ්‍රී.ලං.ප.සේ.1 | මන්නාරම (වැ.බැ) |

**8. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු**

1. මහේෂ් පෙරේරා මහතා - නි.අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
2. එස්.ලියනාරච්චි මහතා - නි.අධ්‍යක්ෂ (පුහුණු හා පර්යේෂණ)
3. එච්.කේ.රණවීර මහතා - නි.අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන)
4. ආර්.එම්.එල්.ඩබ්.එල්. රත්නායක මිය - නි.අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
5. බී.ජී.එල්.ආර්.එන්.එස්. බණ්ඩාර මහතා - නි.අධ්‍යක්ෂ (නුවර දිස්ත්‍රික්කය)
6. එස්.ආර්. විජේසේකර මහතා - නි.අධ්‍යක්ෂ (නීති)
7. එස්. වන්නිගම මහතා - නි.අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික්කය)
8. කපිල මාසකෝරාළ මහතා - නි.අධ්‍යක්ෂ (ගාල්ල දිස්ත්‍රික්කය)
9. එස්.ඩී. කල්‍යාණි මිය - නි.අධ්‍යක්ෂ (ගාල්ල දිස්ත්‍රික්කය)
10. රංජිත් ද සිල්වා මහතා - නි.අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික්කය)
11. පී.ආර්.ඩී.එච්. අනුරවංශ මහතා - නි.අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන) - ප්‍රධානකාර්යාලය

**9. සහකාර අධ්‍යක්ෂ තනතුරු**

1. ආනන්ද ගමගේ මහතා - අලෙවි අංශය - ප්‍රධාන කාර්යාලය
2. අයි.ඩී.එන්.සංජීවනි මිය - සමාජ සංවර්ධන - ප්‍රධාන කාර්යාලය
3. එස්.පී. වනිගතුංග මහතා - මාතර දිස්ත්‍රික්කය
4. අයි.සී.ජේ.ගුණරත්න මහතා - පාලන - ප්‍රධාන කාර්යාලය
5. පී.ඩී.ආර්.කේ. පෙරේරා මහතා - මහනුවර දිස්ත්‍රික්කය
6. ඒ.එෆ්. ප්‍රනාන්දු මහතා - කොළඹ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
7. ඩබ්.එම්.ටී.යූ. විජේරත්න මිය - ආයතන - ප්‍රධාන කාර්යාලය
8. ඩබ්.ජී.එස්. වික්‍රමසිංහ මහතා - මහනුවර - දිස්ත්‍රික් උපකාර්යාලය

**10. පරිපාලන නිලධාරි තනතුරු**

1. පී.ජී. උපුල් ජයශාන්ත මහතා (පාලන)
2. ටී.බී. ඉලංගන්තිලක මහතා (ආයතන) (වැ.බ)

## 03. මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යසාධනය

### 3.1 හැඳින්වීම :

වසර 2030 වන විට දුගී බවින් තොර සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. මෙම දැක්ම සැබෑ කරගැනීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වන ශක්තිමත් මානව සම්පතක් බිහිකළ යුතුව ඇත. එබැවින් 2018 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශයේ ඉලක්කය වූයේ ප්‍රතිලාභී පවුල් සවිබල ගන්වා සමෘද්ධිමත් ජාතියක් ගොඩනගා ජාතික ආර්ථිකයට දායක වීමට වෙර දරන නිළධාරින් ශ්‍රී ලාංකික මානව ප්‍රාග්ධනයක් බවට පත්කරමින් ඔවුන් දැනුමෙන් සන්නද්ධ කරමින් සේවා තෘප්තියක් ලබා දීමයි. මෙම මානව සම්පත ඵලදායිතා කාර්යක්ෂම ගති ලක්ෂණ වලින් හා දැනුම ,කුසලතා හා ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශන්ගෙන් සමන්විත වූ කල්හි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීමට හැකි මානව ප්‍රාග්ධනයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළම ජනිත කළ හැකිවේ. මෙවන් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම උදෙසා මානව සම්පත් සංවර්ධන අංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. මානව සම්පත් සංවර්ධන අංශයේ සමස්ථ පුහුණුව තුලින් කාර්යමණ්ඩලය සවිබලගැන්වීමත්, එනම් කාර්යමණ්ඩලයේ දැනුම, කුසලතා, හැකියාවන්, ධනාත්මක ආකල්ප, වටිනාකම, මනෝ රාමුව (සිතුවිලි රාමුව) හා සුසමාදර්ශයන් වැඩි දියුණු කිරීමත් අපේක්ෂා කරන ලදී.

**දැක්ම :**

**වසර 2030 දී දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් සඳහා සවිමත් මානව ප්‍රාග්ධනයක් බිහිකිරීම.**

**මෙහෙවර :**

**දිළිඳු ජනතාව සවිබල ගන්වා ජාතික ආර්ථිකයට දායක කර ගැනීමට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප හා සුසුමාදර්ශයන්ගෙන් ශක්තිමත් මානව සම්පතක් දෙපාර්තමේන්තුව තුළින් බිහිකිරීම.**

**අරමුණු :**

- දෙපාර්තමේන්තුව තුළ පරිපූර්ණ සම්පත්දායක පිරිසක් හා සියලුම කාර්යමණ්ඩලය සුවිශේෂී දක්ෂතා ඇති මානව සම්පතක් බවට පත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලඟාකර ගැනීමට හැකි වන පරිදි දක්ෂතා සහිත කාර්යමණ්ඩලයක් බහිකිරීම.
- නිවැරදිව කළමනාකරණය කර ධනාත්මක ආකල්ප වලින් පරිපූර්ණ මානව සම්පතක් බිහි කිරීම.
- සමෘද්ධි ව්‍යාපාරයට සෘජුවම දායක වන ප්‍රතිලාභී ප්‍රජාව හා මැදිහත්කරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් ඵලදායී හා කාර්යක්ෂම ගති ලක්ෂණ වලින් සමන්විත කාර්යමන්ඩලයක් බවට පත් කිරීම.
- 2018 වර්ෂයේ සමස්ත දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීමට සහයවීම.
    a) සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම.
    b) සමස්ත බැංකු පද්ධතිය ලාභ ලබන බැංකු බවට පත්කිරීම

- පාරිභෝගික ආකර්ෂණය ඉහළ නැංවෙන පරිදි සමෘද්ධි බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම.

**මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යභාරය :**

- අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
- සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගනිමින් පුහුණු කටයුතු සඳහා යෙදවීම.
- ක්‍රියාත්මක වැඩසටහන් වල සාර්ථක අසාර්ථක භාවය අධ්‍යනය කිරීම හා නව ප්‍රවේශයන් හඳුනා ගැනීම.

**උපාය මාර්ග**

- දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ලඟාකර ගැනීමත්, අභියෝග ජය ගැනීමටත් හැකි වන පරිදි කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ දැනුම ලබා දීම.
- දැනුම සහ කුසලතාවන් ගෙන් සන්නද්ධ සම්පත්දායක මණ්ඩලයක් දෙපාර්තමේන්තුව තුල බිහිකිරීම.
- කාර්යමණ්ඩල පුහුණුව සඳහා අවශ්‍ය පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව හා කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාම.
- දිළිඳුකම පිටුදැකීම තුලින් ජාතික ආර්ථිකයට දායක වීම සහ සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි කාර්යමණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම.
- දිළිඳුකම පිටුදැකීම සඳහා අවශ්‍ය විදේශීය වැඩසටහන් පිළිබඳ අද්දැකීම් ලබාගැනීම සඳහා නිලධාරීන් යොමුකිරීම.
- දැනුම සහ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා නිළධාරීන්ට උසස් වෘත්තීය සහ අධ්‍යාපනික පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම් සැලසීම.

## 3.2. 2018- ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 3.2.1 ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම.

**හැඳින්වීම :-** ප්‍රධාන කාර්යාලයේ සේවය කරන විවිධ තනතුරු වලට අදාළ නිලධාරීන් සඳහා ඔවුන් රාජකාරි ඉටුකරනු ලබන විෂයන්ට අදාළව ( ආයතන කටයුතු / පුද්ගලික ලිපිගොනුකරණය/ විශ්‍රාම වැටුප් සකස් කිරීම/ රාජ්‍ය මුල්‍ය / විගණනය/ විනය කාර්යය පටිපාටිය/ පරිගණක දැනුම ආදී අනෙකුත් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව) දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණුව ලබා දීම

**ඉලක්ක කණ්ඩායම (ප්‍රතිලාභීන් ගණන)** :- 395

**ක්‍රියාත්මක ක්‍රමවේදය** :- දේශන , ඉදිරිපත් කිරීම් (Presentation) හා අත්පත්‍රිකා

**ක්‍රියාත්මක ස්ථානය** :- ප්‍රධාන කාර්යාලය සහ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන (සමනලවැව/ නිල්ලඹ/ නිලාවැලි)

අනුමත ප්‍රතිපාදන :- රු.මි. 2.00

ආරම්භ කල දිනය :- 2018.03.01

අවසන් කල දිනය :-2018.12.14

**2018.12.31** දිනට වියදම :- රු.මි. 1.63

වයාපෘතියේ නිමැවුම :- නිලධාරී 512 දෙනෙකුට පුහුණුව ලබාදීම

ලබාගත් සමාජ ආර්ථික පත්‍රලාභ :-නිලධාරීන් හට විෂයානුබද්ධ පුහුණුව ලබාදීම තුළින් ඔවුන්ගේ දැනුම වර්ධනය වී කාර්යක්ෂම හා ඵලදායී සේවකයෙකු බිහිකිරීම ඒ තුළින් සමස්ත සමාජයට හොඳ සේවාවක් සැපයීම.

වයාපෘතියට අදාළ ඡායාරූප :-



අභිනවයෙන් බඳවාගත් කාර්යාල කාර්යය සහායකයින් සඳහා පුහුණුව ලබා දෙන අවස්ථාවක්



විනය පිළිබඳ පුහුණුව ලබා දෙන අවස්ථාවක්



නිලධාරීන් සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණයපිළිබඳ මූලික දැනුම ලබා දීම

### 3.2.2 දිස්ත්‍රික් කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම.

**හැඳින්වීම** දිස්ත්‍රික්ක වලට අනුයුක්තව සේවය කරන විවිධ තනතුරු වලට අදාළ සමෘද්ධි නිලධාරීන් සඳහා ඔවුන් රාජකාරි ඉටුකරනු ලබන විෂයන්ට අදාළව ( ආයතන කටයුතු / පුද්ගලික ලිපිගොනුකරණය/ විශ්‍රාම වැටුප් සකස් කිරීම/ රාජ්‍ය මූල්‍ය / විගණනය/ විනය කාර්යය පටිපාටිය/ පරිගණක දැනුම ආදී අනෙකුත් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව) දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණුව ලබා දීම

**ඉලක්ක කණ්ඩායම (ප්‍රතිලාභීන් ගණන)** :-වැඩසටහන් 100

**ක්‍රියාත්මක ක්‍රමවේදය** :- දේශන , ඉදිරිපත් කිරීම් (Presentation) හා අත්පත්‍රිකා

**ක්‍රියාත්මක ස්ථානය** :- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල

**අනුමත ප්‍රතිපාදන** :- රු.මි. 14.00

**ආරම්භ කල දිනය** :- 2018.03.01

**අවසන් කල දිනය** :-2018.12.14

**2018.12.31 දිනට වියදම** :- රු.මි. 7.15

**ව්‍යාපෘතියේ නිමැවුම** :- සමෘද්ධි නිලධාරීන් 8473 දෙනෙකු හට විෂයානුබද්ධ පුහුණුව ලබා දීම.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ** :-නිලධාරීන් හට විෂයානුබද්ධ පුහුණුව ලබාදීම තුළින් ඔවුන්ගේ දැනුම වර්ධනය වී කාර්යක්ෂම හා ඵලදායී සේවකයෙකු බිහිකිරීම ඒ තුළින් සමස්ත සමාජයට හොඳ සේවාවක් සැපයීම.

**ව්‍යාපෘතියට අදාළ ඡායාරූප :-**





**නීති කටයුතු පිළිබඳ නිලධාරීන් දැනුවත් කරන අවස්ථාවක්**

### 3.2.3 ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව පුහුණු කරුවන් ලෙස සමෘද්ධි කළමණාකරුවන් පුහුණු කිරීම.

**හැඳින්වීම**

සමෘද්ධි බැංකු පද්ධතිය ලාභදායි කිරීම හා එම බැංකු ඵලදායි හා කාර්යක්ෂම කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ අරමුණවේ. සමෘද්ධි බැංකු හරහා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ව්‍යාපෘති ණය ලබා දුන්නද ව්‍යාපෘති අවශ්‍යතා හඳුනා ගැනීමත්, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු වල දුර්වලතාවයන් නිසා අසාර්ථක කුඩා ව්‍යාපාර වැඩි වී ඇති අතර ණය පැහැරහැරීම්ද වැඩි වී ඇත. එබැවින් මෙම පාඨමාලාව මගින් මෙම තත්වයන් මඟහරවා ගැනීම අපේක්ෂාකරයි.සමෘද්ධි බැංකු හරහා ව්‍යාපෘති ණය ලබාදීම තුළින් ආර්ථික සවිබල ගැන්වීම.පැහැරි හැරි ණය අවම කිරීම.

**ඉලක්ක කණ්ඩායම** - සමෘද්ධි කළමණාකරුවන් = 200

සමෘද්ධි සං. නිළධාරීන් = 7500

**ක්‍රියාත්මක ක්‍රමවේදය -**

**පළමු අදියරේ** දී කළමණාකරුවන් පුහුණු කිරීම සිදු කරුනු ලැබේ. **දෙවන අදියරේ** දී මෙම පුහුණු කරුවන් යොදවා ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් පුහුණු කරනු ලැබේ. **තෙවන අදියරේ** දී සමෘද්ධි ප්‍රතිලාභින්ගේ ව්‍යාපාර හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය ව්‍යවයසායකත්ව සංවර්ධනය පිළිබඳ දැනුම ලබා දීම හා මග පෙන්වීම සිදුකිරීමට බලාපොරොත්තු වේ. මෙමගින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති බල ගැන්වීම අපේක්ෂා කෙරේ.

**ක්‍රියාත්මක ස්ථාන**

කළමණාකරුවන් පුහුණු කිරීම නිල්ලඹ හා සමනල වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන වලදී සිදුකරනු ලැබේ. සමෘද්ධි සංවර්ධන නිළධාරීන් පුහුණුකිරීම දිස්ත්‍රික්ක මට්ටමෙන් තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන වලදී සිදු කරයි.

| | | |
|---|---|---|
| **අනුමත ප්‍රතිපාදන** | - | රු.මි.13 |
| **ආරම්භ කළ දිනය** | - | 2018.03.01 |
| **අවසන් කළ දිනය** | **-** | 2018.12.31 |
| **2018.012.31 දක්වා වියදම** | - | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව = රු.මි. 7.6 |
| **ව්‍යාපෘතියේ නිමැවුම** | - | පුහුණු කරුවන් ලෙස සමෘද්ධි කළමණාකරුවන් 270 පුහුණු කිරීම. සමෘද්ධි සං.නිළධාරීන් 8269 පුහුණු කිරීම |

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල-**

මෙම ව්‍යාපෘතියේ සමෘද්ධි කළමණාකරුවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය YOULEAD ආයතනය මගින් ලබා දීම. මෙහි ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය හා පුහුණු වියදම් YOULEAD ආයතනය මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. 2018 වර්ෂය තුළ සමෘද්ධි සං. නිළධාරීන් 8269 ක් පුහුණු කිරීම ව්‍යවසායකයින් සංවර්ධනයකිරීම.



**ව්‍යවසායකත්ව පුහුණුකරුවන් ලෙස කළමනාකරුවන්පුහුණුවන අවස්ථාවක්**

**3.2.4 වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් නිලධාරීන් දිරිගන්වා උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීම.**

| | | |
|---|---|---|
| **ඉලක්ක කණ්ඩායම** | - | නිළධාරීන් 150 |
| **ක්‍රියාත්මක ක්‍රමවේදය** | - | *තම අවශ්‍යතාවය පරිදි තෝරා ගත් පාඨමාලාවන් සඳහා නිළධාරීන් හට අධ්‍යයන පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම.*නිලධාරීන් දැනුවත් කිරීම. *නිළධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවීම.* කමිටු නිර්දේශයට යොමු කිරීම. *කමිටු නිර්දේශය හා අනුමැතිය ලබා ගැනීම.*ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශයට යොමු කිරීම. |
| **ක්‍රියාත්මක ස්ථාන** | - | ප්‍රධාන කාර්යාලය |
| **අනුමත ප්‍රතිපාදන** | - | රු.මි. 3.00 |
| **ආරම්භ කළ දිනය** | - | 2018.01.25 |
| **අවසන් කළ දිනය** | - | 2018.10.15 |
| **2018.12.31 දක්වා වියදම** | - | රු. මි. 1.46 |
| **ව්‍යාපෘතියේ නිමැවුම** | - | 52 දෙනෙකු අධ්‍යයන පාඨමාලා හදාරා ඇත |

**3.2.5 මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව**

**හැඳින්වීම** ක්ෂේත්‍ර රාජකාරී සහ කාර්යාලී රාජකාරීන්හි නිරත සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෘත්තීය කටයුතු සඳහා මනා පිටුවහලක් ලැබෙන සහතික පත්‍ර පාඨමාලා 04 ක එකතුවකින් මෙම ඩිප්ලෝමා පාඨමාලාව සමන්විත වේ.නිළධාරීන් දිසත්‍රික් 15 ක් නියෝජනය කරමින් මෙම වැඩසටහන සඳහා නිළධාරීන් තෝරා ජාතික ශ්‍රම අධ්‍යන අධ්‍යාපන ආයතනය මඟින් පුහුණුව ලබා දෙනු ලැබේ.

**ඉලක්ක කණ්ඩායම** -50

**ක්‍රියාත්මක කරන ආකාරය** -*මේ සඳහා නිළධාරීන්ගේ දිස්ත්‍රික් මට්ටමින් නාම යෝජනා කැඳවීම තෝරා ගැනීම සඳහා ශ්‍රම අධ්‍යයන ආයතනය සමඟ ඒකාබද්ධව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.*ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය සමඟ එකගතාවය ගිවිසුම අත්සන් තැබීම. *සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලා සඳහා යොමු කිරීම.

| | |
|---|---|
| **ක්‍රියාත්මක ස්ථාන** | - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, පැලවත්ත. |
| **අනුමත ප්‍රතිපාදන** | - රු.මි. 3.00 |
| **ආරම්භ කළ දිනය** | - 2018.10.04 |
| **අවසන් කළ දිනය** | - 2019.02.20 |
| **2018.12.31 දිනට වියදම** | - රු.මි. 2.44 |
| **ව්‍යාපෘතියේ නිමැවුම** | - නිලධාරීන් 48 දෙනෙකු ඩිප්ලෝමාධාරීන් බවට පත්කිරීම |

ව්‍යාපෘතියට අදාළ ඡායාරූප -




### 3.2.6 මානව සම්පත් සංවර්ධන වැඩ සටහන නිළධාරීන් විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම

**හැඳින්වීම -** දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමවේදය පිළිබඳව විදේශ රටවල ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ නිලධාරීන්ට අත් දැකීම් ලබා දීම සඳහා විදේශ ශිෂ්‍යත්ව ලබා දීම.

**ඉලක්ක කණ්ඩායම** - 15

**ක්‍රියාත්මක ක්‍රමවේදය** - *නිළධාරීන් දැනුවත් කිරීම.
*සුදුසු නිළධාරීන්ගේ අයදුම්පත් කැඳවීම.
*කමිටු නිර්දේශයට යොමු කිරීම.
*අමාත්‍යංශ ලේකම් වෙත යොමු කිරීම .

**ක්‍රියාත්මක කරන ස්ථාන** - ආසියාතික රටවල් ප්‍රමුඛ කලාපීය රටවල්

**අනුමත ප්‍රතිපාදන** - රු.මි. 15

**ආරම්භ කළ දිනය** - 2018.01.01

**අවසන් කළ දිනය** - 2018.08.31

**2018.08.31 දක්වා වියදම** - අංශයේ ප්‍රතිපාදන වැය නොවේ.

**ව්‍යාපෘතියේ නිමැවුම** - නිලධාරීන් 31 දෙනෙකු විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම

### 3.2.7 නිල්ලඹ/සමනලවැව ජීවනෝපාය සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

**හැඳින්වීම -** පුහුණු මධ්‍යස්ථාන අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිරීම සහ උපකරණ ලබා දීම.

**ඉලක්ක කණ්ඩායම** -පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය-** *මධ්‍යස්ථාන භූමියේ පිහිටි අතිරේක ගස් ඉවත් කිරීම අවශ්‍ය කටයුතු කිරීම.
*මධස්ථානයේ අතිරේක ආදායම් මාර්ග ලෙස තේ වගා කිරීමට කටයුතු කිරීම.
* මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අඩුපාඩු සකස් කිරීම - අවශ්‍ය ඇස්තමේන්තු ගත කිරීම හා ඒවා සකස් කිරීමට මහනුවර දිස්ත්‍රික්ලේකම් වෙත යොමු කිරීම.
අතවශ්‍ය උපකරණ සැපයීම

**ක්‍රියාත්මක ස්ථාන** - නිල්ලඹ/සමනලවැව

**අනුමත ප්‍රතිපාදන** - රු.මි. 30

**ආරම්භ කළ දිනය** - 2018.01.01

**අවසන් කළ දිනය** - 2018.12.15

**2018.12.31 දක්වා වියදම** - රු.මි.2.83කි.

**ව්‍යාපෘතියේ නිමැවුම** - අතවශ්‍ය උපකරණ ලබා දීම, අතවශ්‍ය අළුත්වැඩියා සඳහා ඇස්තමේන්තු සකස් කිරීම

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිලාභ** - අවශ්‍ය පුහුණු උපකරණ හා ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා ඇස්තමේන්තු සකස් කර අවසන් කර ඇත.

### 3.2.8 දිළිඳු පවුල් සවිබල ගැන්වීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිළධාරීගේ භූමිකාව පිළිබඳ කාර්යබද්ධ පුහුණුව සිංහල මාධ්‍යය

**හැඳින්වීම**

දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ භූමිකාවත් පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීම තුළින් ආර්ථික සවිබලගැන්වීම උදෙසා ව්‍යාපාරික සැලැස්ම සකස් කිරීමට අනුගත කිරීම.

**ඉලක්කකණ්ඩායම**

**(පුහුණු ලාභීන් ගණන)** - සියලුම සමෘද්ධි කළමනාකරුවන් සහ සියලුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

**1 අදියර**

භූමිකාරංගන, කණ්ඩායම් සාකච්ඡා, කණ්ඩායම් ඉදිරිපත් කිරීම ඇතුළුව කාර්යබද්ධ පුහුණුව සිදු කිරීම.

**2 අදියර**

කාර්යබද්ධ පුහුණුවෙන් පසුව පුහුණු ලාභීන් විසින් ප්‍රතිලාභී පවුල් 10 ක් තෝරාගෙන ඔවුන් සඳහා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා නැවත සති 3 කින් ප්‍රතිපෝෂණ වැඩ මුළුවේ දී පවුල්10 පිළිබඳ ඉදිරිපත් කිරීම.

**3 අදියර**

ප්‍රතිපෝෂණ වැඩමුළුවෙන් පසුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් සියලුම සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරීන්ට ඉහත විපර්යකාරක පුහුණුව ලබා දීම

**4 අදියර**

ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් සජීවිකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2019 වර්ෂය.

| | | |
|---|---|---|
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන** | | සමනල වැව/නිල්ලඹ/නිලාවේලි/ RDTRI පිළිමතලාව යන පුහුණු මධ්‍යස්ථානයන් හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| **අනුමත ප්‍රතිපාදන** | - | රු.මි. 13 |
| **ආරම්භ කළ දිනය** | - | 2018.08.26 |
| **අවසන් කළ දිනය** | - | 2018.11.29 |
| **2018.12.31 දිනට වියදම** | - | රු.මි. 11.6 |
| **ව්‍යාපෘතියේ නිමැවුම** | - | සමෘද්ධි කළමනාකරුවන් 519 දෙනෙකුගේ පුහුණුකරු සංචිතයක් බිහිකිරීම. වසම් කාර්යමණ්ඩලය (ස.සං.නි.) 9859 දෙනෙකු හට පුහුණුව ලබා දීම. |

## 04. විමර්ශන අංශයේ කාර්යසාධනය

### හැඳින්වීම

දෙපාර්තමේන්තුවේ පාලන අංශය යටතට ගැනෙන අංශයක් වන විමර්ශන අංශය අධ්‍යක්ෂ (පාලන) ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අංශයකි.

- ලැබෙන පැමිණිලි පිළිබඳව මූලික විමර්ශන පැවැත්වීම
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම
- විනය නියෝග නිකුත් කිරීම
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම
- මාණ්ඩලික නිලධාරීන්ට අදාල චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම් කාරකසභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු
- අධිකාරියක් දෙපාර්තමේන්තුවක් බවට පත්වීම හේතුවෙන් විනය කාර්ය පටිපාටිය යටතේ ආවරණය නොවන කරුණු සම්බන්ධව ප්‍රතිපත්ති සකස් කිරීම හා අනුමත කරවා ගැනීම

### දැක්ම

නීතිගරුක හා විනයගරුක කාර්ය මණ්ඩලයක් බිහි කිරීම තුලින් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස මහජන සේවාවන් ඉටුකරන වංචා, දූෂණ, අක්‍රමිකතා වලින් තොර ආදර්ශමත් රාජ්‍ය ආයතනයක් බිහිකිරීම .

### මෙහෙවර

පොදු නීති උල්ලංඝනය කිරීම්, විනය විරෝධී හැසිරීම් හා සාපරාධී ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය කර වැරදි කරුවන් වන නිලධාරීන් වෙත රජයේ විනය කාර්ය පටිපාටියට අනුකූලව විනය දඬුවම් පමුණුවමින් ඔවුන්ට නීතිගරුක හා විනය ගරුක රාජ්‍ය සේවකයින් බවට පරිවර්ථනය වීමට අවස්ථාව ලබාදීම සහ රාජ්‍ය සේවයේ යහ පැවැත්මට හා පොදු මහජන සුභසිද්ධියට අහිතකර බවට සනාථ වන නිලධාරීන් රාජ්‍ය සේවයෙන් ඉවත් කිරීම.

අරමුණු :-

1. නිලධාරීන් විසින් සිදු කරන විෂමාචාරයන් විමර්ශනය කර විනය දඬුවම් පැමිණවීම මගින් ඔවුන් නිසි මගට ගැනීමට කටයුතු කිරීම.

2. දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවයේ කීර්ති නාමය ආරම්භ කිරීම.

3. දෙපාර්තමේන්තු සේවකයින් කල විනය පවත්වාගෙන යාම සහ මූල්‍ය විනය පවත්වා ගෙන යාම සහතික කිරීම.

4. වංචා වලක්වා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අවශ්‍ය යෝජනා /නිර්දේශ ඉදිරිපත් කිරීම.

**2018 වර්ෂවලදී සිදුකළ කාර්යයන්හී සංක්ෂිප්ත වාර්තාව.**

| | | |
|---|---|---|
| අලුතින් ආරම්භ කළ ගොනු ගණන | - | 162 |
| නිකුත් කළ චෝදනා පත්‍ර ප්‍රමාණය | - | 64 |
| ලබාදුන් විනය නියෝග ප්‍රමාණය | - | 80 |
| නිදහසට කරුණු විමසීම | - | 19 |
| විනය නියෝග | - | 13 |
| වැඩ තහනම් කළ නිලධාරීන් ගණන | - | 74 |
| සේවයෙන් පහ කළ නිලධාරින් සංඛ්‍යාව | - | 04 |
| වර්ෂය තුළ නිම කළ ගොනු ගණන | - | 83 |
| ප්‍රතිශතයක් ලෙස ප්‍රගතිය | - | 51.2% |
| තවදුරටත් ක්‍රියා කළ යුතු ගොනු ගණන | - | 571 |
| වියදම | - | රු. 7,168,206.90 |

# 05. 2018 - සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

සංඛ්‍යා සටහන-5.1

### ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශ ප්‍රගතිය - 2018.12.31 වන දිනට

| අනු අංක ය | ව්‍යාපෘතියේ නම | වෙන්කල මුදල (රු.මි.) | ව්‍යාපෘති ගණන | අවසන් කර ඇති ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය (%) | භෞතික ප්‍රගතියේප්‍ර තිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන | 919.00 | 31,985 | 24,894 | 553.55 | 60% | 78% |
| 2 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 168.00 | 7,110 | 6,110 | 110.17 | 66% | 86% |
| 3 | සමාජ සංවර්ධන හා පාරිසරික වැඩසටහන | 280.00 | 8,200 | 8,150 | 245.47 | 88% | 99% |
| 4 | ප්‍රජාමූල සංවිධාන වැඩසටහන | 70.00 | 662 | 621 | 25.71 | 37% | 94% |
| 6 | මානව සම්පත් සංවර්ධන වැඩසටහන | 86.00 | 442 | 397 | 33.24 | 39% | 90% |
| 7 | තොරතුරු තාක්ෂණවැඩසටහන | 22.00 | 7 | 5 | 7.85 | 36% | 71% |
| 8 | මාධ්‍ය වැඩසටහන | 27.45 | 37 | 28 | 13.91 | 51% | 76% |
| 5 | නීති හා විදේශ කටයුතුවැඩසටහන | 1.43 | 25 | 5 | 0.42 | 29% | 20% |
| 9 | සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන | 11.12 | 2,325 | 1,566 | 6.19 | 56% | 67% |
| 10 | සමෘද්ධි සුභසාධන වැඩසටහන | 10.00 | 35 | 12 | 10.00 | 100% | 34% |
| 11 | කාර්යසාධන ඇගයීම් හා පර්යේෂණ වැඩසටහන | 5.00 | 2 | 1 | 0.38 | 8% | 50% |
| **එකතුව** | | **1,600.00** | **50,830** | **41,789** | **1,006.89** | **63%** | **82%** |
| 12 | යටිතලපහසුකම් සංවර්ධනය (අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන) | 400.00 | 216 | 77 | 65.30 | 16% | 36% |
| | **මුළු එකතුව** | **2,000.00** | **51,046** | **41,866** | **1,072.19** | **54%** | **82%** |

# 06. සමාජ සුබසාධන අංශයේ කාර්ය සාධනය

## 6.1 .හැඳින්වීම:

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකිම සහ මානව සංවර්ධනය සඳහා නිදහසින් පසුව බලයට පත්වූ රජයන් විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. නොමිලේ අධ්‍යාපන පහසුකම් සහ නොමිලේ සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්ත කිරිම, නොමිලේ සහනාධාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම, ගොවි ජනපද ව්‍යාපාර පිහිටුවිම සහ ඉඩම් නොමැති අයට ඉඩම් බෙදා දීම, නිවාස සංවර්ධන කටයුතු, ජල සම්පාදන සහ සනිපාරක්ෂක කටයුතු ව්‍යාප්ත කිරිම, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරිම වැනි ක්‍රියා මාර්ග ගණනාවක් ඒ අතර වේ.

1977 බලයට පත්වූ රජය යටතේ, එතෙක් පැවති ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව සහ එක්සත් ජාතින්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනවල උපදෙස් පිළිගනිමින් ශ්‍රී ලංකාවට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වාදෙන ලදි. ඒ අනුව 1977 සිට වර්තමානය දක්වා විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපත්තිමය වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී. එහිදී ආහාර සහානාධාර කප්පාදු කර සහල් සලාක ක්‍රමය වෙනුවට ආහාර මුද්දර ක්‍රමයත්, පසුව ජනසවියත් ඉන් අනතුරුව සමෘද්ධි යෝජනා ක්‍රමයත් ක්‍රියාත්මක කරන ලදී.

අප සමාජය තුල වූ අඩු ආදායම්ලාභීන්, අකර්මන්‍ය වූ පුද්ගයින් හා ස්ථිරවම රැකියා වියුක්ත වූ අය රැක බලා දුගී බවින් ඔවුන් මුදවාලිම පිණිස එම පවුල් සවිබල ගන්වා ඔවුන්ට පෙනෙනවාට වඩා යමක් පෙන්වා දි, සිතනවාට වඩා යමක් සිතන්නට පොළඹවාලමින්, කරනවාට වඩා යමක් කිරිමට වටපිටාවක් ගොඩ නගා දි ඔවුගේ විභව ශක්තීන් අවධි කිරිමට සමත් රාජ්‍ය අනුග්‍රහය යුක්ත වැඩසටහනක් ආරම්භ කිරිම කාලින අවශ්‍යතාවයක් විය.

වැඩ කිරිමට කැමති හා හැකියාවක් ඇති නමුත් ආයෝජන ශක්තියක් නොමැති විමේ හේතුවෙන් දුගී භාවයේ වෙලී සිටින විශාල පිරිසකගේ සමාජ හා ආර්ථික අවශ්‍යතා සපුරාලීම අරමුණු කොට ආරම්භ කරන ලද බොහෝ වැඩසටහන් එම අරමුණු කරා යාමට අපොහොසත් විය. රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව කුමක් වුවත් අවශ්‍ය වනේනේ එකී දුගි කණ්ඩායම් ප්‍රධාන ආර්ථික ප්‍රවාහයට ඒකාබද්ධ කිරීමට හැකි අයුරින් ප්‍රතිපත්ති සැලසුම් කිරිමය. ජනසවිය හා ඉන් පසුව ඇති වු සමෘද්ධි යන වැඩසහන් ක්‍රියාත්මක වුයේ දුගී ජන කොටස් ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන ප්‍රවාහයට බද්ධ කර ඒ තුළින් ඔවුන් දුප්පත් කමේ ආගාධයෙන් මුදවා ශක්තිමත් ජන කොටසක් බවට පරිවර්තනය කිරීමේ සංකල්පය මුලික කොට ගෙනය.

## 6.2 සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය:

1995 සිට දීමනා පත්‍ර ලෙස නිකුත් කිරීම සිදු කළ සමෘද්ධි සහනාධාර 2012 අයවැය යෝජනා අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා ප්‍රතිලාභියාට මුදල් ලෙස ගෙවීම ආරම්භ කරන ලදී. සමෘද්ධි ප්‍රතිලාභීන් ඉතිරි කිරීමට හා එතුළින් ඉදිරි ආයෝජන කටයුතු උදෙසා පෙළඹවීම මෙහි අරමුණ විය.

2018 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,384,021 ක් වන අතර ඒ සඳහා රුපියල් බිලියන 39.2 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වියදම් කර ඇත.

සහනාධාර මුදල් ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදීමත් අනතුරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සමෘද්ධි ප්‍රජාමූල බැංකුවට බැර කිරීමෙන් පසු ප්‍රතිලාභී ගිණුමට බැර කිරීමත් ලෙස සිදුකල ක්‍රියාවලියට දීර්ඝ කාලයක් වූ බැවින් 2015 වසරේ සිට ප්‍රතිලාභියා අයත්වන වසමට අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත ප්‍රධාන කාර්යාලයේ සිට සෘජු ප්‍රේෂණ ක්‍රමය හරහා මුදල් බැර කිරීමෙන් අනතුරුව එම මුදල් ප්‍රතිලාභියාගේ ගිණුමට බැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙමගින් භාණ්ඩාගාරය මුදල් ලබා දුන් වහාම පෙරට වඩා කඩිනමින් ප්‍රතිලාභියාට හිමි මුදල් ලබාගැනීමට අවස්ථාව උදා වී තිබේ.

## 6.3 සහනාධාර වැඩසටහනේ ප්‍රධාන අරමුණු:

- දිළිඳු ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාදීම හා සංවර්ධන අවශ්‍යතා සඳහා ඔවුන් පෙළගැස්වීම.
- නිවාස ලොතරැයි අරමුදල සඳහා දායක කර ගැනීම.
- අනිවාර්යය ඉතුරුම් තුලින් අඩු ආදායම්ලාභියා මූල්‍ය වශයෙන් ශක්තිමත්කිරිම.
- සමාජ ආරක්ෂණ වැඩසටහනට දායක කර ගනිමින් එම පවුල් වල අපේක්ෂිත හා අනපේක්ෂිත අවධානම් අවස්ථාවලදී මූල්‍ය ශක්තිය ලබාදීම.

## 6.4 සහනාධාර වර්ගීකරණය:

**සංඛ්‍යා සටහන-6.1**

**සහනාධාර වර්ගීකරණය**

| පවුලේ සාමාජික සංඛ්‍යාව | සහනාධාර වටිනාකම (රු.) | සහනාධාර දීමනාව බෙදියන ආකාරය | | | |
|---|---|---|---|---|---|
| | | අනිවාර්යය ඉතිරිකිරීම් (රු.) | සමාජ ආරක්ෂණ (රු.) | නිවාස ලොතරැයි අරමුදල (රු.) | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල (රු.) |
| 04හෝ 04ට වැඩි | 3500/- | 300/- | 100/- | 50/- | 3050/- |
| 03 (තිදෙනෙකුට) | 2500/- | 200/- | 100/- | 50/- | 2150/- |
| 03 (තිදෙනෙකුට අඩු) | 1500/- | 100/- | 100/- | 50/- | 1250/- |
| සවිබලගැන් වූ පවුල් | 420/- | 270/- | 100/- | 50/- | |

## 6.5 අනිවාර්ය ඉතිරි කිරීම්

සමෘද්ධි ප්‍රතිලාභීන් ඉතිරි කිරීම් සඳහා හුරු කිරීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුම අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා දායක කරවනු ලබන අතර, යම් ආයෝජන අවශ්‍යතාවයක දී, හදිසි රෝහල් ගතවීමක දී, උසස් අධ්‍යාපන අවශ්‍යතාවයක දී අනිවාර්ය ඉතිරි කිරීම් දායක මුදල් ලබා ගත හැකිය.

### 6.6 සමාජ ආරක්ෂණය

සමෘද්ධි ප්‍රතිලාභි පවුලක සිදුවන මරණයක දී, විවාහයක දී, රෝහල් ගතවීමක දී, දරු උපතක දී, පවුල ආර්ථික වශයෙන් පහත් මට්ටමකට ඇද වැටීම වලක්වාලීමේ අරමුණින් සිදු කෙරෙන ආරක්ෂණ වැඩසටහන් සඳහා සෑම ප්‍රතිලාභියෙකුම දායක කරගනු ලැබේ.

### 6.7 නිවාස ලොතරැයිය

ප්‍රතිලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුගේම දායක මුදලින් ගොඩනංවනු ලබන නිවාස අරමුදලකි.

### 6.8 ප්‍රතිලාභියාට හිමි වන මුදල

සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභියාට හිමි වන මුදලින් ආහාර හෝ වෙනත් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා තමාට අවශ්‍ය ඕනෑම ස්ථානයකින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අවකාශ සලසා ඇත. (පූජ්‍ය ආයතන/වැඩිහිටිනිවාස/ළමා නිවාස/ආබාධිත නිවාසවල සිටින 1500/= ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් මුදල්, මුදල් සහනාධාර වටිනාකම සමග ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කරනු ලබයි)

### 6.9 පූජ්‍ය පක්ෂය වෙත සහනාධාර ලබාදීම:

පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාරය වන්නේ තනි පුද්ගලයන්ට හිමි රු.1500/- යේ සහනාධාර වටිනාකමයි.වයස අවුරුදු 18 ට අඩු පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාර මුදල් ආයතනයේ නීත්‍යානුකූල භාරකරුවන්ගේ ගිණුම් වලට බැර කෙරේ. මෙම ආගමික ආයතන රජයේ ලියාපදිංචි විය යුතුය.

### 6.10 වැඩිහිටි නිවාස/ළමා නිවාස/ආබාධිත නිවාස වෙත සහනාධාර ලබාදීම:

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ඇති ප්‍රමාණවත් ආදායමක් නොලබන අය තනි පුද්ගලයන් සේ සලකා රු1500/- ක සහනාධාරයක් නිකුත් කර ඇත.වයස අවුරුදු 18 ට අඩු දරුවන්ගේ සහනාධාර පාලිකාවන් නමින් ලබාදෙන අතර වයස අවුරුදු 18ට වැඩි දරුවන් සඳහා කේවල ක්‍රමයට ලබාදේ.

### 6.11 සුභසාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් තෝරා ගැනීම සඳහා වන පොදු නිර්නායක හා දර්ශක:

1. අධ්‍යාපනය
2. සෞඛ්‍ය
3. ආර්ථික මට්ටම
4. වත්කම්
5. නිවාස තත්වය
6. පවුලේ ජන විකාශය

## 6.12 සහනාධාර අත්හිටුවීමට/ අවලංගු කිරිමට හේතුවන කරුණු:

- රැකියා සඳහා විදේශගතවීම.(විදේශගතවී මාස 06 කට පසුව)
- රජයේ රැකියා ලබාදීම.
- ආදායම් තත්වය ඉහලයාම.
- අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරිම.
- මත්පැන් පානයට හා සූදුවට යොමුවීම.

කෙසේ වෙතත් මෙමගින් පවුල් ඒකකය තවත් අසරණවීම වලක්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

**සංඛ්‍යා සටහන -6.2**

**පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2014 - 2018)**

| වර්ෂය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 2014 | 1,479,811 |
| 2015 | 1,453,078 |
| 2016 | 1,407,235 |
| 2017 | 1,388,242 |
| 2018 | 1,384,021 |



සංඛ්‍යා සටහන - 6.3

### පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා වියදම (2014 - 2018)

| වර්ෂය | වියදම (රු). |
|---|---|
| 2014 | 15,041,799,341.62 |
| 2015 | 40,209,736,640.00 |
| 2016 | 40,740,170,648.31 |
| 2017 | 39,707,051,488.00 |
| 2018 | 39,238,795,641.00 |




සංඛ්‍යා සටහන - 6.4

### 2018 වර්ෂයේ සමාජ සුභසාධන අංශයේ වැඩසටහන් සඳහා වියදම

| වැඩසටහන | යෝජිත වැඩසටහන් | | පැවැත්වූ වැඩසටහන් | |
|---|---|---|---|---|
| | වෙන්වූ මුදල (රු. මි.) | නියමිත වැඩසටහන් ගණන | වියදම (රු. මි.) | නිමකල වැඩසටහන් ගණන |
| සමෘද්ධි ප්‍රතිලාභින් සවිබලගැන්වීමට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් හා නව සමෘද්ධි සහනාධාර නිකුත් කිරීම | 20 | 35 | 15.69 | 27 |

සංඛ්‍යා සටහන - **6.5**

## 2018 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | රු.**420/-** | රු.**1500/-** | රු.**2500/-** | රු.**3500/-** | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කොළඹ | 1,090 | 21,856 | 8,320 | 13,967 | 45,233 |
| ගම්පහ | 5,954 | 41,391 | 20,730 | 39,398 | 107,473 |
| කළුතර | 5,089 | 24,569 | 10,206 | 19,493 | 59,357 |
| මහනුවර | 4,791 | 35,088 | 13,730 | 26,879 | 80,488 |
| මාතලේ | 2,506 | 18,376 | 8,731 | 15,419 | 45,032 |
| නුවරඑළිය | 7,151 | 14,981 | 6,797 | 10,919 | 39,848 |
| ගාල්ල | 6,845 | 21,284 | 11,570 | 27,201 | 66,900 |
| මාතර | 4,069 | 24,499 | 10,805 | 21,633 | 61,006 |
| හම්බන්තොට | 5,393 | 16,109 | 9,892 | 21,350 | 52,744 |
| යාපනය | 1 | 13,166 | 9,114 | 31,002 | 53,283 |
| මන්නාරම | 0 | 3,347 | 2,029 | 7,644 | 13,020 |
| වවුනියාව | 1,535 | 3,393 | 1,732 | 5,095 | 11,755 |
| මුලතිව් | 41 | 2,175 | 2,330 | 6,473 | 11,019 |
| කිළිනොච්චි | 0 | 3,192 | 1,868 | 6,467 | 11,527 |
| මඩකලපුව | 14,710 | 23,200 | 9,952 | 28,878 | 76,740 |
| අම්පාර | 12,373 | 22,829 | 10,118 | 26,321 | 71,641 |
| ත්‍රිකුණාමලය | 5,064 | 13,529 | 5,833 | 14,189 | 38,615 |
| කුරුණෑගල | 7,663 | 51,377 | 25,611 | 51,932 | 136,583 |
| පුත්තලම | 1,223 | 22,208 | 8,418 | 17,718 | 49,567 |
| අනුරාධපුරය | 3,334 | 24,466 | 10,692 | 19,285 | 57,777 |
| පොළොන්නරුව | 3,634 | 8,288 | 6,508 | 12,392 | 30,822 |
| බදුල්ල | 4,692 | 20,285 | 9,773 | 19,817 | 54,567 |
| මොණරාගල | 6,534 | 13,172 | 7,648 | 16,677 | 44,031 |
| රත්නපුරය | 9,999 | 27,089 | 19,983 | 46,677 | 103,748 |
| කෑගල්ල | 6,929 | 19,866 | 11,128 | 23,322 | 61,245 |
| එකතුව | **120,620** | **489,735** | **243,518** | **530,148** | **1,384,021** |

සංඛ්‍යා සටහන-6.6 **2018 වර්ෂයේ සහනාධාර බෙදාහැරීම**

**එක් එක් කාණ්ඩ යටතේ ප්‍රතිලාභී පවුල් ගණන හා වියදම (2018.01.01 සිට 2018.12.31 දක්වා)**

| කාණ්ඩය | ජනවාරි | | පෙබරවාරි | | මාර්තු | | අප්‍රේල් | | මැයි | | ජූනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පවුල් ගණන | මුළුවියදම රු. | පවුල්ගණන | මුළුවියදම රු. | පවුල්ගණන | මුළුවියදම රු. | පවුල්ගණන | මුළුවියදම රු. | පවුල්ගණන | මුළුවියදම රු. | පවුල්ගණන | මුළුවියදම රු. |
| Rs.3,500/- | 550,230 | 1,925,805,000 | 548,690 | 1,920,415,000 | 548,029 | 1,918,101,500 | 546,640 | 1,913,240,000 | 544,449 | 1,905,571,500 | 542,515 | 1,898,802,500 |
| Rs.2,500/- | 242,200 | 605,500,000 | 242,880 | 607,200,000 | 242,689 | 606,722,500 | 243,042 | 607,605,000 | 243,472 | 608,680,000 | 244,117 | 610,292,500 |
| Rs. 1,500/- | 467,540 | 701,310,000 | 469,406 | 704,109,000 | 470,057 | 705,085,500 | 472,057 | 708,085,500 | 474,974 | 712,461,000 | 478,052 | 717,078,000 |
| Rs. 420/- | 130,680 | 54,885,600 | 130,002 | 54,600,840 | 130,131 | 54,655,020 | 129,575 | 54,421,500 | 128,576 | 54,001,920 | 128,045 | 53,778,900 |
| **Total** | 1,390,650 | **3,287,500,600** | 1,390,978 | **3,286,324,840** | 1,390,906 | **3,284,564,520** | 1,391,314 | **3,283,352,000** | 1,391,471 | **3,280,714,420** | 1,392,729 | **3,279,951,900** |

| ජූලි | | අගෝස්තු | | සැප්තැම්බර් | | ඔක්තෝබර් | | නොවැම්බර් | | දෙසැම්බර් | | මුළු වියදම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පවුල් ගණන | මුළු වියදම රු. | පවුල් ගණන | මුළු වියදම රු. | පවුල් ගණන | මුළු වියදම රු. | පවුල් ගණන | මුළු වියදම රු. | පවුල් ගණන | මුළු වියදම රු. | පවුල් ගණනs | මුළු වියදම රු. | |
| 537,681 | 1,881,883,500 | 534,783 | 1,871,740,500 | 532,808 | 1,864,828,000 | 534,816 | 1,871,856,000 | 532,846 | 1,864,961,000 | 530,148 | 1,855,518,000 | 22,692,722,500 |
| 243,464 | 608,660,000 | 242,941 | 607,352,500 | 242,763 | 606,907,500 | 244,815 | 612,037,500 | 244,616 | 611,540,000 | 243,518 | 608,795,000 | 7,301,292,500 |
| 482,591 | 723,886,500 | 483,779 | 725,668,500 | 484,624 | 726,936,000 | 488,722 | 733,083,000 | 489,185 | 733,777,500 | 489,735 | 734,602,500 | 8,626,083,000 |
| 126,170 | 52,991,400 | 125,224 | 52,594,080 | 124,401 | 52,248,420 | 122,956 | 51,641,520 | 121,896 | 51,196,320 | 120,620 | 50,660,400 | 637,675,920 |
| 1,389,906 | **3,267,421,400** | 1,386,727 | **3,257,355,580** | 1,384,596 | **3,250,919,920** | 1,391,309 | **3,268,618,020** | 1,388,543 | **3,261,474,820** | 1,384,021 | **3,249,575,900** | **39,257,773,920** |

# 07. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යසාධනය

## 7.1 හැදින්වීම

අංක 8 දරණ භාරකාර ඔප්පුව මගින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. මෙම අරමුදල රජයට අයත් වානිජ නොවන ආයතනයක් ලෙස සැලකේ. ඒ අනුව සමාජ ආරක්ෂණ අරමුදල රජයේ ප්‍රතිපාදන වලින් යැපෙන ආයතනයක් නොවන අතර, ආයතනය විසින්ම ආදායම් උපයාගන්නා බැවින් මෙසේ වර්ගීකරණය කිරීමකට ලක් කර ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම සංවර්ධන පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවද මීට ඒකාබද්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල නමින් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සභාපතිත්වයෙන් යුතුව සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මගින් අරමුදලේ කළමනාකරණ කටයුතු සිදු වේ.

**දැක්ම:-** **සමෘද්ධිමත් ප්‍රජාවක් සඳහා සුරක්ෂිත හෙටක්**

**මෙහෙවර:-** **අපේක්ෂිතව හා අනපේක්ෂිතව මුහුණදෙන සිදුවීම්වලදී බිඳවැටීමට ඉඩනොදී සමෘද්ධි ප්‍රතිලාභීන් ආර්ථිකමය, සමාජීය, සෞඛ්‍යමය සහ අධ්‍යාපනිකව ඔසවා තැබීම**

**අරමුණු:-**

- සමෘද්ධි සහනාධාරලාභීන් සහ සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතනම ආර්ථික ක්‍රියාකාරකම්වල නියැලීමේදී අනපේක්ෂිතව හා අපේක්ෂිතව මුහුණ දීමට සිදුවන මූල්‍යමය දුෂ්කරතා අවමකර ඔවුන්ගේ සමාජීය හා ජීවන තත්වය සුරක්ෂිත කිරිම.
- සහනාධාරලාභී ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල නංවා ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම.

## 7.2 අංශයේ සමස්ත ප්‍රගතිය:-

ඇමුණුම් අංක 01

ඇමුණුම් අංක 02

**හැඳින්වීම:- (සමාජ ආරක්ෂණ අරමුදල)**

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්වය හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොලී ආදායම් මගින් මෙම අරමුදල ගොඩනැගී ඇත. එසේ ගොඩනගාගත් අරමුදල තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩුආදායම්ලාභීන් හා අවාසි සහගත තත්වයන්ට පත්වූ පුද්ගලයන්,කණ්ඩායම්, ආයතන සහ ප්‍රතිලාභී නොවන නිවුන් දරු උපත් සඳහා ප්‍රතිලාභ දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් උපත් ,නිවුන් දරු උපත්, විවාහ,රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දේ. මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දේ.

**ඉලක්ක කණ්ඩායම :-**

I.සමෘද්ධි ප්‍රතිලාභීන්

II.සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්,කණ්ඩායම්,ආයතන

**ක්‍රියාත්මක ක්‍රමවේදය:-**

සමෘද්ධි ප්‍රතිලාභීන් ස්වකැමැත්තෙන් දෙනු ලබන රු.100/= ක මාසික දායකත්වය හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව ඉතිරිවන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොලී ආදායම් උපයෝගී කරගෙන උපත්,විවාහ,රෝහල් ගතවීම්,නිවුන් දරු උපත් සහ සිප්දොර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිලාභ ලබා දේ. මෙම සිදුවීම් අතරින් ප්‍රමාණය නිශ්චිතවම දැක්විය හැකි සිදුවීම වන්නේ සිප්දොර ශිෂ්‍යත්ව පමණි. එනම් වසරකට සිප්දොර ශිෂ්‍යත්වලාභී සංඛ්‍යාව 15,000 ක් වන අතර මසකට රු.1,500/= බැගින් වසර දෙකක් සඳහා මිලියන 540 ක් වෙන් කෙරේ. අනිකුත් සියලුම සිදුවීම් සම්බන්ධයෙන් නිශ්චිත ගණනය කිරීමක් දැක්විය නොහැක.ඉහත සියලුම සිදුවීම් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් කරනුයේ පහත ආකාරයටය.

ඒ අනුව පළමුව ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අංශය මගින් වර්ෂය ආරම්භයේ දී සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කරනු ලැබේ. එම අත්තිකාරම් මුදල් උපයෝගී කර ගෙන ප්‍රතිලාභ සඳහා ගෙවීම් කලයුතු අතර, ඉන්පසු අදාල වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

අදාල සිදුවීම් සඳහා වසම භාර සංවර්ධන නිලධාරියා විසින් නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර සමග අදාල ලිපි ලේඛණ කලාපභාර කළමණාකරු හෙවත් ප්‍රජාමූල බැංකු සමිති කලමණාකරු වෙත භාර දිය යුතුය. ඉන්පසු එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයේ මූලස්ථාන කලමණාකරු වෙත භාර දිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරි විසින් එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් වියදම් සහතික කිරීමෙන් පසු අදාල ප්‍රතිලාභීන්ට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හරහා ගෙවීම් සිදුකරනු ලබයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියලු වසම්වලට අදාලව සිදුකල ප්‍රතිලාභ ගෙවීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. ඉන්පසු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අදාල සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සියලු ප්‍රතිලාභ ගෙවීම් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල මගින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. යම් ආකාරයකට ලබාදුන් අත්තිකාරම් මුදල් ප්‍රමාණවත් නොවේ නම් සමාජ ආරක්ෂණ අරමුදල මගින් නැවත අත්තිකාරම් ඉල්ලුම්කල හැක.

මීට අමතරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත අවස්ථානුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන්ට, අඩු ආදායම්ලාභීන්ට හා සමාජයේ අවාසිසහගත තත්වයටපත් පුද්ගලයන්, කණ්ඩායම්, ආයතන සඳහාත් අදාල අවශ්‍යයතාවන්ට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දේ.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය:-**

වසම → කලාප කාර්යාලය → ප්‍රාදේශීය ලේකම් කාර්යාලය → ප්‍රජාමූල බැංකු සමිතිය → දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කාර්යාලය → ප්‍රකාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

**අනුමත ප්‍රතිපාදන :-** 2018 ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලි.2,053.83 ක ගෙවීම් සිදු කර ඇත.

**ආරම්භ කල දිනය:-** 2018.01.01

**අවසන් කල දිනය:-** 2018.12.31

**වියදම් වාර්තාව:-** 2018.12.31 දිනට වියදම

- ප්‍රතිලාභී ගෙවීම් - ඇමුණුම් අංක 03
- භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් - ඇමුණුම් අංක 04

**ව්‍යාපෘතියේ නිමැවුම:-** 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ඉල්ලුම් කරන ලද සියලුම ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් සිදුකිරීමට සහ සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමත මාණ්ඩලික පත්‍රිකාවලට අදාල කටයුතු ඉටුකිරීම.

**ලබා ගත් සමාජ ආර්ථික ප්‍රතිඵල:-**

- නියමිත පරිදි මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් ප්‍රතිලාභීන්ගේ මූල්‍යම දුෂ්කරතා අවම කිරීම.
- අ.පො.ස(ස.පෙ) විශිෂ්ඨ ප්‍රතිඵල ලබා අ.පො.ස (උ.පෙ) හැදෑරීමට වරම් ලද සමෘද්ධි ප්‍රතිලාභී දරුවන්ගේ ද්වීතීක අධ්‍යාපනය බිඳවැටීමට ඉඩ නොදී සාර්ථක උසස් අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම.
- උපත් සහ නිවුන් දරු උපත් සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් පෝෂණ මට්ටම ඉහල නංවා සෞඛ්‍ය සම්පන්න සමාජ ආරක්ෂණ පරිසරයක් සඳහා දායකත්වය සැපයීම.
- රටේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාලය උදෙසා දායකත්වයක් ලබා දීම.

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**

2018-2020 අධ්‍යයන වර්ෂයට අදාලව ඇඹිලිපිටිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රදානය





**සංඛ්‍යා සටහන-7.1**

සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

2014 වර්ෂයේ සිට 2018 දක්වා දායක මුදල් ලැබීම්

| වර්ෂය | ප්‍රතිලාභී සංඛ්‍යාව | ලැබීම් (රු.) |
|---|---|---|
| 2014 | 1,480,450 | 775,464,467.85 |
| 2015 | 1,466,090 | 767,937,637.00 |
| 2016 | 1,419,534 | 1,570,238,635.00 |
| 2017 | 1,407,235 | 1,677,301,000.00 |
| 2018 | 1,384,021 | 1,667,315,000.00 |
| එකතුව | | 6,458,256,739.85 |

## සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල 2018 වර්ෂය ආදායම් වියදම් ප්‍රගති වාර්තාව
## 2018/01/01 දිනසිට 2018/12/31 දින දක්වා

| අනු අංකය | විස්තරය | 2018 ජනවාරි සිට නොවැම්බර් ආදායම/වියදම රු.ශත. | | 2018 දෙසැම්බර් මාසය රු.ශත. | | 2018-12-31 දිනට මුළු ආදායම් වියදම් එකතුව රු.ශත. |
|---|---|---|---|---|---|---|
| | **ආදායම** | | | | | |
| 1 | දායකමුදල් ලැබීම් (ඇමුණුම් අංක 01) | | 1,528,912,900.00 | | 138,402,100.00 | 1,667,315,000.00 |
| 2 | නිලාවේලිනේවාසික ගාස්තු ලැබීම් | | 840,815.00 | | 347,283.50 | 1,188,098.50 |
| 3 | ආයෝජන පොලී ආදායම් | | | | | |
| | පොලී මුදල | 913,000,545.36 | | 288,418,789.06 | | |
| | (-) රදවා ගැනීමේබදු | 50,512,556.63 | 862,487,988.73 | 14,420,939.44 | 273,997,849.62 | 1,136,485,838.35 |
| 4 | වෙනත් ලැබීම් (ඇමුණුම් අංක 02) | | 2,057,723.32 | | 51,778,411.23 | 53,836,134.55 |
| | මුළු ආදායම් එකතුව | | 2,394,299,427.05 | | 464,525,644.35 | 2,858,825,071.40 |
| | **වියදම** | | | | | |
| 1 | ප්‍රතිලාභී ගෙවීම් (ඇමුණුම්අංක 03) | | 1,067,521,032.71 | | 120,137,899.16 | 1,187,658,931.87 |
| 2 | පරිපාලන ගෙවීම් | | 1,122,493.97 | | 351,242.25 | 1,473,736.22 |
| 3 | නිලාවේලිමධ්‍යස්ථානය වෙනුවෙන් වියදම් දැරීම | | 2,431,638.55 | | 345,753.23 | 2,777,391.78 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | වෙනත්ගෙවීම් (ඇමුණුම් අංක 04) | | 3,062,887.83 | | 9,919.38 | 3,072,807.21 |
| 5 | භාරකාරමණ්ඩල රැස්වීම් සඳහා වියදම් | | 761,770.00 | | | 761,770.00 |
| 6 | සිප්දොරවැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම. | | 1,250,631.30 | | 1,209,206.95 | 2,459,838.25 |
| 7 | ආදර්ශගම්මාන වැඩසටහනට මුදල් නිදහස් කිරීම. | | 76,851,337.00 | | 3,761,750.00 | 80,613,087.00 |
| 8 | සිප්දොර පියවීම් | | 48,187,500.00 | | 3,765,000.00 | 51,952,500.00 |
| | මුළු වියදම් එකතුව | | 1,520,334,291.36 | | 176,935,362.97 | 1,697,269,654.33 |
| 9 | දිස්ත්‍රික්ප්‍රතිලාභී ගෙවීම් සඳහාමුල් අත්තිකාරමලබාදීම. | | 292,730,000.00 | | 51,172,092.00 | 343,902,092.00 |
| 10 | සිප්දොර අත්තිකාරම් ලබාදීම. | | 26,370,000.00 | | 22,597,500.00 | 22,597,500.00 |
| 11 | අත්තිකාරම් ලබාදීම | | 45,000.00 | | | |
| | ආයෝජන අඩු වීම/වැඩි වීම | | 912,483,430.59 | | 123,996,930.24 | 1,036,480,360.83 |
| | මාසය මුල මුදල් ශේෂය | | 76,328,159.34 | | 37,809,864.44 | 76,328,159.34 |
| | මාසය අවසාන මුදල් ශේෂය | | 37,809,864.44 | | 201,403,215.58 | 201,403,215.58 |

සංඛ්‍යා සටහන-7.3

## සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල
## ආයෝජන විශ්ලේෂණය 2018 වර්ෂය

| ලැබීම් | | | | | | ගෙවීම් | |
|---|---|---|---|---|---|---|---|
| මාසය | උපලබ්ධි මුදල රු. | පොලී මුදල රු. | බදු | බදු අඩු කලපසු පොලී | එකතුව | ආයෝජන කිරීම් | එකතුව |
| ජනවාරි | 2,249,129,266.68 | 144,506,555.40 | 11,560,524.43 | 132,946,030.97 | 2,382,075,297.65 | 2,032,075,297.65 | 2,032,075,297.65 |
| පෙබරවාරි | 288,983,007.57 | 17,577,756.85 | 1,406,220.55 | 16,171,536.30 | 305,154,543.87 | 505,154,543.87 | 505,154,543.87 |
| මාර්තු | | | | - | - | 50,000,000.00 | 50,000,000.00 |
| අප්‍රේල් | 106,210,000.00 | 6,222,742.05 | 311,137.10 | 5,911,604.95 | 112,121,604.95 | 112,121,604.95 | 112,121,604.95 |
| මැයි | 2,573,587,630.54 | 147,712,544.23 | 7,385,627.20 | 140,326,917.03 | 2,713,914,547.57 | 2,813,914,547.57 | 2,813,914,547.57 |
| ජූනි | 4,869,745,896.64 | 279,171,946.41 | 13,958,597.32 | 265,213,349.09 | 5,134,959,245.73 | 5,134,957,445.73 | 5,134,957,445.73 |
| ජූලි | 2,032,075,297.65 | 118,368,386.11 | 5,918,419.31 | 112,449,966.80 | 2,144,525,264.45 | 2,144,525,264.45 | 2,144,525,264.45 |
| අගෝස්තු | 505,154,543.87 | 27,555,142.38 | 1,377,757.12 | 26,177,385.26 | 531,331,929.13 | 581,330,090.37 | 581,330,090.37 |
| සැප්තැම්බර් | 50,000,000.00 | 2,772,602.74 | 138,630.14 | 2,633,972.60 | 52,633,972.60 | 52,633,972.60 | 52,633,972.60 |
| ඔක්තොබර් | 112,121,604.94 | 6,324,119.30 | 316,205.96 | 6,007,913.34 | 118,129,518.28 | 118,128,598.90 | 118,128,598.90 |
| නොවැම්බර් | 2,813,914,547.56 | 162,788,749.89 | 8,139,437.50 | 154,649,312.39 | 2,968,563,859.95 | 2,968,563,859.95 | 2,968,563,859.95 |
| දෙසැම්බර් | 5,134,957,445.73 | 288,418,789.06 | 14,420,939.44 | 273,997,849.62 | 5,408,955,295.35 | 5,258,954,375.97 | 5,258,954,375.97 |
| එකතුව | 20,735,879,241.18 | 1,201,419,334.42 | 64,933,496.07 | 1,136,485,838.35 | 21,872,365,079.53 | 21,772,359,602.01 | 21,772,359,602.01 |

| අනු අංකය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | උපත් | | විවාහ | | රෝග | | මරණ | | ශිෂ්‍යත්ව | | විශේෂ උපත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමා | මුදල රු. | ප්‍රමාණය | මුදල රු. |
| 1 | කොළඹ | 64 | 480,000.00 | 535 | 4,012,500.00 | 1,175 | 3,576,500.00 | 1,054 | 15,810,000.00 | 4,498 | 6,745,000.00 | 404 | 2,060,000.00 | 7,730 | 32,684,00 |
| 2 | ගම්පහ | 292 | 2,190,000.00 | 1,656 | 12,420,000.00 | 3,638 | 10,294,300.00 | 2,154 | 32,310,000.00 | 7,630 | 11,445,000.00 | 1,452 | 7,565,000.00 | 16,822 | 76,224,300.00 |
| 3 | කළුතර | 135 | 1,012,500.00 | 892 | 6,690,000.00 | 1,975 | 5,446,000.00 | 1,673 | 25,095,000.00 | 5,075 | 7,612,500.00 | 791 | 4,000,000.00 | 10,541 | 49,856,000.00 |
| 4 | මහනුවර | 310 | 2,325,000.00 | 1,618 | 12,135,000.00 | 3,645 | 10,061,000.00 | 2,147 | 32,205,000.00 | 9,612 | 14,418,000.00 | 1,075 | 5,385,000.00 | 18,407 | 76,529,000 |
| 5 | මාතලේ | 175 | 1,312,500.00 | 652 | 4,890,000.00 | 1,399 | 3,950,030.00 | 833 | 12,495,000.00 | 4,522 | 6,783,000.00 | 269 | 1,425,000.00 | 7,850 | 30,855,530.00 |
| 6 | නුවරඑළිය | 238 | 1,785,000.00 | 601 | 4,507,500.00 | 1,414 | 3,982,500.00 | 1,041 | 15,615,000.00 | 5,332 | 7,998,000.00 | 438 | 2,270,000.00 | 9,064 | 36,158,000.00 |
| 7 | ගාල්ල | 192 | 1,440,000.00 | 1,432 | 10,740,000.00 | 2,190 | 6,037,500.00 | 1,708 | 25,620,000.00 | 7,633 | 11,449,500.00 | 752 | 3,775,000.00 | 13,907 | 59,062,000.00 |
| 8 | මාතර | 298 | 2,235,000.00 | 1,334 | 10,005,000.00 | 3,287 | 8,634,300.00 | 1,599 | 23,985,000.00 | 6,597 | 9,895,500.00 | 601 | 3,055,000.00 | 13,716 | 57,809,800.00 |
| 9 | හම්බන්තොට | 302 | 2,265,000.00 | 1,222 | 9,165,000.00 | 2,609 | 7,285,500.00 | 1,143 | 17,145,000.00 | 5,177 | 7,765,500.00 | 630 | 3,180,000.00 | 11,083 | 46,806,000.00 |
| 10 | යාපනය | 408 | 3,060,000.00 | 1,681 | 12,607,500.00 | 3,029 | 7,889,400.00 | 1,020 | 15,300,000.00 | 5,255 | 7,882,500.00 | 104 | 550,000.00 | 11,497 | 47,289,400.00 |
| 11 | මන්නාරම | 158 | 1,185,000.00 | 389 | 2,917,500.00 | 579 | 1,498,750.00 | 150 | 2,250,000.00 | 2,967 | 4,451,000.00 | 14 | 175,000.00 | 4,257 | 12,477,250.00 |
| 12 | වව්නියාව | 95 | 712,500.00 | 348 | 2,610,000.00 | 374 | 1,270,000.00 | 200 | 3,000,000.00 | 1,776 | 2,664,000.00 | 137 | 707,500.00 | 2,930 | 10,964,000.00 |
| 13 | මුලතිව් | 132 | 990,000.00 | 232 | 1,740,000.00 | 318 | 883,150.00 | 110 | 1,650,000.00 | 1,230 | 3,046,500.00 | 11 | 145,000.00 | 2,033 | 8,454,650.00 |
| 14 | කිලිනොච්චි | 125 | 937,500.00 | 282 | 2,115,000.00 | 631 | 1,628,250.00 | 150 | 2,250,000.00 | 2,559 | 4,561,500.00 | 129 | 675,000.00 | 3,876 | 12,167,250.00 |
| 15 | මඩකලපුව | 383 | 2,872,500.00 | 2,486 | 18,645,000.00 | 3,943 | 9,919,000.00 | 967 | 14,505,000.00 | 7,734 | 11,601,000.00 | 447 | 2,235,000.00 | 15,960 | 59,777,500.00 |
| 16 | අම්පාර | 594 | 4,455,000.00 | 2,455 | 18,412,500.00 | 5,062 | 11,807,700.00 | 1,085 | 16,275,000.00 | 6,817 | 10,225,500.00 | 682 | 3,510,000.00 | 16,695 | 64,685,700.00 |
| 17 | ත්‍රිකුණාමලය | 250 | 1,875,000.00 | 1,116 | 8,370,000.00 | 1,088 | 2,935,250.00 | 551 | 8,265,000.00 | 4,591 | 6,886,500.00 | 294 | 1,535,000.00 | 7,890 | 29,866,750.00 |
| 18 | කුරුණෑගල | 624 | 4,680,000.00 | 2,569 | 19,267,500.00 | 5,895 | 16,022,000.00 | 3,349 | 50,235,000.00 | 10,581 | 15,871,500.00 | 1,506 | 8,002,500.00 | 24,524 | 114,078,500.00 |
| 19 | පුත්තලම | 364 | 2,730,000.00 | 1,067 | 8,002,500.00 | 1,731 | 4,634,250.00 | 1,211 | 18,165,000.00 | 6,055 | 9,082,500.00 | 653 | 3,395,000.00 | 11,081 | 46,009,250.00 |
| 20 | අනුරාධපුරය | 382 | 2,865,000.00 | 1,079 | 8,092,500.00 | 2,137 | 6,249,750.00 | 1,107 | 16,605,000.00 | 7,076 | 10,614,000.00 | 329 | 1,645,000.00 | 12,110 | 46,071,250.00 |
| 21 | පොළොන්නරුව | 223 | 1,672,500.00 | 565 | 4,237,500.00 | 1,071 | 3,130,500.00 | 449 | 6,735,000.00 | 3,882 | 5,823,000.00 | 209 | 1,045,000.00 | 6,399 | 22,643,500.00 |
| 22 | බදුල්ල | 255 | 1,912,500.00 | 1,050 | 7,875,000.00 | 2,754 | 7,260,750.00 | 1,087 | 16,305,000.00 | 6,868 | 10,302,000.00 | 412 | 2,185,000.00 | 12,426 | 45,840,250.00 |
| 23 | මොණරාගල | 221 | 1,657,500.00 | 1,071 | 8,032,500.00 | 2,049 | 5,473,000.00 | 764 | 11,460,000.00 | 7,838 | 11,757,000.00 | 350 | 1,780,000.00 | 12,293 | 40,160,000.00 |
| 24 | රත්නපුර | 355 | 2,662,500.00 | 2,111 | 15,832,500.00 | 3,813 | 10,923,750.00 | 2,317 | 34,755,000.00 | 7,028 | 10,542,000.00 | 528 | 2,640,000.00 | 16,152 | 77,355,750.00 |
| 25 | කෑගල්ල | 132 | 990,000.00 | 1,101 | 8,257,500.00 | 2,772 | 7,868,250.00 | 1,751 | 26,265,000.00 | 6,509 | 9,763,500.00 | 526 | 2,670,000.00 | 12,791 | 55,814,250.00 |
| | එකතුව | 6,707 | 50,302,500.00 | 29,544 | 221,580,000.00 | 58,578 | 158,661,380.00 | 29,620 | 444,300,000.00 | 144,842 | 219,186,000.00 | 12,743 | 65,610,000.00 | 282,034 | 1,159,639,880.00 |

සංඛ්‍යා සටහන-7.5

**සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල - භාරකාර අනුමත වියදම්**

| අනු | විස්තරය | මුදල (රු.ශත) |
|---|---|---|
| 1 | ප්‍රා.ලේ.විල්ගමුව වකුගඩු රෝගීන් සඳහා ජල පෙරන යන්ත්‍ර ලබාදීම. | 1,172,000.00 |
| 2 | කේ.ජී.වජිරා හේරත් මියගේ ස්නායු රෝගයෙන් පෙලෙන දරුවාට ආධාර මුදල් ලබාදීම. | 60,000.00 |
| 3 | ජපන් ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් වියදම් දැරීම. | 465,031.50 |
| 4 | ආර්.එම්.මලිදුනිමසර විදුලි ඔිගනයක් මිලදී ගැනීමට ආධාර මුදල් ලබාදීම. | 48,500.00 |
| 5 | කේෂානි නිෂාදිකා වෙනුවෙන් ටැබ් යන්ත්‍රයක් මිලදී ගැනීම. | 32,499.00 |
| 6 | එම්.ජී.ඕ.කේ.තිලකරත්න ශිෂ්‍යාවට වයලීනයක් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම. | 14,250.00 |
| 7 | පී. කණිෂ්කප්‍ර දීප් ශිෂ්‍යාවට කරාටේ ශූරතාවයට සහභාගිවීමට මුදල් ආධාර ලබාදීම. | 65,000.00 |
| | **මුළු එකතුව** | **1,857,280.50** |

# 08. සමාජ සංවර්ධන හා පරිසර අංශයේ කාර්ය සාධනය

## 8.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවර සිය ප්‍රමුඛතම කාර්ය කරගත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාව පූර්ණ සවිබලකරණයකට ලක් කිරීම සඳහා ආර්ථික, සමාජීය, මානසික, දේශපාලනික, සංස්කෘතික,නෛතික හා පාරිසරික යන පුළුල් පරාසය තුළ සිය ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. ඒ සඳහා දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය ස්ථාපිත ප්‍රධානතම අංශයක් වන්නේ සමාජ සංවර්ධන හා පරිසර අංශයයි.

සමාජ සංවර්ධන හා පරිසර අංශය සමාජයේ සියලු සමාජ කණ්ඩායම් ( ළමුන්, තරුණයන්, වැඩිහිටියන් හා කාන්තාවන්) වෙත අවධානය යොමු කරමින් ඔවුන් සමාජීය, මානසික පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් මුහුණ දෙන ගැටළු හඳුනාගෙන ඒවා අවම කර දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් මානව සමාජයක් බිහි කිරීම සඳහා 2018 වර්ෂයේද රුපියල් මිලියන 245 ක් වැයකර වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

**දැක්ම**

**"සමාජීය,මානසික,පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් සවිබල ගැන් වූ ප්‍රජාවක්"**

**මෙහෙවර**

**"සමාජීය, මානසික, පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් සවිමත් මානව ප්‍රජාවක් ගොඩනැගීම සඳහා සමාජ සංවර්ධන හා පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම"**

**අරමුණු**

- විවිධ සමාජීය හේතු නිසා ජීවත්වීමට සුදුසු නිවසක් නොමැති ප්‍රජාවගේ නිවසක අයිතිය සහතික කරමින් ඔවුන්ගේ සමාජීය ජීවිතය සුරක්ෂිත කිරීම.
- සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල්වල දරු උපතක් සිදුවන විට එය තේමාවක් කරගෙන ආදායම් උත්පාදන හා පරිසර සංරක්ෂණය ඉලක්ක කර ගනිමින් ගෘහ ඒකක මට්ටමින් පැළ රෝපණය කිරීම.
- දුම්වැටි හා මත්ද්‍රව්‍ය භාවිතය හා වෙනත් සමාජීය හේතු නිසා පවුල් ඒකකයන්ගේ බිඳවැටී ඇති අභ්‍යන්තර සහජීවනය ගොඩනැගීම.
- දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 7-18 සීමාවට අයත් දරුවන් හඳුනා ගෙන ඔවුන් කණ්ඩායම් ගතකර ඔවුන්ගේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන් ඉස්මතු කිරීම, නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
- අධ්‍යාපන තරඟකාරිත්වය හා නූතන තාක්ෂණය දියුණුවේ පෙළඹවීම නිසා පොත්පත්
- පරිශීලනයෙන් ඈත්ව ඇති ළමා පරපුර පොත පත කියවීමට පෙළඹවීම හා ඔවුන්ගේ පරිකල්පනය අවධි කිරීම.

- ප්‍රජාවගේ මනෝ සමාජීය ගැටළු හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා සුදුසු සම්පත්දායක කණ්ඩායමක් නිර්මාණය කර වැඩසටහන් ක්‍රියාත්මත කිරීම හා ඔවුන්ගේ සමාජීය ජීවිතයේ ඵලදායිතාවය සහතික කිරීම.
- ඉහත වැඩසටහන නිසි වේලාවට ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම.

**සංඛ්‍යා සටහන-8.1**

**අංශයේ සමස්ත ප්‍රගතිය පිළිබඳ සාරාංශය**

| අං කය | වැඩසටහන | වෙන් වූ මුදල රු. මිලියන | වැය වූ මුදල රු. මිලියන | වැය වූ ප්‍රතිශතය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිත්වය |
|---|---|---|---|---|---|---|
| 1 | දිරිය පියස නිවාස වැඩසටහන | 200 .2 | 187.32 | 93% | 1014 | 1,014 |
| 2 | සමෘද්ධි හරිත දායාද ආදායම් උත්පාදන රුක්රෝපණ වැඩසටහන | 25 | 18.910 | 76% | 17 | 9,951 |
| 3 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය හා සතුටු පවුල වැඩසටහන | 10 | 7.038 | 70% | 358 | 26,964 |
| 4 | සමෘද්ධි කැකුළු ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන | 24. 80 | 17.491 | 70% | 1,463 | 40,334 |
| 6 | උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශනය | 17. 5 | 12.810 | 73% | 262 | 20,080 |
| 8 | ප්‍රගති සමාලෝචනය | 2.5 0 | 1.515 | 60% | 146 | 4,683 |
| | **එකතුව** | **280** | **245.084** | **87%** | **3260** | **103,026** |

## 8.2. දිරිය පියස නිවාස වැඩසටහන

**හැඳින්වීම :-** නිවාස යනු මූලික මානව අවශ්‍යතාවක් බව සමාජය විසින් පිළිගත් කරුණකි. නිවාසවල තත්වය අනුව පුද්ගලයාගේ හා ප්‍රජාවගේ දුගීකම මතුපිටට පෙනෙන සංකේතයක් විය හැක. නිවසක් නොමැතිව ජීවත් වීම දුප්පත්කම මිනුම් කරනු ලබන ප්‍රධාන සාධකයක් මෙන්ම පෞද්ගලිකත්වය,ආරක්ෂාව,සෞඛ්‍යය, ආර්ථික මෙන්ම පුද්ගල අන්‍යොන්‍ය සම්බන්ධතාවය නොමැතිවීම යන සමස්තය නිර්ණය කරන්නක් ද වේ

නිවසක් යනු පරිසරයේ කොටසක් වේ. නිවසක් තුල ජීවත්වන පුද්ගලයන්ගේ සහ පරිසරය අතර කිසියම් සම්බන්ධතාවයක් ගොඩනැගී ඇත. එය මානසිකව ගොඩනැගෙන අර්ථවත් සම්බන්ධතාවයකි. මෙහි වැදගත් මූලිකාංගය වන්නේ පවුල පිළිබඳ සංකල්පයයි. ගෘහය හා පවුල යන සංකල්ප දෙක ඉතා සමීප

ලෙස එකට බද්ධ වී ඇති අතර, නිවස ප්‍රධාන ප්‍රායෝගික හා සංකේතාත්මක භූමිකාවක් ඉටු කරනු ලැබේ.මෙවැනි ආසන්නතම හේතූන් ගැන සලකා නිවසක හිමිකාරිත්වය නොමැති බැවින් විවිධ අපහසුතාවයන්ට ලක්වන අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගෙන ඔවුන්ගේ නිවසක සිහිනය යථාර්තයක් බවට පත් කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ අපේක්ෂාවයි.

නිවසක හිමිකම නොමැතිව අනාරක්ෂිත තත්වයේ ජීවත්වන පවුල්වල විශේෂයෙන් ගැහැණු දරුවන්ගේ ජීවිතවලට බාහිර පුද්ගලයන්ගෙන් සිදුවන විනාශය හා පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් හේතුවෙන් ඔවුන් දිළිඳු බවේ අන්තයට ළගාවීම වැලැක්විය නොහැක.මෙම සමාජ අසාධාරණයන් වලක්වා අදාල නිර්ණායකයන් සපුරාලන පවුල් සඳහා රු: 200,000/= ක මුල්‍ය ආධාරයක් ලබා දෙමින් නිලධාරින්ගේ හා ප්‍රජාවගේ සාමූහික මැදිහත්වීම තුලින් නිවසක් ඉදිකර අවසන් කර දීම "දිරිය පියස" නිවාස වැඩසටහනේ ක්‍රමවේදය වේ.තම නිවස ඉදිකිරීමේදි මෙම ප්‍රතිලාභීන් ලබන අත්දැකීම් සම්භාරය සමාජ වගකීම හා පුද්ගල අභිමානය ගොඩ නැගීම වඩා වැදගත් වේ.නිවාස තෘප්තිය සමඟ තම කුටුම්භය තුල සුරක්ෂිතතාව තහවුරු කර ගනිමින් කායික මානසික සහනයක් ලැබීම තුලින් දරුවන්ගේ අධ්‍යාපනික හා සෞඛ්‍ය මට්ටම් ඉහළ නංවමින් පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය, ආර්ථික සංවර්ධනය තුලින් ජිවන තත්වය උසස් කර සවිබලගැන්වීමේ ප්‍රවේශයට යොමුකර ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීම අපේක්ෂිතය.

**ඉලක්ක කණ්ඩායම -** පහත සඳහන් නිර්ණායක යටතේ නිවසක අයිතිය නොමැති පවුල්

1. පවුලේ උපයන්නා මියගිය හෝ අක්‍රිය තත්ත්වයේ ඇති පවුල්
2. වැඩිපුර ගැහැණු දරුවන් ඇති කාන්තා මූලික පවුල්
3. අබාධිත දරුවන් සිටින පවුලක ප්‍රධාන උපයන්නා අබාධිතවීම
4. දෙමාපියන් රැකබලා ගන්නා අවිවාහක වැඩිහිටි දරුවන් ඇති පවුල්
5. දෙමාපියන් අහිමි ආච්චි / සීයා / වෙනත් රැකවරණයේ දරුවන් සිටින පවුල්
6. නිවසක් ඉදිකිරීම ආරම්භ කර ආර්ථික දුෂ්තරතා නිසා දීර්ඝ කාලයක් එය අවසන් කළ නොහැකි පවුල්

7. වකුගඩු රෝගීන් බහුල අනුරාධපුරය, පොලොන්නරුව, මාතලේ, අම්පාර, ත්‍රිකුණාමලය, අම්පාර යන දිස්ත්‍රික්කවල පවුලේ එක් අයෙකු හෝ වකුගඩු රෝගයෙන් පෙළෙන නිවසක් නොමැති පවුල්

| | |
|---|---|
| **ක්‍රියාත්මක ක්‍රමවේදය-** | සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් සුදුසු පවුල් හඳුනාගෙන ග්‍රාම නිලධාරි නිර්දේශයෙන් එය තහවුරු කර අදියර 3 ක් යටතේ ප්‍රතිපාදන නිදහස් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම. |
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** | ඉහත නිර්ණායක මත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගත් නිවාසලාභි ඉඩම්වල |
| **අනුමත ප්‍රතිපාදන-** | රු. මිලියන 200.2 |
| **ආරම්භ කළ දිනය -** | 2018.02.01 |
| **අවසන් කළ දිනය -** | 2018.12.31 |

**2018.12.31** දිනට වියදම- රු.187,320,000.00

**ව්‍යාපෘතියේ නිමැවුම -** සමෘද්ධි ප්‍රතිලාභින් හා අඩු අදායම්ලාභින් සඳහා නව නිවාස 1,001 ක් ඉදිකිරිමට සැළසුම්කළත් නිවාස 1,014 ඉදිකිරිම අවසන් කර ඇත.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** නිවසක අයිතිය පිළිබඳ ආත්ම අභිමානය ඇතිවිම, ආරක්ෂාව සහතික විම, සමාජ පිළිගැනීමට ලක්විම,පවුලේ සමාජිකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා විම ආදී පුළුල් සමාජ ප්‍රතිලාභ හිමි වේ.

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**

**පොලොන්නරුව, ගිරිතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, පී.කේ.ජී.රංහාමි මයා**





**ගාල්ල දිස්ත්‍රික්කය, පස්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පී.එම්.තුෂාරි මහත්මිය**





**මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඩබ්.එම්.ඒ.එස්.ඒකනායක මයා**





## 8.3 සමෘද්ධි හරිත දායාද ආදායම් උත්පාදන රුක්රෝපණ වැඩසටහන

මෙම වැඩසටහන 2018 වර්ෂයේදී සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 125,000 සවිබල ගැන්වීමේ ඉලක්කය අනුව යමින් ක්‍රියාත්මක කරනු ලබන ආදායම් උත්පාදන වැඩසටහනකි. ඒ අනුව 2017 වර්ෂයේදී හා 2018.06.30 දක්වා කාලය තුළ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් හා අඩු ආදායම්ලාභී පවුල්වල සිදුවූ දරු උපත් නිමිති කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ඒ ආකාරයට හඳුනා ගන්නා පවුල් වෙත කොස්, අඹ, පොල්, මැහෝගනී හා තේක්ක යන දැවමය වටිනාකමක් හා ආර්ථිකමය වටිනාකමක් ඇති පැළ වර්ග ලබාදීම කටයුතු කළ අතර, ඒ මගින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ලදි.

- ශ්‍රී ලංකාවේ වන ආවර්ණය වැඩි කිරීම තුළින් වන සම්පත හා ජල සම්පත ආරක්ෂා කිරීම
- ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම
- පවුල් ඒකකයේ ආදායම් ප්‍රවර්ධනය කිරීම
- දරුවන්ගේ අනාගත සුරක්ෂාව තහවුරු කිරීම
- පරිසර සංරක්ෂණය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය වර්ධනය කිරීම
- තිරිසර සංවර්ධන ඉලක්ක අනුව මිහිමත ජීවය සුරක්ෂිත කිරීම

| | |
|---|---|
| **ඉලක්ක කාණ්ඩායම:-** | කාන්තාවන්, ළමුන් |
| **ක්‍රියාත්මක ක්‍රමවේදය:-** | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉලක්ක කණ්ඩායම හඳුනාගෙන අවශ්‍ය පැළ ලබා දී වැඩසටහන ක්‍රියාත්මක කිරීම. |
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන:-** | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගත් පවුල් ඒකක වල |
| **අනුමත ප්‍රතිපාදන:-** | රු: 25,000,000.00 |
| **ආරම්භ කළ දිනය:-** | 2018.01.15 |
| **අවසන් කළ දිනය :-** | 2018.12.31 |
| **2018.12.31 දිනට වියදම:-** | 18,910,026.59 |
| **ව්‍යාපෘතියේ නිමැවුම:-** | ආර්ථික හා දැවමය වටිනාකමින් යුත්පොල් ,කොස්, අඹ, තෙක්ක, මහෝගනී හා වෙනත් පැළ 103,401 ක් පවුල් අතර බෙදා රෝපණය කිරීමට කටයුතු කර ඇත. |
| **ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල:-** | පවුල් 9,951 ක් තුළ ආර්ථික හා දැවමය ශාක 103,401 හිමිකාරිත්වය තහවුරු කිරීම |

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**

මාතර දිස්ත්‍රික් පස්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය



පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශිය ලේකම්



## 8.4 මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් සතුටු පවුල් වැඩසටහන

**හැඳින්වීම** :- සමාජ දේහයේ ප්‍රාථමික ඒකකය වන්නේ පවුලයි. පවුල් ඒකකයේ චර්යාවන් ප්‍රකාශ වන ප්‍රධාන කැඩපත වන්නේ සමාජයයි. සමාජ පරිණාමයත් සමඟ විස්තෘත පවුල් ඒකකයේ සිට න්‍යෂ්ටික පවුල් ඒකකය දක්වා පවුල් සංස්ථාව පරිණාමය වි ඇත. වර්තමාන පවුල් ඒකකය දෙස අවධානය යොමුකර බලනවිට මානව සම්බන්ධතා වලින් විතැන් වූ අතිධාවනකාරි ස්වරූපයෙන් ක්‍රියාකරන බවක් දැකිය හැකිය. නූතන තාක්ෂණික මෙවලම් වෙත අවිචාරවත් ලෙස ගොදුරුවීම, එකිනෙකා පරයා යම් යම් අත්පත් කර ගැනීමේ තරඟය, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ගොදුරු විම,බෝනොවන රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාවන් ඉහළ යෑම හා ආතතිය වැනි තත්ත්වයන් නිසා ඔවුන් ලබාගෙන ඇති පරාජයන් අතිමහත්ය.

මේ නිසා පවුල් ඒකකයේ සමාජිකයන් අතර අනෝන්‍ය බැඳිම් ගිලිහී යාම නිසා දූ දරු දෙමාපිය සම්බන්ධතා, බිරිඳ හා ස්වාමියා අතර සම්බන්ධතා ලිහිල් වි පවුල් ඒකකය සමාජ පරිහානියේ ප්‍රපංචයක් බවට පත් වි ඇති බව වර්තමානයේ අසන්නට හා දකින්නට ලැබෙන අත්දැකිම් තුලින් පැහැදිලි වේ. ඒ නිසා පවුල් ඒකකයේ බැඳිම් ශක්තිමත් කිරිමකින් තොරව පරිපූර්ණ සමාජ සංවර්ධනයක් ගැන කථා කිරිම ඵලදායි නොවේ.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් සතුටු පවුල් වැඩසටහන තුලින් උත්සාහ කරනු ලබන්නේ පවුල් ඒකකයේ මානව බැඳිම් ශක්තිමත් කර නූතන සමාජ ගතිකයන් පිලිබඳ පූර්ණ අවබෝධයනික් යුතුව තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරිම පිළිබඳව ප්‍රජාවගේ අවබෝධය දියුණු කිරිමයි. ඒ යටතේ තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරිමේ වැදගත්කම, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලින් අත්මිදිම,

ගෘහකළමනාකරණය ආදි තේමාවන් යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

**ඉලක්ක කණ්ඩායම:-** නූතන තාක්ෂණික මෙවලම් වෙත අවිචාරවත් ලෙස ගොදුරුවීම, තරඟකාරී ජීවන රටාව, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ගොදුරු විම,බෝනොවන රෝගවලට ගොදුරුවිමේ ප්‍රවණතාවන් ඉහළයෑම හා ආතති තත්ත්වයන්ට මුහුණපාන සමෘද්ධි ප්‍රතිලාභි පවුල් හා අඩු ආදායම්ලාභි පවුල්

**ක්‍රියාත්මක ක්‍රමවේදය:-** සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ඉහත ගැටළුවලට මුහුණපාන පවුල් තෝරාගෙන සුදුසු සම්පත්දායකයින් මගින් දැනුවත් කිරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථාන:-** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින්

**අනුමත ප්‍රතිපාදන :-** රු: 10,000,000.00

**ආරම්භ කළ දිනය :-** 2018.02.01

**අවසන් කළ දිනය :-** 2018.12.31

**2018.12.31 දිනට වියදම :-** රු: 7,038,152.30

**ව්‍යාපෘතියේ නිමැවුම :-** වැඩසටහන් 358ක් යටතේ පුද්ගලයින් 26,964 ට අදාල විෂය දැනුම ලබා දි ඇත.

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල :-** ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අවබෝධ විම හා තෘප්තිමත් පවුල් ජීවිතයක් ගත කිරීමේ අවබෝධය පුළුල්වීම.

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**



ගාල්ල දිස්ත්‍රික්කය - හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය



අනුරාධපුර දිස්ත්‍රික්කය -මනුප ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය

## 8.5 ළමා ආරක්ෂණ, ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන

හැඳින්වීම :- 2019 වර්ෂයේදී සමෘද්ධි කැකුළු ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන ප්‍රධාන අංශ 3 ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### 8.5.1 සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය:-

නූතන තාක්ෂණයේ ව්‍යාප්තියත් සමඟ ළමා පරපුර සංස්කෘතික හා සාහිත්‍ය හරයන්ගෙන් බෙලහීන අධ්‍යාත්මික වශයෙන් පිරිහුනු කණ්ඩායමක් බවට පත්ව ඇත. එබැවින් නැවතත් එම සංස්කෘකිත හා සාහිත්‍ය අගයන් සමාජගත කර වර්තමානයේ සංස්කෘතික දිසානතිය වෙනස් කිරිමට සුදුසුම තෝතැන්න වන්නේ ළමුන් ඉලක්ක වඩාත් ඵලදායි සංස්කෘතික හා සාහිත්‍යමය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමයි.

2001 වසරේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය මගින් දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ අරමුණින් අනාගත වැඩ ලෝකයට ගැළපෙන අයුරින් ඔවුන් ශාරිරික, මානසික, අධ්‍යාත්මික, සමාජීය හා සංස්කෘතිකමය වශයෙන් බලගැන්විම සඳහා වයස අවුරුදු 7 – 18 අතර පසුවන සියලු දරුවන් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා එකරාශි කර මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙහි දි පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත වුනු විවිධ ක්‍රියාකාරකම් නියැලෙමින් දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් අනාගත අභියෝග ජයගත හැකි දරුවන් දැයට තිළිණ කෙරේ. ඒ අනුව, වාර්ෂිකව සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය සමෘද්ධි බැංකු කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ජයග්‍රහණය කරන දරුවන් ජාතික තරඟාවලිය වෙත යොමු කරනු ලැබේ. සිංහල හා දමිළ මාධ්‍යයන් වයස් කාණ්ඩ 03 ක් යටතේ තරඟ අයිතම 14 ක් ඔස්සේ මෙම තරඟාවලිය ක්‍රියාත්මක කරනු ලබන අතර ඉතා සාර්ථකව 2018 වසරේ පවත්වන ලදී.

### 8.5.2 සමෘද්ධි ළමා සමාජ නායකත්ව පුහුණුව:-

සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ළමා සමාජ 11,953 ක් පිහිටුවා ඇති අතර, ඒ වටා ළමුන් 367,566 ක් ගොනු වි ඇත. මෙම ළමා සමාජ දූවා දරුවන්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරිමේ අපේක්ෂාවෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට එක් වැඩසටහන බැගින් වැඩසටහන් 331 පැවැත්වීම සැලසුම් කරන ලදි.

### 8.5.3 ළමා සමාජ පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන:-

අධ්‍යාපනික තරඟකාරිත්වය හා නූතන තාක්ෂණික දියුණුව වැරදි ලෙස භාවිතා කිරීම වර්තමානයේ ළමා පරපුර පොත් පත් පරිශීලනයෙන් ඈත්වීමට හේතු වී ඇත. සමෘද්ධි කැකුළු ළමා සමාජ හරහා නැවතත් ළමා පරපුර පොත පත කියවීමට පෙළඹවීම හා ඔවුන්ගේ පරිකල්පනය අවධි කිරීමේ අපේක්ෂාවෙන් ග්‍රාමිය මට්ටමින් ළමා සමාජ පුස්තකාල 100 ට අවශ්‍ය මුලික අවශ්‍යතා සපුරා ලිම මේ මගින් අපේක්ෂා කරන ලදි.

| | |
|---|---|
| **ඉලක්ක කණ්ඩායම -** | වයස අවුරුදු 7 – 18 අතර පසුවන සියලු දරුවන් |
| **ක්‍රියාත්මක ක්‍රමවේදය -** | වයස අවුරුදු 7 – 18 අතර වයසේ පසුවන දරුවන් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශි කර ගනිමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය කලාප, ප්‍රාදේශිය,දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් පැවැත්වීම, සමෘද්ධි ළමා සමාජ නායකත්ව පුහුණුව හා හදුනාගත් ළමා සමාජ පුස්තකාල ප්‍රවර්ධනය කිරීම |
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** | සමෘද්ධි බැංකු කලාපය, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **අනුමත ප්‍රතිපාදන -** | රු:- 24,800,000 |
| **ආරම්භ කළ දිනය -** | 2018 04.01 |
| **අවසන් කළ දිනය -** | 2018.12.31 |
| **2018.12.31 දිනට වියදම -** | රු:- 17,491,538.13 |
| **ව්‍යාපෘතියේ නිමැවුම -** | ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් මට්ටමින් වැඩසටහන් 553 පවත්වා අවසන් කර ඇත. |
| **ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** | ළමුන් 45,344 ක විවිධ හැකියාවන් සංවර්ධනය කිරිමට කටයුතු කිරීම, ළමා පුස්තකාල 281 ආරම්භ කිරීම හා නායකත්ව පුහුණු වැඩමුළු 236 පැවැත්වීම. |

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**

**ගාල්ල දිස්ත්‍රික් ඇල්පිටිය ප්‍රාදේශියලේකම් කොට්ඨාශයේ ළමා සමාජ පුස්තකාලය**






**ගාල්ල දිස්ත්‍රික් ළමා සමාජ නායකත්ව පුහුණු නාගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය**

පොලොන්නරුව දිස්ත්‍රික්කය








ජාතික මට්ටමේ ළමා සමාජ තරඟාවලිය





## 8.6 උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශනය

**හැඳින්වීම :-** දිළිඳුකම පිළිබඳව කරන සාකච්ඡාවල ප්‍රධාන මාතෘකාව බවට පත් වූයේ ආර්ථික දරිද්‍රතාවයයි. නමුත් වර්තමානයේ දරිද්‍රතාවයේ ප්‍රබල සාධකයක් බවට මානසික සාධක ද හේතු වී ඇත. තාක්ෂණික දියුණුව, තරඟකාරීත්වය, පවුල් සම්බන්ධතා බිඳ වැටීම ආදී සාධක නිසා සමාජයේ සියලු ස්ථරයන්ගේ යම් ප්‍රතිශතයක් කුමන හෝ මානසික ආතතියකින් පෙළෙන බව සඳහන් වේ. සියදිවි නසා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය, මාර්ග අනතුරු ඉහළ යැම හා පවුල් ආරවුල් වැඩිවීම ආදී තත්ත්වයන්ගෙන් එය ප්‍රකාශ වේ. මෙම ගැටළු දුප්පත් ප්‍රජාවටද පොදු තත්ත්වයක් වන අතර, එම තත්වය අවම කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### 8.6.1 නිලධාරි පුහුණුව:-

සමාජ සංවර්ධන වැඩසටහන සෘජුවම ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් මෙහෙය වන නිලධාරින්ට අවශ්‍ය මූලික දැනුම තෙදින නේවාසික පුහුණුවක් මගින් ලබාදිමටත්, මෙම විෂය පිළිබඳව ග්‍රාමිය මට්ටමින් ඇති සම්පත්දායක හිඟය අවම කර ගැනිම සඳහා හඳුනාගත් සමාජ සංවර්ධන සහකරුවන් 153 ක් ජාතික සමාජ සංවර්ධන ආයතනය සමඟ ඒකාබද්ධව උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදි.

### 8.6.2 ප්‍රජාව පුහුණු කිරීම :-

ප්‍රජාවගේ මානසික ගැටළු අවම කර ගැනීම සඳහා සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදායම්ලාභි පවුල් ඉලක්ක කර උපදේශන වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, එමගින් ඔවුන්ගේ ස්වශක්තිය වර්ධනය කරමින්, කායික හා මානසික නිරෝගිතාවය වර්ධනය කර පුද්ගල අභිමානය ගොඩනැගිමට අපේක්ෂා කරන ලදී.

| | |
|---|---|
| **ඉලක්ක කණ්ඩායම -** | සමෘද්ධි නිළධාරින් ,සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදයම්ලාභි පවුල් වල සමාජිකයන් |
| **ක්‍රියාත්මක ක්‍රමවේදය -** | සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් සුදුසු ඉලක්ක කණ්ඩායම හඳුනාගෙන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. |
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** | ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා වෙනත් සුදුසු පුහුණු මධ්‍යස්ථාන |
| **අනුමත ප්‍රතිපාදන-** | රු. 17,500,000 |
| **ආරම්භ කළ දිනය -** | 2018.02.01 |
| **අවසන් කළ දිනය -** | 2018.12.31 |
| **2018.12.31 දිනට වියදම-** | රු. 12,810,116.86 |
| **ව්‍යාපෘතියේ නිමැවුම -** | සමෘද්ධි නිලධාරින්, සමෘද්ධි ප්‍රතිලාභින් හා අඩු අදායම්ලාභින් 20,080 ක් සම්බන්ධ කර පුහුණු වැඩසටහන් 262 ක් පවත්වා ඇත. |
| **ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** | ස්වශක්තිය වර්ධනය කරමින්, කායික හා මානසික නිරෝගිතාවය වර්ධනය කර පුද්ගල අභිමානය ගොඩනැගිමට අවශ්‍ය මඟපෙන්විම් කිරීම. |

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**

ගාල්ල දිස්ත්‍රික් හබරාදුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය



හම්බන්තොට දිස්ත්‍රික්කය, වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය



## 8.7 ප්‍රගති සමාලෝචනය

**හැදින්වීම :-** ඕනෑම සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දි එය අඛණ්ඩ ඇගයීමකට ලක්කිරීම තුළින් අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටත්, සේවක කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. ඒ යටතේ සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි දිස්ත්‍රික් ක්‍රියාකාරකම් ජාතික මට්ටමින්

ත්‍රෛමාසිකව ඇගයිමත්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටටේ ක්‍රියාකාරකම් මාසිකව දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමත් මේ යටතේ සිදුකරන ලදි.

| | |
|---|---|
| **ඉලක්ක කාණ්ඩායම -** | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් සේවය කරන සමෘද්ධි සමාජ සංවර්ධන සහකාර නිලධාරින්, මුලස්ථාන කලමනාකරුවන්, දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයේ නිලධාරින් |
| **ක්‍රියාත්මක ක්‍රමවේදය -** | මාසිකව ප්‍රෙද්ශිය ලේකම් කාර්යාල ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමින් ඇගයිම , දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් තෛයි මාසිකව ජාතික මට්ටමින් ඇගයීම |
| **ක්‍රියාත්මක කරන ලද ස්ථාන -** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන |

දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන -** | රු:- 2,500,000.00 |
| **ආරම්භ කළ දිනය -** | 2018.02.01 |
| **අවසන් කළ දිනය -** | 2018.12.31 |
| **2018.12.31 දිනට වියදම -** | රු:- 1,515,700.42 |
| **ව්‍යාපෘතියේ නිමැවුම -** | දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති වැඩමුළු 146 ක්‍රියාත්මක කිරිම |
| **ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල -** | 2017 වර්ෂයේ සමාජ සංවර්ධන අංශය සඳහා වෙන් වූ රුපියල් මිලියන 280 න් 245 වැය කර 87 % ප්‍රගතියක් ලබාගැනිම. |

# 9. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්ය සාධනය

## 9.1 හැදින්වීම

2013 අංක 01 දරණ සමෘද්ධි පනතට අනුව ප්‍රජාව ආර්ථික සාමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සවිබලගැන්වීම උදෙසා සමෘද්ධි සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේලා දිළිඳුකම තුරන් කිරීමත්, සමාජ සාධාරණත්වය සහතික කිරීමත් ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම පිණිස පුද්ගලයා, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කොට ඇත. සෑම සංවර්ධන වැඩසටහනක්ම ප්‍රජාව මූලික කර ගනිමින් ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීම සිදු වේ. ඒ අනුව එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහා හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාශයක යම් කොටසක් සඳහා හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාශ කිහිපයක් සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටවනු ලැබේ.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අංශයේ කාර්ය භාරය දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය ප්‍රජාමූල සංවිධානය යි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධවන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කොටගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලනය යනාදී වශයෙන් සමස්ත සංවිධාන ව්‍යුහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටුකල යුතු සියලු සංවර්ධන කාර්යයන් ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටු කල යුතු වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් ඒ සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යා යුතුය. මේ වන විට ප්‍රජාමූල සංවිධාන 30211 ක් පිහිටුවා ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්ය සඳහා ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් **සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන** පිහිටුවා ඇත. ඒ අනුව සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 331 ක් පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් **සමෘද්ධි දිස්ත්‍රික් කමිටු** පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සිදුකල යුතුය.

**සමෘද්ධි ජාතික සම්මේලනය** - සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි ජාතික සම්මේලනය පිහිටුවනු ලැබේ.අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙනයාම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධාන වල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදු කරනු ඇත.

**දැක්ම - "සවිබල ගැන්වූ සෞභාග්‍ය සම්පන්න ප්‍රජාවක්"**

**මෙහෙවර - මානව හා භෞතික සම්පත් ශක්තිමත් කිරීමේ පුද්ගලයා , පවුල හා ප්‍රජාව තුළ සාමාජීය හා ආර්ථික තත්වය නඟා සිටුවීමට දැනුම,ආකල්ප හා කුසලතාවයන් වර්ධනය කර ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු හරහා ප්‍රජාව සවිබලගැන්වීම.**

අරමුණු -

1.ස්වකීය බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සාමාජීයය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම.

2. ප්‍රජාමූල සංවිධාන ජාලයට සම්බන්ධ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දැනුම,කුසලතා,ආකල්ප සංවර්ධනය කිරීම.

3. රජයේ සහ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිවලට අනුකූලවන පරිදි හඳුන්වා දෙනු ලබන සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

4. සමෘද්ධි සංවර්ධන වැඩසටහන තුළ ක්‍රියාත්මක වන සුභසාධන වැඩසටහන් සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීම.

**ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යභාරය-**

- සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ගොඩනැංවීම හා ශක්තිමත් කිරීම උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීමට ප්‍රජාමූල සංවිධාන අංශය ක්‍රියාත්මක කරන කාර්ය භාරය පහත පරිදි වේ.
- කුඩා කණ්ඩායම්වලට සංවිධානයවීම සඳහා ස්වකීය සාමාජිකයන්ව උනන්දු කරවීම සහ ඔවුන්ට මාර්ගෝපදේශ සැපයීම සිදු කිරීම.
- සාමාජිකයින්ගේ ඉතිරිකිරීමේ පුරුදු වැඩිදියුණු කර ගැනීම සඳහා උනන්දු කරවීම,ජීවනෝපාය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සහය ලබාදීමේ කටයුතු සිදු කිරීම.
- සාමාජිකයින්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- සමාජිකයින්ගේ සහභාගිත්වයෙන් යුතුව ශ්‍රමදාන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම නිෂ්පාදන සහ අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.
- සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අධ්‍යාපන මට්ටම සහ කුසලතා නඟා සිටුවීම.
- සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය,සමාජය කෙරෙහි සාමූහික වගකීම,යහපත් ගුණාංග සහ ගුණධර්ම ප්‍රවර්ධනය කිරීම.

## 9.2 ප්‍රජාමූල සංවිධාන අංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම.
- ❖ සමෘද්ධි ජාතික සම්මේලනය වාර්ෂිකව පැවැත්වීම.
- ❖ ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් කටයුතු වලට අදාලව මුද්‍රිත ලිපි ද්‍රව්‍ය සැපයීම.
- ❖ ආර්ථික සංවිධාන පිහිටුවීම.
- ❖ ව්‍යාපාර සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි කොඩි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- ❖ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධන ආධාර ලබාදීම.

❖ දෙපාර්තමේන්තුවේ දක්ෂතාවයන් දක්වන කාර්ය මණ්ඩලය රාජ්‍ය සේවා ක්‍රීඩා තරඟ හා ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩා තරඟ සඳහා ඉදිරිපත් කිරීම.

- සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව 30211
- සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව 331
- ත්‍රෛයි මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව 100
- ප්‍රජාමූල සංවිධාන වල මුළු සාමාජික සංඛ්‍යාව මිලි.20
- ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල තිබෙන අරමුදල් රු.මි.1,200
- 2017 සමෘද්ධි කොඩි ආදායම රු.මි.185.5
- 2018 සමෘද්ධි කොඩි ආදායම රු.මි. 191.3
- කොඩි ආදායමින් ක්‍රියාත්මක විවිධ ව්‍යාපෘති සඳහා කළ වියදම් රු.මි.56.54

සංඛ්‍යා සටහන-**9.1**

| අනු අංකය | වැඩසටහන | වියදම(රු.) |
|---|---|---|
| 01. | සමාජ විගණන කණ්ඩායමක් බිහිකර ගැනීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 1 705,890.50 |
| 02. | ප්‍රාදේශීය සංවිධානවල භාණ්ඩාගාරික සහ අභ්‍යන්තර විගණකවරුන් සඳහා ගිණුම් පුහුණුව | 1 113,087.00 |
| 03. | ප්‍රාදේශීය සංවිධානවල අභ්‍යන්තර විගණකවරුන් සඳහා විගණන පුහුණුව | 451,858.90 |
| 04. | දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම | 1 188,006.00 |
| 05. | ප්‍රජා පුහුණුකරුවන් මගින් සමෘද්ධි ප්‍රතිලාභීන් පුහුණු කිරීම | 11,905,715.00 |
| 06. | ක්‍රීඩා සංවර්ධන හා ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන | 9 100,899.00 |
| | මුළු වියදම | **25 465,456.40** |

## 9.3 පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 04 වන වගන්තියේ (උ) හා (ඌ) හි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 05 වන වගන්තියේ (ඕ) හි සඳහන් බලතල ප්‍රකාරව 06 වන වගන්තියේ (ඇ) හා (ඒ) හි සඳහන් කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ප්‍රජාව අතුරින් තෝරාගත් ප්‍රජා විපර්යකාරකයින් නව සමෘද්ධි සංවර්ධන වැඩසටහන් පිළිබඳවත් ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන වල ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම හා විධිමත් කිරීම උදෙසා සමෘද්ධි ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත.

### 9.3.1 ප්‍රජා පුහුණුකරුවන් (ප්‍රජා විපර්යකාරකයින් ) තෝරා ගැනීම

ප්‍රාදේශීය (මූලස්ථාන) සමෘද්ධි කළමනාකරු විසින් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු සභාපතිතුමාගේ නිර්දේශය හා කලාපභාර සමෘද්ධි කළමනාකරුවන්ගේ අනුදැනුම මත එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රජා නියෝජිතයින් දෙදෙනෙක් හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ භාණ්ඩාගාරික හා අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කරන නිලධාරී දෙදෙනෙක් තෝරාගැනීමට කටයුතු කර ඇත. මෙම සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රජා නියෝජිතයින් සඳහා පහත සඳහන් මාතෘකා යටතේ මූලික පුහුණුවක් ලබාදීමට කටයුතු කර ඇත.

I. සමෘද්ධි සංවර්ධන වැඩසටහන
II. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන සඳහා මූලික ගිණුම් ක්‍රමය.
III. සමාජ විගණනය

ප්‍රජා පුහුණුකරුවන් ලෙස කටයුතු කරන ප්‍රජා නියෝජිතයින් විසින් ප්‍රජා නායකයින් වෙත ලබා දෙනු ලබන පුහුණුව ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගේ සැදුම්ලත් "ප්‍රජා පුහුණු අධීක්ෂණ කමිටුව " මගින් මනා ලෙස අධීක්ෂණය කිරීම සිදු කෙරේ.
ප්‍රජා පුහුණු අධීක්ෂණ කමිටුව විසින් ප්‍රජා පුහුණුකරුවන් මගින් සිදු කරනු ලබන සෑම පුහුණුවක්ම මනා ලෙස අධීක්ෂණය කිරීමෙන් පසු ප්‍රජා විපර්යකාරකයකු ලෙස පත් කල හැකි ප්‍රජා නියෝජිතයින් තෝරා නම් කිරීම සිදු කෙරේ.



### 9.4 දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල ,ප්‍රාදේශීය සංවිධානවල වැඩසටහන් අධීක්ෂණය කිරීම , නියාමනය කිරීම, සහ ඇගයීම. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

**ස්ථානය** - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**සහභාගිත්වය** - ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරු,ලේකම්වරු,ප්‍රජාමූල බැංකු සමිති ජොෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු වල යෙදී සිටින තුන්දෙනෙකු

සෑම වර්ෂයකම තුන්මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම සිදු කෙරේ..




2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව

I. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර

පනතේ 16(ඉ)ඡේදයට අනුව

II. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞර්ෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා එක් වැඩසටහනක් ලෙස 2018 වසරේ මැයි 31 දිනට යෙදෙන ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කෙරින.සමෘද්ධි කොඩි පිළිගැන්වීමෙන් එක් රැස් කරන අරමුදල් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය නමින් සමෘද්ධි සමිතියේ ගිණුම් ආරම්භ කර තැන්පත් කර ඇත.තම වසමට අයත් ප්‍රජාමූල සංවිධානවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි

ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිහැන්වීම දුම් වැටි හා මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවිඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම මින් බලාපොරොත්තු වේ.

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩුඅදායම්ලාභීන්ගේ සමාජ සුභසාධන කටයුතු සඳහා මෙම අරමුදල් යොදවනු ලැබේ.

i. කොඩි මුද්‍රණය කිරීම
ii. දිස්ත්‍රික් මට්ටමින් බෙදා හැරීම.
Iii. ප්‍රාදේශීය හා ප්‍රජාමූල සංවිධාන මට්ටම බෙදා හැරීම
iv. දුම්වැටි හා මත්ද්‍රව්‍යවලින් ප්‍රජාව නිදහස් කර ගැනීම සඳහා දැනුවත් කරමින් කොඩි පැලඳවීම තුළින් අරමුදල් එක් රැස්කිරීම.

සියලුම ප්‍රජාව සඳහා සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කෙරේ.දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුලින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහායෙදවීම.







**ලබා ගත් සමාජ ආර්ථික ප්‍රතිපල -**

| අංකය | ලබාගත් සමාජ ආර්ථික ව්‍යාපෘතිය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නිවාස ඉදිකිරීම් | 149 |
| 2 | නිවාස අලුත්වැඩියා කිරීම් | 365 |
| 3 | පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව | 2576 |
| 4 | පාසල් දරුවන් සඳහා පොත් උපකරණ ලබාදීම | 69679 |
| 5 | සනීපාරක්ෂක වැඩසටහන | 716 |
| 6 | සෞඛ්‍යය හා පෝෂණ | 621 |
| 7 | කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් | 569 |
| 8 | මත් නිවාරණ වැඩසටහන | 940 |
| 9 | අබාධිත සුභසාධනය | 356 |
| 10 | කැකුළු ළමා සමාජ වැඩසටහන | 26973 |

## 9.6 ක්‍රීඩා සංවර්ධන හා ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන

I. සමෘද්ධි ප්‍රතිලාභී දරු දැරියන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනාගෙන ඔවුන් ජාතික හා අන්තර්ජාතික තලයට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකිරීම.

II. ක්‍රීඩා දක්ෂතා ඇති ප්‍රතිලාභී දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන් හා ආකල්ප සංවර්ධනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් (ප්‍රධාන කාර්යාලය ඇතුළුව) දිවයින පුරා විසිර සිටින සමස්ත කාර්ය මණ්ඩලය /රාජ්‍ය සේවා/පලාත්/දිස්ත්‍රික්/ජාතික හා අන්තර්ජාතික තරඟාවලීන් සඳහා යොමු කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා සමිති පිහිටුවීම.

සමෘද්ධි නිලධාරීන් හා සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන්ගේ ක්‍රීඩා කුසලතාවය වර්ධනය කිරීම සිදු කෙරේ.









# 10 ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශයේ කාර්යසාධනය

## 10.1 හැදින්වීම



2030 වනවිට දුප්පත්කම දුරලීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට ක්‍රියාවට නංවමින් 2018 වර්ෂය දුප්පත්කම දුරලීමේ දෙවන වර්ෂය ලෙස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවද ඊට සමගාමීව සියලු සංවර්ධන වැඩසටහන් සමෘද්ධි සහනාධාරලාභින් සවිබලගැන්වීම ඉලක්කකර ගනිමින් ක්‍රියාත්මක කරන ලදි.

මේ යටතේ ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහනද සමෘද්ධි සහනාධාරලාභින් සවිබලගැන්වීම ප්‍රමුඛත්වයෙහි ලා ගනිමින් වැඩසටහන් සැලසුම් කරන ලද අතර දෙපාර්තමේන්තුව විසින් මෙම අංශය වෙත ලබා දෙන ලද සවිබලගැන්විය යුතු පවුල් 30,273 ක ඉලක්කය සපුරා ගැනීමට නව්‍ය හා විශේෂිත වූ සංවර්ධන වැඩසටහන් 06 ක් ක්‍රියාවට නංවන ලදි.මේ සඳහා රු.මි.998.38 ප්‍රතිපාදන ප්‍රමාණයක් ජීවනෝපාය සංවර්ධන උදෙසා වෙන් කර දෙන ලදි.



ඒ අනුව සමෘද්ධිලාභින් සවිබලගැන්වීම ඉලක්ක කරමින් ව්‍යාපෘති 25,241 ක්නිම කිරිමට කටයුතු කරන ලදි. ඒ සඳහා රු.මි. 630.17 ක් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට යොදවන ලද අතර ඊට රු.මි.383.28 ක ප්‍රතිලාභි දායකත්වයක්ද ලබා ගැනිමට හැකිවිය.

**සංඛ්‍යා සටහන-10.1**

**රජයේ හා ප්‍රතිලාභි දායකත්වය සහිතව නිමකරන ලද වැඩසටහන් වලභෞතික හා මූල්‍ය ප්‍රගතිය.**

| වැඩසටහන | වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) | ප්‍රතිලාභි දායකත්වය (රු.මි.) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. "සමෘද්ධි අරුනළු"කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන වැඩසටහන | 438.93 | 12,319 | 401.41 | 261.32 | 12,319 |
| 2. ශිල්පීය සවිබලකරණය තුලින් රැකියාගත කිරිමේ වැඩසටහන | 19.00 | | | | |
| 3. ගෙවතු වගා සංවර්ධන වැඩසටහන | 110.00 | 9,145 | 56.58 | 27.96 | 9,145 |
| 4. කාබණික වගා සංවර්ධන වැඩසටහන | 75.00 | | | | |
| 5. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැ. | 200.00 | 1,832 | 77.15 | 46.06 | 1,832 |
| 6. විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන | 30.07 | 462 | 13.69 | 9.62 | 462 |
| 7. ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන යටිතල පහසුකම් සං.වැ. | 42.00 | 3 | 4.44 | 0 | 576 |
| **පරිපාලන වියදම** | **4.00** | | **0.28** | | |
| **එකතුව (භාණ්ඩාගාරප්‍රතිපාදන)** | **919.00** | **23,761** | **553.55** | **344.96** | **24,334** |
| 8. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන සංවර්ධන වැඩසටහන (අවිච්ඡේද) | 36.93 | 1,193 | 34.57 | 17.29 | 1,193 |
| *9.* සමෘද්ධි ආදර්ශ ගම්මානයන්හි නිවාස(අවිච්ඡේද) සංවර්ධන වැඩසටහන | 42.45 | 287 | 42.05 | 21.03 | 287 |
| **එකතුව (ආරක්ෂණ භාරකාර අරමුදල)** | **79.38** | **1,480** | **76.62** | **38.32** | **1,480** |
| **මුළු එකතුව** | **998.38** | **25,241** | **630.17** | **383.28** | **25,241** |

ප්‍රස්ථාර සටහන 10.1 - ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රතිපාදන බෙදී ගිය අයුරු






## 10.2 සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන සමෘද්ධි සහනාධාරලාභින් ඉලක්ක කර ගනිමින්ම දිස්ත්‍රික් 25 තුල සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදි. මෙහිදි දුප්පත්කම දුරලීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව සමෘද්ධි වැඩසටහන තුල ඉහල ආදායම් කාණ්ඩයන්ට අයත් සිටින නිශ්චිතව සවිබලගැන්විය හැකි සමෘද්ධි සහනාධාරලාභින් ඉලක්ක කර ගත් අතර, ඒ සඳහා රු.මි. 438.93 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදි.

ප්‍රතිපාදන වෙන් කිරිමේදි දිස්ත්‍රික් මට්ටමින් සිටි සමෘද්ධි සහනාධාරලාභි පවුල් සංඛ්‍යාව ඉලක්ක කර ගන්නා ලදි. එමෙන්ම වැඩසටහනට වෙන් කරන ලද සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව, සෑම දිස්ත්‍රික්කයක්



වෙතම සවිබලගැන්විය යුතු නිශ්චිත ඉලක්කයක් ලබා දෙමින් පවුලේ ආදායම ඉහළ මට්ටමකට රැගෙන යාම සඳහා අවශ්‍ය ශඳුඅත විශ්ලේෂණයක් (SWOT Analysis) සකස් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.එක් ව්‍යාපෘතියක් සඳහා ලබා දුන් උපරිම මුදල රු. 45,000/- ක් වු අතර ව්‍යාපෘති ඇස්තමේන්තු වියදමෙන් 40% ක් සඳහා ප්‍රතිලාභි දායකත්වත්වය ලබා ගන්නා ලදි.



ඒ අනුව මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය පහත පරිදි වේ.

**සංඛ්‍යා සටහන-10.2 - සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතින්හි ප්‍රගතිය**

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | දෙපාර්ත මේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාති | 2,311 | 69.28 | 27.71 | 2,311 | 2,311 |
| පශු සම්පත්සංවර්ධන ව්‍යාපෘති | 1,242 | 48.89 | 19.59 | 1,242 | 1,242 |
| ධීවර සංවර්ධන ව්‍යාපෘති | 216 | 8.04 | 3.22 | 216 | 216 |
| කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ව්‍යා. | 8,183 | 262.76 | 105.10 | 8,183 | 8,183 |
| රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු ව්‍යාපෘති | 367 | 10.53 | 4.21 | 367 | 0 |
| පරිපාලන වියදම් | | 1.91 | | | |
| **එකතුව** | **12,319** | **401.41** | **159.83** | **12,319** | **11,952** |



ඒ අනුව, සමස්ත ඉලක්කය අභිබවා සමෘද්ධිලාභි පවුල් 12,319ක ගේ ජීවනෝපායන් සඳහා මුදල් ප්‍රදානයන් ලබා දුන් අතර මෙම සියලු පවුල් සමෘද්ධි වැඩසටහනේ ඉහල ආදායම් කාණ්ඩයට අයත් ප්‍රතිලාභි පවුල් වීම විශේෂ වේ. මෙම වැඩසටහන සඳහා රු.මි. 438.93 ක් වෙන් කලද අග්‍රිම නොලැබීම හේතුවෙන් වැය කරන ලද්දේ රු.මි. 401.41 ක් පමණි. ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභිදායකත්වය වු රු.මි. 159.83 ක් වීමද මෙහි ලා විශේෂයෙන් පෙන්වා දිය යුතුය.

## 10.3 සමෘද්ධි ආදර්ශ ගෙවතු වගා සංවර්ධන වැඩසටහන



" එක්වෙමු නැගිටිමු - අටුකොටු පුරවමු"යන තේමාව යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය මගින් මෙහෙයවන ජාතික ආහාර නිෂ්පාදනය සංග්‍රාමයට සමගාමීව සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි ආදර්ශ ගෙවතු වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

2018 වර්ෂයේ සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් සවිබලගැන්වීමට ඉලක්ක කරන ලද පවුල් 125,000 කගේ ගෙවතු සංවර්ධනය කිරිම සඳහා දැනුවත් කිරිම් හරහා ප්‍රතිලාභින් යොමු කරවීමට කටයුතු කරන ලද අතර, එමඟින් පවුලේ පෝෂණය ඉහල නැංවීම, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරිම, පවුලේ ජීවන වියදම අවම කිරිම, අතිරේක ආදායම් මාර්ගයක් ඇති කර ගැනීම හා වස විසෙන් තොර එළවළු භාවිතයට හුරු කරවීම මෙහි මුලික අරමුණු අතර විය.



මෙම වැඩසටහනේ තවත් කටයුත්තක් වුයේ ප්‍රජාමුල බැංකු සංගම් හා බැංකු සමිති පරිශ්‍ර, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ පරිශ්‍ර මෙන්ම නිලධාරි ගෙවතු සංවර්ධනය සඳහා බීජ පැකට් ලබා දීමට කටයුතු කිරිමයි.

ඒ අනුව පහත සඳහන් වනුයේ ක්‍රියාත්මක ගෙවතු සංඛ්‍යාවයි.

සංඛ්‍යා සටහන-10.3

ක්‍රියාත්මක ගෙවතු සංඛ්‍යාව

| ප්‍රතිලාභී ගෙවතු සංඛ්‍යාව | නිලධාරින්ගේ ගෙවතු සංඛ්‍යාව | ප්‍රජාමූල බැංකු සංඛ්‍යාව | ප්‍රජාමූල බැංකු සමිති/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
|---|---|---|---|
| 62,353 | 11,480 | 598 | 230 |

ඒ අනුව මෙම වැඩසටහන වඩාත් සාර්ථක කර ගැනීමට වසම් මට්ටමින් හොඳම ආදර්ශ ගෙවත්ත / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හොඳම ආදර්ශ ගෙවතු 03 හා හොඳම දිරිය ගොවීන් තිදෙනෙකු වෙනුවෙන් ත්‍යාග දීමනා ලබා දෙන ලදි.

ඒ අනුව මෙම වැඩසටහන යටතේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන-10.4

**ගෙවතු වගා සංවර්ධන වැඩසටහනේභෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| වසම් මට්ටමින් හොඳම ගෙවතු(A) | | ප්‍රා.ලේ. කොට්ඨාශ මට්ටමින් හොඳම ගෙවතු (B) | | ප්‍රා.ලේ. කොට්ඨාශ මට්ටමින් හොඳම තරුණ ගොවීන් (C) | |
|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | මුදල (.රු) | සංඛ්‍යාව | මුදල (.රු) | සංඛ්‍යාව | මුදල (.රු) |
| 8,213 | 37,770,150 | 624 | 8,308,614 | 308 | 4,419,611 |

| ගෙවතු වැඩසටහනේ සමස්ත වියදම | |
|---|---|
| ඉහත A,B,C සඳහා වැය වූ මුළු මුදල (.රු) | 50,498,375 |
| දැණුම්වත් කිරිමේ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා වියදම (.රු) | 4,405,550 |
| නිලධාරින් හා ආයතන පරිශ්‍රවල බිජ පැකට් සඳහා වැය කල මුදල (.රු) | 1,512,208 |
| වැඩසටහන සඳහා වැය කල මුළු මුදල (.රු) | 56,416,133 |

## 10.4 සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන



කෘෂිකර්මික, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත හා සේවා සැපයීම් යන කුමන හෝ නිෂ්පාදන කටයුත්තක් වඩාත් වර්ධනය කරමින් සමෘද්ධි ව්‍යාපාරයට අනන්‍ය වූ “ සමෘද්ධි නිෂ්පාදනයන් ” දේශිය විදේශිය වෙළඳපල දක්වා රැගෙන යාමේ මූලික ආරම්භයක් මෙම වැඩසටහන තුලින් ක්‍රියාත්මක කිරිම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු අතර විය.

ඒ අනුව 2018 වර්ෂයේද සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන 49 ක් හඳුනා ගන්නා ලද අතර ඉන් ගම්මාන 46 ක සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදි.

එක් ගම්මානයක් සඳහා රු.මි. 4.00 බැගින් රු.මි. 153.34 ක මුදල් අනුමත කලද භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කලහැකි වුයේ ගම්මාන 27 ක පමණි.මෙහිදි ද එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් දෙපාර්තමේන්තු උපරිම දායකත්වය රු. 45,000 ක් වූ අතර, ව්‍යාපෘතියක ඇස්තමේන්තු වියදමෙන් 40% ක් ප්‍රතිලාභියා විසින් ද ඉතිරි 60% දෙපාර්තමේන්තුව විසින් දරන ලදි.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වැය කල මුදල අනුව නිෂ්පාදනයන් පහත පරිදි වර්ගිකරණය කල හැකිය.

සංඛ්‍යා සටහන-10.5

## නිෂ්පාදන වර්ගීකරණය

| අනු අංකය | ගම්මානයේ නම | නිෂ්පාදන ව්‍යාපෘතිය | ව්‍යාපෘති / ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැය කළ මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | තෙලවල ද. | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන | 40 | 0.70 |
| 2 | හිඟුරලගම | ගම්මිරිස් බුලත් වගාව / | 52 | 1.69 |
| 3 | දුන්ගාලපිටිය | විසිතුරු මල් වගාව | 100 | 2.88 |
| 4 | කුංචාවත්ත | විසිතුරු තෘණ වගාව | 35 | 2.59 |
| 5 | රණපනාදෙණිය | මල් වගාව | 64 | 4.00 |
| 6 | කොටවිල ද. | මැටි ආශ්‍රිත නිෂ්පාදන | 96 | 3.30 |
| 7 | බින්තැන්න | කුරුඳු වගාව | 38 | 4.39 |
| 8 | පට්ටිවෙල | කිරි වගාව | 61 | 3.72 |
| 9 | දිඹුල්කුඹුර | කැපූ මල්/එළවළු වගාව / | 66 | 2.62 |
| 10 | ඇන්නරුව | සිවුරු මැසීම හා වාහන වර්ණ ගැන්වීම | 114 | 3.99 |
| 11 | ඇල්ලලන්ද | කිතුල් ආශ්‍රිත නිෂ්පාදන | 34 | 1.36 |
| 12 | කුඩුමහුවෙල | කැපුම් මල් වගාව | 66 | 2.89 |
| 13 | හටංගල | ගම්මිරිස් වගාව | 65 | 1.46 |
| 14 | මැලෑව | පේර වගාව | 56 | 2.25 |
| 15 | මහනෙළුබෑව | ඕකිඩ් වගාව | 88 | 3.84 |
| 16 | කිරිඔය | පලතුරු වගාව | 14 | 0.22 |
| 17 | කෝලාවිල් | බෝග වගාව හා කුකුල් පාලනය | 46 | 1.55 |
| 18 | සෙල්වනගර් නැ. | අත්‍යන්ත්‍ර රෙදි නිෂ්පාදනය | 89 | 3.84 |
| 19 | මලයාර්කට්ටු | ගව හා එළු පාලනය | 89 | 4.00 |
| 20 | ඊශ්වරිපුරම් | කිරි දත් /බෙහෙත් හා බයිට් නිෂ්පාදන | 100 | 4.00 |
| 21 | ඖෂධපිටිය | සුළු පරිමාණ කර්මාන්ත | 97 | 4.00 |
| 22 | පොක්කනෙයි | පාපිසි නිෂ්පාදන | 34 | 2.46 |
| 23 | මතලොඩෙයි | දොර අගුල් නිෂ්පාදනය | 42 | 1.77 |
| 24 | තෙරන්කන්ඩල් | සත්ත්ව පාලන හා ගඩොල් නිෂ්පාදන | 89 | 3.92 |
| 25 | සපුමල්තැන්න | කෘෂි හා සත්ත්ව පාලන | 88 | 3.43 |
| 26 | මලෙයියාලම්පුර ම් | මී මැසි පාලනය | 86 | 3.96 |
| 27 | ක්‍රිෂ්නපුරම් | ආහාර නිෂ්පාදන | 83 | 3.95 |
| | **එකතුව** | | **1832** | **78.78** |



නව්‍ය අත්දැකීම් ලබා දෙමින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයකින් ගම්මාන 02 ක් හඳුනා ගන්නා ලද අතර පවතින නිෂ්පාදන කටයුත්ත වඩාත් වර්ධනය කරමින් සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභී ඇතුළු නිෂ්පාදනයේ නියුතු සියලු ප්‍රජාවගේ ආදායම වැඩි කිරීමට කටයුතු කරන ලදි. මෙහිදි විශේෂයෙන් පෙන්වා දිය යුත්තේ සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම ඉලක්ක කරමින් මෙම වැඩසටහන දියත් කලද නිෂ්පාදන කටයුත්තක මුළු ගමම නියැලි සිටින විට ලබා දෙන ප්‍රතිලාභ මුළු ගමම අදාල කර ගැනිමට සිදුවීමයි.

පහත සඳහන් කරනුයේ එම ගම්මාන 27 හි ක්‍රියාත්මක කරන ලද නිෂ්පාදනයන් පිළිබඳව වූ භෞතික හා මූල්‍ය තත්ත්වයන් වේ.

සංඛ්‍යා සටහන-10.6

**සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගති**

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | දෙපාර්ත මේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව | සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපාති | 769 | 34.22 | 13.88 | 769 | 769 |
| පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 244 | 11.27 | 4.51 | 244 | 244 |
| කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන ව්‍යා. | 819 | 33.29 | 13.32 | 819 | 819 |
| එකතුව | 1832 | 78.78 | 31.71 | 1832 | 1832 |

## 10.5 විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන



දිස්ත්‍රික් වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමානවත් නොවන විට එම දිස්ත්‍රක්කයන්හි අත්‍යාවශ්‍ය ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන ලබා දීමට වාර්ෂිකව යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම අංශය මඟින් රඳවා ගනු ලබයි. ඒ අනුව මෙම වැඩසටහන සඳහා රු.මි. 30.07 ක මුදලක් වෙන් කරන ලදි.

මෙහිදී ඉහළ මිලක් සහිතව වඩා හොඳ දෙස් විදෙස් වෙළඳපලක් තහවුරු කිරිමටත් වියළි කාලයේදි ද වගාවන් සඳහා ප්‍රතිලාභීන් යොමු කරවීමත්,අරමුණු කරමින් ඒ ඒ දිස්ත්‍රික්කයන්හි වඩා විභවතාවයන් සහිත වගාවන් සඳහා හා පොදු පහසුකම් වැඩිදියුණු කිරිමත් උදෙසා දිස්ත්‍රික් අවශ්‍යතාවය මත ප්‍රතිපාදන ලබා දෙන ලදි.

සංඛ්‍යා සටහන-10.7

**විශේෂ ව්‍යාපෘති වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපාති වර්ගය | ව්‍යාපාති සංඛ්‍යාව | දෙපාර්තමේන් තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි දායකත්වය (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පන් ආශ්‍රිත නිෂ්පාදන | 1 | 0.06 | 0.04 | 1 |
| විසිතුරු මත්සය වගාව | 31 | 3.25 | 1.24 | 31 |
| සත්ත්ව පාලන ව්‍යාපෘති | 33 | 0.75 | 0.51 | 33 |
| කොහු ආශ්‍රිත නිෂ්පාදන | 72 | 1.25 | 1.36 | 72 |
| කැපු මල් වගාව | 52 | 2.58 | 2.91 | 52 |
| ගම්මිරිස් වගාව | 114 | 0.15 | 0.10 | 114 |
| තේ වගාව | 1 | 0.11 | | |
| රස කැවිලි නිෂ්පාදන | 15 | 0.28 | 0.19 | 15 |
| වැල් දොඩම් වගාව | 10 | 0.45 | 0.27 | 10 |
| ප්‍රජාශාලා | 1 | 1.00 | 1.27 | 232 |
| අරතාපල්වගාව ළූනු හා වියළි මිරිස් , | 129 | 3.09 | 1.62 | 129 |
| වී ඇඹරුම් මධ්‍යස්ථානයක් ඉදිකිරිම | 1 | 0.17 | 0.11 | 125 |
| ඇදුම් මැසිම | 1 | 0.04 | | 1 |
| මාර්ගයක් ඉදිකිරිම | 1 | 0.51 | | 500 |
| **එකතුව** | **462** | **13.69** | **9.62** | **1012** |

## 10.6 යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන

2018 ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නාවූ අත්‍යාවශ්‍ය වූ යටිතල පහසුකම් ව්‍යාපාති 05 ක් සඳහා පමණක් ප්‍රතිපාදන ලබා දීමට තීරණය කරනු ලැබිණි. මෙහිදි 2017 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 03 ක් ද සමගින් රුපියල් මිලියන 43.08 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මහනුවර, නුවරඑළිය, කළුතර, ගාල්ල, හා රත්නපුර යන දිස්ත්‍රික්ක වලට අදාලව එක් එක්ව්‍යාපාතියක් සඳහා ප්‍රතිපාදන වෙන් කලද ක්‍රියාත්මක වුයේ ව්‍යාපෘති 03 ක් පමණි.

**සංඛ්‍යා සටහන-10.8**

**ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘති වර්ගය | නිමි ව්‍යාපෘති සංඛ්‍යාව | ලබාදුන් මුදල (.මි.රු) | දෙපාර්තමේන්තු වියදම (.මි.රු) | ප්‍රතිලාභි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාර්ග සංවර්ධනය | 3 | 4.44 | 4.44 | 336 |

## 10.7 අවිච්ඡේද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම -2016/2017 සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන

2016 හා 2017 වර්ෂවල ක්‍රියාත්මක සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානයන් සඳහා මුදල් ලබා දෙන ලද්දේ සමාජ ආරක්ෂණ අරමුදලිනි. ඒ අනුව අවිච්ඡේද වු අනුමත ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරිම සඳහා රු.මි. 79.91ක මුදලක් 2018 වසරේදි එම අරමුදලින් ලබා දීමට කටයුතු කරනු ලැබිණි.

මේ යටතේ නිෂ්පාදන ව්‍යාපෘතීන් සඳහා හා නිවාසවල ඉතිරි වැඩ නිම කිරිමට අවශ්‍ය මුදල් ලබා දෙන ලදි. පහත සඳහන් වනුයේ සංවර්ධන ව්‍යාපෘති වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වේ.

**සංඛ්‍යා සටහන-10.9**

**2016/2017 සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | ගම්මානයේ නම | නිෂ්පාදන ව්‍යාපෘතිය | ව්‍යාපෘති / ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වැය කල මුදල (.මි.රු) |
|---|---|---|---|---|
| 1 | මඩම්පැල්ල | පේෂකර්මාන්ත | 12 | 0.48 |
| 2 | රතඹලකැටිය | බුලත් වගාව | 104 | 2.66 |
| 3 | පරවාහැර | කම්මල්රිදි කර්මාන්තය / රත්තරන් / | 38 | 1.88 |
| 4 | වැටකේදෙණිය | වැනිලා | 166 | 0.89 |
| 5 | වතුපොල | කෙසෙල් | 3 | 0.39 |
| 6 | තංගවේදායුදපුරම් | එළු පාලනය | 54 | 4.41 |
| 7 | රණාල | මැටි හා සිමෙන්ති නිෂ්පාදන | 38 | 1.29 |
| 8 | හිරේවත්ත | ධීවර ආශ්‍රිත නිෂ්පාදන | 56 | 1.52 |
| 9 | පරදූව | කිරි නිෂ්පාදන | 9 | 0.38 |
| 10 | පුවක්දණ්ඩාව | මැටි ආශ්‍රිත නිෂ්පාදන | 8 | 0.18 |
| 11 | කුඩාවැල්ල බ. | කරවල හා උම්බලකඩ නිෂ්පාදන | 62 | 1.27 |
| 12 | අම්බලන්තොට | ඕකිඩ් වගාව | 63 | 1.13 |
| 13 | සූරියවැව | ඕකිඩ් වගාව | 50 | 0.86 |
| 14 | ඇතුල්ගම බ. | කිරි නිෂ්පාදන | 6 | 0.66 |
| 15 | ඇපලාවත්ත | කම්මල් නිෂ්පාදන | 12 | 0.14 |
| 16 | මල්මීකන්ද | කිතුල් නිෂ්පාදන | 156 | 1.77 |
| 17 | පණහඩුව | මඤ්ඤොක්කා වගාව | 23 | 0.99 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | කනකරායම්කුලම් | සත්ත්ව පාලනය හා කෘෂි නිෂ්පාදන | 5 | 1.90 |
| 19 | කට්කඩන්ද කුලම් | සත්ත්ව පාලනය හා කෘෂි නිෂ්පාදන | 20 | 0.92 |
| 20 | පෙරියමඩු | සත්ත්ව පාලනය හා කෘෂි නිෂ්පාදන | 115 | 2.51 |
| 21 | පූනෙයිනීරාව් | කිරි නිෂ්පාදන | 99 | 4.00 |
| 22 | අයියක්කච්චි | සත්ත්ව පාලනය හා කෘෂි නිෂ්පාදන | 41 | 2.00 |
| **23** | බින්තැන්න | **සනිපාරක්ෂක හා නිවාස 2018 )නව ව්‍යාපෘතියකි)** | **53** | **2.39** |
| | එකතුව | | **1193** | **34.57** |

මෙහිදි 2017 වර්ෂයේදි එක් ගම්මානයකින් නිවාස නොමැති සමෘද්ධි ප්‍රතිලාභි පවුල් 04 බැගින් හඳුනා ගන්නා ලද අතර එක් නිවාසයක් සඳහා රුපියල් 200,000 ක මුදලක් ලබා දෙන ලදි. මෙහිදි ප්‍රතිලාභි දායකත්වයද සමඟින් පරිත්‍යාගශීලින්ගේ හා ප්‍රදේශවාසින්ගේ දායකත්වය ලබා ගනිමින් මෙම නිවාස වල ඉතිරි වැඩ නිම කිරිමට 2018 වසරේදි කටයුතු කරන ලදි.

පහත පෙන්වා දෙනුයේ එම වැඩසටහනේ භෞතික හා මුල්‍ය තත්ත්වයන් වේ.

**සංඛ්‍යා සටහන-10.10**

| | |
|---|---|
| මුළු නිෂ්පාදන ආදර්ශ ගම්මාන ගණන | 96 |
| අනුමත නිවාස සංඛ්‍යාව | 288 |
| නිදහස් කළ මුදල් ප්‍රමාණය (රු.මි.) | 42.45 |
| නිමි නිවාස සංඛ්‍යාව | 287 |
| මුළු වියදම (රු.මි.) | 42.05 |





## 10.8 සමස්ත ප්‍රගතිය

මෙලෙස 2018 වර්ෂයේ වැඩසටහන් 05 ක් ඔස්සේ සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන ඵලදායිව හා සාර්ථකව ක්‍රියාත්මක කිරිමට හැකියාව ලද අතර නිශ්චිතව සමෘද්ධි ප්‍රතිලාභින් සවිබල ගැන්වීමට කටයුතු යොදන ලදි. එසේ වුවද ඉලක්කගත අපේක්ෂිත අනුමත මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරය වෙතින් නොලැබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කල නොහැකි වීම මෙහිදි විශේෂයෙන් පෙන්වා දියයුතුයි.

ක්‍රියාත්මක කරන ලද සියලු ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ලබා දුන් මුදල්, ප්‍රදානයන් වු අතර ප්‍රතිලාභි දායකත්වයද ඊට ඇතුලත් කරමින් ව්‍යාපෘතිවල නිමි වටිනාකම් වැඩිකිරිමට කටයුතු කිරිම තුලින් අඩු ආදායම්ලාභින් හා සමෘද්ධි ලාභින්ගේ ආදයම් තත්ත්වය වඩා වර්ධනය කිරිමේ හැකියාව ලැබීණි.

එමෙන්ම සමෘද්ධි බැංකු සංගම් මට්ටමින් ක්‍රියාත්මක ජීවනෝපාය චක්‍රිය අරමුදල මගින්ද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි ප්‍රතිලාභින්ට ඔවුනගේ දායකත්වය ලබා දීමට මුදල් නොමැති වු විටක අඩු පොලියක් යටතේ සහනදායි වාරික අයකිරිමකට යටත්ව ණය මුදල් ලබා දෙමින් ජීවනෝපාය වැඩසටහන වඩා පහසු කිරිමට කටයුතු යොදා තිබීණි.

ඒ අනුව එක් එක් ව්‍යාපෘති අංශයක් යටතේ නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා නිමි වටිනාකම් හා ප්‍රතිලාභින් සංඛ්‍යාව පිළිබඳව පහත පරිදි පෙන්වා දිය හැකිය.

සංඛ්‍යා සටහන-**10.11**

**ජීවනෝපාය චක්‍රීය අරමුදල මගින් ක්‍රියාත්මක කරණ ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

| *ව්‍යාපෘති වර්ගය* | *නිමි ව්‍යාපෘති සංඛ්‍යාව* | *වැයකළ මුදල (රු.මි.)* | *ප්‍රතිලාභී දායකත්වය (රු.)* | *ප්‍රතිලාභී පවුල් ගණන* | සවිබල ගන්වන ලද පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම ව්‍යාපෘති | 12,940 | 171.98 | 84.31 | 12,940 | 12,940 |
| සත්ත්ව පාලන ව්‍යාපෘති | 1,899 | 80.94 | 52.61 | 1,899 | 1,899 |
| ධීවර ව්‍යාපෘති | 334 | 10.83 | 6.49 | 334 | 334 |
| සුළු පරිමාන කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන | 9,356 | 303.59 | 197.33 | 9,356 | 9,356 |
| වෘත්තීය පුහුණු ව්‍යාපෘති | 367 | 10.53 | 4.21 | 367 | 367 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 345 | 52.30 | 38.32 | 1,355 | 0 |
| **එකතුව** | **25,241** | **630.17** | **383.27** | **26,251** | **24,896** |

ප්‍රස්ථාර සටහන **10.12**

**ජීවනෝපාය චක්‍රීය අරමුදල මගින් ක්‍රියාත්මක කරණ ලද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය**



# 11. ව්‍යවසාය සංවර්ධන අංශයේ කාර්ය සාධනය

## 11.1 හැඳින්වීම

ව්‍යවසාය සංවර්ධන අංශය මගින් 2018 වසරේදී ප්‍රධාන වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කරන ලදී.

## 11.2 ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

මේ යටතේ සමෘද්ධි ව්‍යවසායකයින් විසින් කරනු ලබන නිෂ්පාදනයන් සඳහා අලෙවි අවස්ථාව උදා කර දීම, වෙළඳපල ස්ථාවර බව රැකගනිමින් වෙළඳපල පුළුල් කර ගැනීම, ශිල්පීය හා තාක්ෂනික දැනුම ලබා දීම, ව්‍යවසාය සංවර්ධනයට අදාල යටිතල පහසුකම් සලසා දීම, නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාටද සාධාරණ මිලක් තහවුරු කිරීම හා ගුණාත්මක බවින් යුත් වස විසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයන් සඳහා ව්‍යවසායකයින් යොමු කිරීම මගින් ස්වයං රැකියා අවස්ථා සුලභ කිරීමටත් මූලිකව සිදු කරනු ලැබිය.

## 11.3 සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යාම

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබා දීමේ අරමුණින් මාසිකව සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

**දැක්ම :-** **" ජනහිතකාමී ලෙස නව්‍යතා සම්පාදනය කරන ව්‍යවසායක ප්‍රජාවක් සහ සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක්."**

**මෙහෙවර :-** **"නව දැනුමින් කුසලතාවයෙන් හා ආකල්ප වලින් සපිරි සැවොම තෘප්තිමත් වෙළඳ සහ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල නිවාස ගැටළුවට තිරසර විසඳුමක් ලබා දීම."**

**අරමුණ :-**

1. සමෘද්ධිලාභී ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීම, ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙළඳපළක් ඇති කර ගැනීම, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැංවීම, නිෂ්පාදනයට සාධාරන මිලක් ලබා ගැනීම හා පරිසර හිතකාමී හරිත රැකියා අවස්ථා සුලභ කිරීම මගින් ව්‍යවසායකයා ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්නය ස්ථිරව විසඳීම තුලින් ඔවුන් ආර්ථික සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ අධ්‍යාත්මික ගුණවගාවන් වැඩිදියුනු කිරීම.

## 11.4 සමස්ත ප්‍රගතිය පිළිබඳ සාරාංශය

සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා භාවිතා කරන ලද්දේ භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන පමණි. ඒ අනුව 2018 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 168 ක් වන අතර, සමස්ත වියදම රුපියල් මිලියන 110.5 කි.

සංඛ්‍යා සටහන-**11.1**

## ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | වැඩසටහන | වෙන් කළ මුදල රු.මි | වියදම රු.මි | ඉලක්ක ගත ව්‍යපෘති වැඩසටහන් සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ව්‍යවසාය සංවර්ධන යටිතල පහසුකම් සංවර්ධනය | 66.2 | 53.53 | 1325 | 1546 |
| 2 | දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන | 10.0 | 7.12 | 25 | 22 |
| 3 | ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් | 16.55 | 11.91 | 331 | 609 |
| 4 | ආහාර තාක්ෂන පුහුණු වැඩසටහන් | 2.0 | 0.77 | 10 | 07 |
| 5 | දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථාන පිහිටුවිම | 30.0 | 17.05 | 05 | 04 |
| 6 | නව ව්‍යවසායකයින්14,021ක් පුහුණු කිරීම හා ව්‍යාපාර ආරම්භ කිරීමට පෙලඹවීම | 33.1 | 15.86 | 14021 | 17255 |
| 7 | විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් | 4.81 | 1.47 | 04 | 04 |
| 8 | V- 2025 එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය | 4.5 | 2.42 | 01 | 01 |
| 9 | පරිපාලන වියදම් | 0.84 | 0.37 | | |
| | **එකතුව** | **168** | **110.5** | **15722** | **19448** |

### ප්‍රස්ථාර සටහන 11.1 - වැඩසටහන අනුව වියදම (රු. මි)



## 11.5 ව්‍යවසාය සංවර්ධන යටිතල පහසුකම් සැලසීම

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලබන දේශීය නිෂ්පාදන වල අතිරික්තයන් ආරක්ෂා සහිතව කල්තබා ගැනීමට අවශ්‍ය කුඩා ප්‍රමාණයේ ගෘහස්ථ ගබඩා, අලෙවි කටයුතු පහසු කරනු ලබන කුඩා ප්‍රමාණයේ ජංගම රථ, ජංගම කුටි හා නිෂ්පාදන වල තත්වය, ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩි කිරීම මෙන්ම අගය එකතු කිරීමේ නිෂ්පාදන සඳහා අවශ්‍ය උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම සඳහා අවශ්‍ය සහය මේ යටතේ ලබා දෙන අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම රුපියල් 200,000.00 බැගින් වන සේ රුපියල් මිලියන 66.2 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි.

ඒ අනුව 2018.12.31 දින වන විට ව්‍යපෘති වටිනාකමින් 50% ප්‍රතිලාභී දායකත්වයක්ද සහිතව අලෙවිකරන යටිතල පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ ගෘහස්ථ ගබඩා 116 ක් ජංගම රථ හා කුටි 503 ක් සහ සුළු පරිමාණ යන්ත්‍ර සූත්‍ර 927 ක් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබූ අතර දරණ ලද සමස්ථ වියදම රුපියල් මිලියන 53.53 කි. අලෙවිකරණ යටිතල පහසුකම් සලසා දීම තුලින් ප්‍රතිලාභී පවුලේ මාසික ආදායම අවම වශයෙන් රුපියල් 5000 කින් වැඩිවේ යැයි අපේක්ෂා කරන අතර ඒ තුළින් දුප්පත්කම අවම කොට ආදායම් ඉහල නැංවීමට අවස්ථාව ඇති කරන ලදි.

## 11.6 අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් ස්ථාපිත කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයන්ගේ වෙළෙදපළ පුළුල් කිරීමේ ක්‍රමෝපායක් ලෙස සෑම දිස්ත්‍රික්කයකම බහු විධ නිෂ්පාදන සහිත වූ අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට පියවර ගනු ලැබුණි. අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ සමෘද්ධි ව්‍යවසායකයින් වස විසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයන් සිදු කිරීමට පෙළඹවීමත් එවැනි ගුණාත්මක දේ මිලදී ගැනීමට පාරිභෝගිකයන් හුරුකරවීමටත්ය. ඒ යටතේ 2018 වසරේදී මාතලේ, අම්පාර, පුත්තලම හා ගාල්ල යන දිස්ත්‍රික්ක වල අලෙවි මධ්‍යස්ථාන ඉදි කරනු ලැබිය. මෙම ව්‍යපෘති සඳහා රුපියල් මිලියන 30.0 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2018.12.31 දිනට දරන ලද සමස්ත වියදම රුපියල් මිලියන 17.05 කි.

## 11.7 සමෘද්ධි ව්‍යවසායක පුහුණු වැඩසටහන්

සමෘද්ධි ව්‍යවසායක ප්‍රජාව තුළ සිටින සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් තව දුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලදි. එහිදී ඔවුන්ගේ ව්‍යාපාර හෝ නිෂ්පාදන වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් පවත්වා ගෙන යාමට අවශ්‍ය තාක්ෂණික දැනුම මෙන්ම න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවීම්ද ලබා දෙනු ලැබිය.

මේ සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමානය රුපියල් 50.000.00 කි. ඒ අනුව වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදන ප්‍රමානය රුපියල් මිලියන 16.55 කි.

2018.12.31 දිනට පුහුණු වැඩසටහන් 609 ක් පවත්නා ඇති අතර, ඒ තුළින් ව්‍යවසායකයින් 26255 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇත. ඒ සඳහා දරන ලද සමස්ත වියදම රුපියල් මිලියන 11.91 කි.

## 11.8 දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන සංවිධානය කිරීම

ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සමඟ සම්බන්ධ වූ හා එමගින් ප්‍රතිලාභ ලැබූ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා අඛන්ඩ වෙළෙඳපලක් ඇතිකර දීම තුලින් වැඩි අලෙවියක් ළගා කරදීමේ අරමුණින් 'සමෘද්ධි අභිමානී - 2018' යන තේමා පාඨය මුල් කරගනිමින් දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබිය. ඒ අනුව අප්‍රේල් හෝ දෙසැම්බර් උත්සව සමය කේන්ද්‍ර කරමින් දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන 25 ක් පැවැත්වීමට සැලසුම් කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 10.00 කි.

2018.12.31 දිනට දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන 22 ක් පැවැත්වීමට හැකි වූ අතර ඒ සඳහා සමෘද්ධි ව්‍යවසායකයින් 3000 කට අධික පිරිසක් සහභාගි වී ඇත. වෙළඳ ප්‍රදර්ශන වෙනුවෙන් දරන ලද සමස්ත වියදම රුපියල් මිලියන 7.12 කි.

## 11.9 ආහාර තාක්ෂණ පුහුණු වැඩසටහන්

මේ යටතේ වර්තමාන ජන සමාජය තුළ වස විසෙන් තොර දේශිය ආහාර සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් එකී ඉල්ලුම සපුරාලීමට හැකිවන්නේ දැනට ක්ෂනික ආහාර නිෂ්පාදනයේ යෙදෙන හා ඒ සඳහා රුචිකත්වයක් දක්වන සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදනයන් සිදු කිරිමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් විධිමත් න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණුවක් ලබා දෙනු ලැබිය.

ආහාර තාක්ෂණ පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2.0 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2018.12.31 දින වන විට මාතලේ, රත්නපුර, මොනරාගල, හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ප්‍රතිලාභීන් 148 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 07 ක් සංවිධානය කර ඇති අතර ඒ වෙනුවෙන් දරණ ලද සමස්ත වියදම රුපියල් මිලියන 0.77 කි.

## 11.10 නව ව්‍යවසායකයින් 14,021 ක් පුහුණු කිරීම හා ව්‍යාපාර ආරම්භ කිරීමට පෙළඹවීම

තරුණ පරපුරේ රැකියා වියුක්තිය හා දිළිදුකම පිටු දැකීමේ අරමුණ පෙරදැරි කරගනිමින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල පාසැල් හැරගිය තරුණ තරුණියන් හා වැඩිහිටියන් අතරින් කෘෂිකර්ම, සත්වපාලන, ධීවර, කර්මාන්ත හා සේවා යන ඕනෑම ක්ෂේත්‍රයක් ඔස්සේ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන අයට අවශ්‍ය පුහුණුව හා මග පෙන්වීම ලබා දීම මේ යටතේ සිදු කරන ලදී. එහිදී සාම්ප්‍රදායික ස්වයං රැකියාවන්ගෙන් බැහැර නිර්මාණශිලී හා පරිසර හිතකාමී නව නිපැයුම් තුලින් ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාරික ලෝකයට ප්‍රවිෂ්ඨ විමට කැමැත්තක් දක්වන තරුණ තරුණියන් තෝරා ගැනීම කෙරේ වැඩි අවධානයක් යොමු කරන ලදී.

ඒ අනුව ව්‍යාපෘති ගැන්වීම සඳහා එක් ග්‍රාමසේවා වසමකින් එක් අයෙකු වනසේ නව ව්‍යවසායකයින් 14,021 ක් පුහුණු කිරීමට නියමිත වූ අතර ඒ සඳහා එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 100.000.00 කි. ඒ අනුව වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 33.1 කි.

2018.12.31 දිනට නව ව්‍යවසායකයින් 17,255 දෙනෙකු සඳහා පුහුණුව ලබා දි ඇති අතර දරන ලද සමස්ත වියදම රුපියල් මිලියන 15.86 කි.

## 11.11 V-2025 එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය

ග්‍රාමීය ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ඔවුන්ට දැනුම, මූල්‍යය සහාය සහ උපදේශනය සැපයීම, සංහිදියාව පිළිබඳ පුළුල් කතිකාවතක් ඇති කිරීම සහ නීලහරිත ගම්පෙරලිය ඔස්සේ සැමගමකම සිදුවන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කරගෙනV-2025 එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය 2018.08.29, 30 සහ 31යන තෙදින මොනරාගල දී පවත්වන ලදී.

මෙම වෙළඳ ප්‍රදර්ශනය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මොනරාගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි ව්‍යවසායකයින් සහභාගී කරවන ලද අතර ඒ වෙනුවෙන් දරන ලද වියදම රුපියල් මිලියන 2.42 කි.

## 11.12 විශේෂ ව්‍යපෘති හා වැඩසටහන්

වාර්ෂික ක්‍රියාත්මක සැලසුමට ඇතුලත් නොවූ එහෙත් අලෙවි සංවර්ධන වැඩසටහන් අරමුණු හා පරමාර්ථ ඉටු වන අයුරින් කාලීනව සිදු කළ යුතු ව්‍යපෘති හෝ පැවැත්විය යුතු වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 4.81 ක් වෙන් කරන ලද අතර 2018.12.31 දිනට විශේෂ ව්‍යපෘති හා වැඩසටහන් යටතේ පහත ව්‍යපෘති සිදු කරන ලදි.

**සංඛ්‍යා සටහන-11.2**

**විශේෂ ව්‍යපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය**

| ව්‍යපෘතිය | දිස්ත්‍රික්කය | ප්‍රතිලාභ සැලසෙන පවුල් ගණන | වියදම (රු.මි) |
|---|---|---|---|
| තෙලිප්පාලෙයි අලෙවි මධ්‍යස්ථාන භූමියේ වැට ඉදි කිරීම | යාපනය | 15 | 0.31 |
| කන්තලේ අලෙවිසැල ඉදි කිරීම | ත්‍රිකුණාමලය | 05 | 0.80 |
| ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වෙළඳ ප්‍රදර්ශනය | පොලොන්නරුව | 35 | 0.05 |
| නා උල අලෙවි මධ්‍යස්ථානය සඳහා ප්‍රාග්ධන උපකරන ලබා ගැනීම | මාතලේ | 25 | 0.31 |
| **එකතුව** | | **70** | **1.47** |

## 11.13 සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල පවත්වා ගෙන යාම

සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රුපියල් 50.00 ක මුදලක් භාරකාර අරමුදලට බැර කිරීමෙනි. මෙම අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව භාරකාර මණ්ඩලයක් මගින් පාලනය වේ. අරමුදල පවත්වා ගෙන යාමේ ප්‍රධාන අරමුණ වන්නේ සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබා දීම සඳහා සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන පවත්වාගෙන යාමයි.

දිනුම් ඇදීම සඳහා භාවිතා කරනු ලබන්නේ සියලුම සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල තොරතුරු ඇතුලත් කොට සකස් කරනු ලැබූ පරිඝනක දත්ත පද්ධතියකි. මෙම දත්ත පද්ධතිය භාවිතා කොට මාසිකව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයකට එක් ජයග්‍රාහී ප්‍රතිලාභියෙකු වන සේ ජයග්‍රාහී ප්‍රතිලාභීන් 331 දෙදෙනෙකු තෝරා ගනු ලැබේ. එක් අයෙකු වෙනුවෙන් පිරිනමනු ලබන ත්‍යාග මුදලේ වටිනාකම රුපියල් 200,000.00 කි. මෙම මුදල් යොදවා නිවසක් ඉදිකිරීමට, පවත්නා නිවස වැඩි දියුනු කිරීමට, ඉඩමක් මිලදී ගැනීමට හෝ නිවසක අවශ්‍යතාවය නොමැත්තේ නම් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක යෙදවිය හැකිය. එමගින් ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දීම තුලින් ඔවුන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීමට හැකියාව ලැබේ.

මීට අමතරව නිවාස ත්‍යාග ලබා දීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටු කරන ආකාරයට වැඩි දුරටත් යොදා ගැනීමට භාරකාර මණ්ඩලයට බලය ඇත. ඒ අනුව, 2018.12.31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ලොතරැයි අරමුදලින් ප්‍රතිලාභී පවුල් වල නිවාස ප්‍රශ්නය විසදීම සඳහා පහත පරිදි කටයුතු කර ඇත.

සංඛ්‍යා සටහන-11.3

## සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | සහන සැලසු පවුල් ගණන | ලබා දෙන ලද මුදල රු. මි |
|---|---|---|---|
| 01 | සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීම | 3972 | 794.4 |
| 02 | විශේෂ නිවාස වැඩසටහන | 24 | 4.7 |
| 03 | සමෘද්ධි නිවාස වාසනා ගම්මානය (ආරච්චිකට්ටුව) | 26 | 5.69 |
| | එකතුව | 4022 | 804.79 |





( ගන්නෝරුව කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ දී ක්ෂණික ආහාර තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබන මාතලේ දිස්ත්‍රික්කයේ කාන්තාවන් )





වැඩ අවසන් වූ මාතලේ දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය ( වැඩ අවසන් වූගාල්ල දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය )



(වැඩ අවසන් වෙමින් පවතිනපුත්තලම දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථානය )



(කෑගල්ල දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශනය )



( සමෘද්ධි අභිමානී වෙළඳ ප්‍රදර්ශනය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය)



( ජංගම අලෙවි කුටිය - ගම්පහ දිස්ත්‍රික්කය )



අලෙවි කුටිය - ගාල්ල දිස්ත්‍රික්කය

# 12. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය සාධනය

## 12.1 හැදින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිදුකරනු ලබන කාර්යය තොරතුරු තාක්ෂණයත් සමඟ සම්බන්ධ කොට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මෙම අංශයේ අරමුණයි. දැනට ලිපි ලේඛන තැපැල් භාවිතයෙන් සිදුකරනු ලබන ක්‍රියාවලිය අන්තර්ජාලය භාවිතා කොට email පණිවුඩ හුවමාරු හා පරිගණක වැඩසටහන් නිර්මාණය කොට සේවාවන් කාර්යක්ෂම කිරීම තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදුකරයි.

**දැක්ම -**

**තොරතුරු හා සංනිවේදන තාක්ෂණික වැඩසටහන් ඔස්සේ ලිපි හුවමාරුවලින් තොර කාර්යාල පරිශ්‍රයක් බිහිකිරීම.**

**මෙහෙවර -**

**තොරතුරු සංනිවේදන තාක්ෂණය ගම දක්වා පුළුල් කරමින්, නිෂ්පාදන ලෝක වෙළඳපොලට යොමුකර ජාතික ආර්ථිකය විභව ශක්තියක් බවට පරිවර්තනය කිරීමෙහිලා සේවකයා, අඩු ආදායම්ලාභීයා ව්‍යාපෘති හා බැංකු ජාලය තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගන්වා නව මානයකට යොමු කිරීම.**

**අරමුණු -**

- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1073 පරිගණකගත කිරීම සඳහා පරිගණක මෘදුකාංගය නිර්මාණය කොට සියලු බැංකු ජාලගත කිරීම.
- සමෘද්ධි සහනාධාරලාභී නාමලේඛන අන්තර්ජාලය ඔස්සේ යාවත්කාලීන කළ හැකි ආකාරයට ප්‍රතිලාභී කලමනාකරණ මොඩියුලය (CRM) සංවර්ධනය කිරීම.
- මානව සම්පත් කලමනාකරණ මොඩියුලය (HRM) යාවත්කාලීන කර නිලධාරි කාර්යක්ෂමතාවය ඇගයීමේ වැඩසටහන් (Performes Evaluation)ක්‍රියාත්මක කිරිම.
- වඩාත් සුදුසුම සහනාධාර පවුල, නිර්ණායක 29 යොදාගෙන පරිගණක මෘදුකාංගයක් මගින් තෝරාගැනීම.
- ප්‍රධාන කාර්යාලය තුළ ලිපි හුවමාරුව අවම කිරිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කොට ක්‍රමවත් අභ්‍යන්තර්ජාල පද්ධතියක් (Local Area Network) සකස් කිරීම.
- දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් සඳහා වන වියදම් අවම කිරීම සඳහා ඇතිකර ඇති Calling circle දුරකථන ජාලය වඩාත් ශක්තිමත් කිරිම.

## 12.2 සමෘද්ධි ප්‍රජා මූල බැංකු පරිගණකගත කිරිම

**ක්‍රියාකාරකම්** -

i. පරිගණක බැංකු සඳහා අඛණ්ඩ මනා සේවාවක් සැපයීම සඳහා පරිගණක මෘදුකාංගය නිෂ්පාදිත ආයතන සමඟ සේවා ගිවිසුමකට එළඹීම.

ii. මෘදුකාංගයේ දෝෂ සියල්ල හඳුනාගෙන ඒවා නිවැරදි කර සියලු බැංකු වෙත ලබාදීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය -**

i. මොනරාගල, රත්නපුර, හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි සියලුම ප්‍රජාමූල බැංකු

ii. SLTS මෘදුකාංගය නියමු 6 ක් හා Online ආකාරයට බැංකු 228 ක් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි.

**ඉලක්ක කණ්ඩායම-** සමෘද්ධි ප්‍රජාමූල බැංකු

**ආරම්භ කළ දිනය -** 2012 වර්ෂය

**අවසන් කළ දිනය-** ක්‍රියාත්මක වෙමින් පවතී

**අනුමත ප්‍රතිපාදන-** මෙහි මූල්‍ය කටයුතු සිදුවන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟිනි.

**2018.12.31 දිනට වියදම-නැත**

**2018.12.31 දිනට නිමැවුම-**

i. ගනුදෙනුකරුවන් ලියාපදිංචිය
ii. ගිණුම් ඇතුලත් කිරීම
iii. ගනුදෙනු ආරම්භය
iv. ණය ඇතුලත් කිරීම
v. පාස්පොත් මුද්‍රණය

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය -**

- දැනට ක්‍රියාත්මක නියමු සමෘද්ධි බැංකුවල කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවතී.
- නිලධාරිනගේ ශ්‍රමය යොදා කරන ලද ක්‍රියාවලිය පරිගණක මෘදුකාංගය මගින් කිරීමේ දී නිවැරදිව හා පහසුව කිරීමටත්, කාලය ඉතිරිකර ගැනීමටත් හැකිවීම.
- ප්‍රතිලාභීන්ට ප්‍රමාද දෝෂයකින් තොරව කලට වේලාවට තම ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුව සැලසීම



## 12.3 CRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාකාරකම් -**

i. අන්තර්ජාලය ඔස්සේ සමෘද්ධිලාභී නාම ලේඛන යාවත්කාලීන කිරීම.

ii. නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම සඳහා යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් ලබා ගැනීමට හැකිය.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය-සියලුම සමෘද්ධි මූලස්ථාන කාර්යාල**

**ඉලක්ක කණ්ඩායම-** සියලුම සමෘද්ධි සහනාධාරලාභී පවුල්

**ආරම්භ කළ දිනය-** 2018

**අවසන් කළ දිනය-** ක්‍රියාත්මක වෙමින් පවතී

**අනුමත ප්‍රතිපාදන-** රු.මිලියන 2

**2018.12.31 දිනට වියදම -** නැත

**2018.12.31 දිනට නිමැවුම- 75%**

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය-**

1. සමෘද්ධි සහනාධාර නාමලේඛන යාවත්කාලීනව පවත්වාගැනීම.



## 12.4 සමෘද්ධි සහනාධාර සඳහා සුදුසු පවුල් නිර්ණායක භාවිතයෙන් පරිගණක මෘදුකාංගයක් මගින් තෝරා ගැනීම.

**ක්‍රියාකාරකම්** -

i. සමීක්ෂණ පත්‍රිකාවක් මගින් තොරතුරු රැස්කිරිම.
ii. සියලු තොරතුරු පරිගණකගත කිරිම.
iii. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සකස්කළ නිර්ණායක 29 යොදා ගනිමින් පරිගණක මෘදුකාංගය භාවිතයෙන් පවුල් සඳහා ලකුණු ලබාදීම.
iv. සුදුසුකම්ලාභී පවුල් නාමලේඛන ප්‍රසිද්ධ කිරිම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය**-මුළු දිවයිනම ආවරණය වන පරිදි

**ඉලක්ක කණ්ඩායම**- සියලු අඩු ආදායම්ලාභී පවුල්

**ආරම්භ කළ දිනය**- 2017

**අවසන් කළ දිනය** - සෑම වර්ෂයකම ක්‍රියාත්මක කිරිම.

**අනුමත ප්‍රතිපාදන** - මිලියන 2.50

**2018.12.31 දිනට වියදම** - නැත

**2018.12.31 දිනට නිමැවුම**- 85%

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය**-

**i.** නිසි පරිදි සහනාධාරය සඳහා සුදුසුකම්ලාභී පවුල් තෝරාගැනීමට අවශ්‍ය මෘදුකාංගයක් සැකසීම.






## 12.5 ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත කිරීම

**ක්‍රියාකාරකම්   -**

i. අභ්‍යන්තර පරිගණක හා උපාංග පිහිටා ඇති ආකාරය අනුව සැලැස්මක් සකස් කිරීම
ii. ජාලගත කිරීමට අවශ්‍ය උපාංග හඳුනා ගැනීම
iii. අභ්‍යන්තර පරිගණක සියල්ල ජාලගත කිරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය-ප්‍රධාන කාර්යාලයේ සියලු අංශ සඳහා**

**ඉලක්ක කණ්ඩායම -** ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරින්

**ආරම්භ කළ දිනය -** 2018.12.18

**අවසන් කළ දිනය-** 2018.12.28

**අනුමත ප්‍රතිපාදන -** රු.මිලියන 2

**2018.12.31 දිනට වියදම-** මිලියන 1.91

**2018.12.31 දිනට නිමැවුම-** 100%

**ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය -**

I. ප්‍රධාන කාර්යාලය තොරතුරු තාක්ෂණය තුළින් සංවර්ධනය වීම.

II. Printers, Photocopy Network කිරීම තුලින් ආයතනයට දැරීමට සිදුවන පිරිවැය අවම වීම.






# 13. මාධ්‍ය අංශයේ කාර්යසාධනය

## 13.1 හැදින්වීම

සමෘද්ධි වැඩසටහනෙහි සමස්ත ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්‍යුත් , මුද්‍රිත හා නව මාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබා දීම.

**දැක්ම**

**2030 දී දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් සඳහා ක්‍රියාත්මක සියලුම සංවර්ධන කාර්යයන් කාර්යක්ෂම හා සඵලදායිකර ගැනීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සහාය ලබා දීම.**

**මෙහෙවර**

**දුගීබව පිටුදැකීම සඳහා අඩු ආදායම්ලාභී ජනකොටස්වල උත්සහායන්ට උරදෙන සන්නිවේදන රටාවක් ගොඩනැගීම හා එ තුළින් සමෘද්ධි වැඩසටහනේ සංවර්ධනාත්මක හරයන් ජනතාවතුළ ප්‍රචලිත කිරීම, සමෘද්ධි වැඩසටහන ආශ්‍රිතව නව සංවර්ධන සාහිත්‍යයක් ගොඩනැගීමත්, අඩු ආදායම්ලාභී ජනතාවගේ රාජ්‍ය නොවන සංවිධානවල ස්වෙච්ඡා සේවකයින්ගේ, වෘත්තිකයින්ගේ හා දේශපාලන නායකත්වයේ අන්‍යෝන්‍ය අත්දැකීම් සමාජ සංවර්ධන ක්‍රියාවලිය ප්‍රගතිශීලීව ඉදිරියට ගෙනයාම සඳහා උචිත සංවාදයක් විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය භාවිතයෙන් ගොඩනැගීම**

**අරමුණ**

දිළිඳුකම පිටු දැකීමේ ජාතික වැඩසටහනට සෘජුවම වග කියන ආයතනය වන සමෘද්ධි සංවර්ධන වැඩසටහන වඩාත් ඵලදායි හා සඵලදායි ලෙස ජනතාව අතරට ගෙන යාමට පූර්ණ මාධ්‍ය දායකත්වය ලබා දීම.

සංඛ්‍යා සටහන-13.1

**සමස්ත ප්‍රගතිය පිළිබඳ සාරාංශය.**

| අනු අංකය | ව්‍යාපෘතියේනම | වෙන්කල මුදල (රු.මි) | ව්‍යාපෘති ගණන | භෞතික ප්‍රගතිය | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අවසන් කර ඇති ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මකවෙමින් පවතින ව්‍යාපෘති ගණන | ආරම්භකර ඇති ව්‍යාපෘති ගණන | | |
| 1. | සමෘද්ධිපුවත් අතිරේඛයපලකිරීම (සිංහල/දෙමළ) | 6.90 | 24 | 24 | | | 6.9 | 100% |
| 2. | සමෘද්ධිඋදානය (රූපවාහිනී වැඩසටහන) | 6.80 | 18 | 15 | | | 4.614 | 67% |
| 3. | ප්‍රකාශන (අත් පත්‍රිකා) | 10.95 | 5 | 5 | | | 2.4 | 22% |

## 13.2 සමෘද්ධි පුවත් අතිරේකය පලකිරීම (සිංහල/දෙමළ)

**හැදින්වීම**

සමෘද්ධි පුවත්පත සිංහල ( දිනමිණ පුවත් අතිරේකය ) හා දමිළ ( තිනකරන් පුවත් අතිරේකය ) මාධ්‍යයෙන් පල කිරීම. දුගී බව අවම කිරීමේ සංවර්ධන කාර්යයන්ට හා අඩු ආදියම්ලාභි ජන කොටස් වල උත්සහයන්ට උරදෙන සන්නිවේදන රටාවක් ගොඩ නගමින් සමෘද්ධි ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින් එහි සංවර්ධනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව ජනතාව අතරට ගෙන යාමට ජාතික මට්ටමේ පුවත් පතක , සංවර්ධන පුවත් ඇතුලත් පුවත්පත් අතිරේකය පල කෙරේ.

**ඉලක්කගත කණ්ඩායම.**

දුප්පත්කම අවම කිරීමේ ජාතික මෙහෙයට උරදෙමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතියෙන් මුද්‍රිත මාධ්‍ය මගින් ජනතාව අතරට ගෙනවිත් දැනුවත් කිරීම හා ප්‍රචාරණ කටයුත් මගින් එම වැඩසටහන් දිරිගන්වා ජනතාවට මෙන්ම එවැනි තත්වයන්ට පත්වීමට අපේක්ෂිත ජනතාවට දිරියක් වෙමින් ජනතාව සවිබල ගැන්වීමට උරදීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති සංගමය හා එක්ව දිනමින හා තිනකරන් පුවත්පත් වල අතිරේක වශයෙන් මාසකට වරක් පල කර බෙදා හැරීම.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය**

ප්‍රධාන කාර්යාලය

**අනුමත ප්‍රතිපාදන**

රුපියල් මිලියන 6.9

**ආරම්භ කළ දිනය**

2018 ජනවාරි

**අවසන් කළ දිනය**

2018 දෙසැම්බර්

**2018.12.31 දිනට වියදම**

රුපියල් මිලියන 6.9

**ව්‍යාපෘතියේ නිමැවුම**

| | | |
|---|---|---|
| ප්‍රමාණය | - | ටැබ්ලොයිඩ් |
| පිටු ගණන | - | පිටු 8 |
| අන්තර්ගතය | - | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල |
| කඩදාසි වර්ගය | - | 70 GSM |

**01 පිටුව** කාලීන විශේෂිත ඡායාරූපයක් සමඟ විශේෂිත පාඨ.

**02 පිටුව** ප්‍රාදේශීය තොරතුරු ( සමෘද්ධි සන්නිවේදකයින් මගින් )

**03 පිටුව** ගරු අමාත්‍යවරුන්ද ප්‍රමුඛ විශේෂ ආරාධිත ලිපි හා සම්මුඛ සාකච්ඡා.

**04 පිටුව** සමෘද්ධි ව්‍යාපෘතීන් මගින් සාර්ථක වූ මිනිසුන් පිළිබඳ කරන විශේෂ ලිපි හා වාර්තා

**05 පිටුව** සමෘද්ධි බැංකු ප්‍රවර්ධන හා ණය ඉතුරුම් විශේෂ වැඩසටහනක්.

**06 පිටුව** විශේෂිත සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ හඳුන්වා දීම හා ආදර්ශ ගම්මාන.

**07 පිටුව** ප්‍රාදේශීය වාර්තා - සමෘද්ධි සන්නිවේකයින් මගින් ප්‍රාදේශීය මට්ටමින් ලබා ගන්නා සංවර්ධන කාර්යයන් විශේෂ උත්සව පිළිබඳ ලිපි වාර්තා හා තොරතුරු.

**08 පිටුව** සමෘද්ධි සංවර්ධන ව්‍යාපාර ආශ්‍රිත විශේෂ ජයග්‍රහණ හා කුසලතා හඳුන්වා දීම.

*** වෙනත් - දෙමළ මාධ්‍යයෙන් මෙම පුවත්පත පරිවර්තනය කර තිනකරන් පුවත්පතේ අතිරේකයක් වශයෙන් පල කිරීමට කටයුතු කිරීම.**

**ලබාගත් සමාජ , ආර්ථික ප්‍රතිඵල**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳව ප්‍රජාව දැනුවත්වීම.

**ව්‍යාපෘතියට අදාල ඡායාරූප**






## 13.3 සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන

**හැදින්වීම**

මෙරට සංවර්ධන වැඩසටහන් අතර , ජාතික සංවර්ධන වැඩසටහනක් ලෙසින් ක්‍රියාවට නැංවෙමින් , ජන ප්‍රජාවගේ සුභසිද්ධිය උදෙසා සෘජුවම කටයුතු කරන ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහන වන්නේ සමෘද්ධි වැඩසටහනයි. දිවයින පුරා වෙසෙන අඩු ආදායම්ලාභින් නගා සිටුවීම උදෙසා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් සිදු වන මෙහෙවර පිළිබඳ පුළුල් ප්‍රචාරණයක් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. විද්‍යුත් මාධ්‍ය උපයෝගිකර ගනිමින් මෙම කටයුතු සාර්ථකව ඉටු කර ගත හැකි බැවින් රූපවාහිනි මාධ්‍ය මේ සඳහා උපයෝගිකර ගැනීම රටේ ජාතික නිෂ්පාදනයට සෘජුවම දායකවීම සඳහා මෙරට දුප්පත්කම අවම කිරීමේ ජාතික මෙහෙයට උරදීමට ක්‍රියාත්මක සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රචාරාත්මකව සහායවීම.

**ඉලක්කගත කණ්ඩායම.**

මෙරට දුප්පතුන් නගා සිටුවීම සඳහා විවිධ වූ වැඩසටහන් මාලාවක් ආර්ථික , සමාජ හා වෙනත් වශයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබේ. එහි ප්‍රතිඵල උපරිම ලෙස ලබා ගැනීමටනම් ප්‍රතිලාභින් මෙන්ම අඩු ආදායම්ලාභි පවුල් විශේෂයෙන්ම දැනුවත් කළ යුතුව ඇත. ඒ සඳහා විද්‍යුත් මාධ්‍යක් ලෙස මෙය භාවිතා වේ.

සති 52 ට ගැලපෙන ආකාරයට ප්‍රතිලාභින් , අඩු ආදායම්ලාභින් හා පොදු ජනතාවගෙන් වැඩි ප්‍රේක්ෂක සමූහයකට නැරඹීමට හැකිවන පරිදි විකාශන කාලය යොදා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

**ක්‍රියාත්මක ක්‍රමවේදය.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුලින් ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් මගින් ප්‍රජාව , ආර්ථික , සමාජීය , දේශපාලන , ශාරීරික , මානසික , භෞතික හා පාරිසරික සවිබල ගැන්වීම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විනාඩි 15 හෝ 30 ක පමණ රූපවාහිනි වැඩසටහනක් විකාශය කිරීම. දොරින් දොරට ගමින් ගමට , පලාතින් පලාතට , දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට තම අත්දැකීම් හුවමාරු කර ගැනීමට සුවිශේෂි වූ ක්‍රමවේදයක් නිර්මාණශීලිව සැලසීම තුලින් මානව ප්‍රජාවගේ ආර්ථික ඉලක්කයන් සපුරාලීමට අත්වැලක් වීම අරමුණ වේ.

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය-**
ප්‍රධාන කාර්යාලය මඟින්

**අනුමත ප්‍රතිපාදන-**
රුපියල් මිලියන 6.8

**ආරම්භ කළ දිනය-**
2018 ජනවාරි

**අවසන් කළ දිනය-**
2018 දෙසැම්බර්

**2018.12.31 දිනට වියදම-** රුපියල් මිලියන 4.614

**ව්‍යාපෘතියේ නිමැවුම**

1. හඳුන්වාදෙන වැඩසටහනට අදාල ප්‍රදේශයෙහි දිස්ත්‍රික්කයේ භෞතික හා ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීම.
2. වැඩසටහනට ගැලපෙන ගීතයක කොටසක්
3. ප්‍රදේශයේ රාජ්‍ය සංවර්ධන කටයුතු පිළිබවදව කෙටි සටහනක්
4. තොරාගත් ප්‍රතිලාභීන් සමග සාකච්ඡා කරමින් ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රදේශ අතර අත්දැකීම් හා ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
5. තොරාගත් ප්‍රතිලාභීන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ඉතිරි කිරීම වැඩසටහන සමග බද්ධව සිටින ආකාරය අදාල සමෘද්ධි බැංකුව සම්බන්ධ කෙටි හඳුන්වාදීමක්.

* ආරම්භක වැඩසටහන් කීපකදී ගරු අමාත්‍යතුමා , නියෝජ්‍ය අමාත්‍යතුමා , අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සම්මුඛ සාකච්ඡා මගින් වැඩසටහනට සම්බන්ධ කර ගැනීම.

**ලබාගත් සමාජ , ආර්ථික ප්‍රථිඵල**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තෙමේන්තුව මඟින් ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳව ප්‍රජාව දැනුවත්වීම.

## 13.4 සමෘද්ධි ප්‍රකාශන (අත්පත්‍රිකා) වැඩසටහන

**හැඳින්වීම**

සමෘද්ධි ව්‍යාපාරයේ විවිධ වූ සංවර්ධන වැඩසටහන් අලලා අත් පත්‍රිකා මුද්‍රණයකර හා එහි ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රජාව වෙත ගම් මට්ටමින් බෙදා හැරීමට කටයුතු කිරීම.

**ඉලක්කගත කණ්ඩායම.** -සමෘද්ධි ප්‍රතිලාභීන් සහ ලංකාවාසී සියලුම ප්‍රජාව

**ක්‍රියාත්මක කරන ලද ස්ථානය** - ප්‍රධාන කාර්යාලය

**අනුමත ප්‍රතිපාදන** - රු.මි. 10.95

**2018.12.31 දිනට වියදම** - රු.මිලියන 2.4

ව්‍යාපෘතියට අදාල ඡායාරූප













# 14. ක්ෂුද්‍ර මූල්‍ය (බැංකු) අංශයේ කාර්ය සාධනය

## 14.1 හැඳින්වීම

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භ වීමත් සමග එහි එක් අංශයක් ලෙස "ණය අංශය" ආරම්භ කෙරිණි. කාලීන වශයෙන් සිදු වූ වෙනස්කම් හේතුකොට ගෙන මෙම අංශය 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු" අංශය ලෙස නම් කරනු ලැබීය.

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය.

සමෘද්ධි සංවර්ධන වැඩසටහන පසුව කාලින අවශ්‍යතාවලට සරිලන අයුරින් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය පුළුල් කිරිමෙහිලා සහ දිළිඳුබව අවම කිරිම සඳහා සමාජ සාධාරණත්වය සහතික කිරිමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරිම උදෙසා වූ ප්‍රමුඛ අභිමතාර්ථයන් මුදුන්පත් කිරිමේ අරමුණින්, පවතින වාණිජ බැංකු පද්ධතිය විසින් සේවා සැපයිමෙහිදි ප්‍රමුඛත්වයක් නොදක්වන ලද අඩු ආදායම්ලාභීන් කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින්, දිළිඳුකම පිටුදැකිමේ අරමුණුවලට අනුගතවෙමින්, ප්‍රජා මුල මට්ටමින් ජනතාවගේ සකසුරුවම් පුරුද්ද වර්ධනය කිරිම, ප්‍රජාව ආර්ථික මට්ටමින් බලගැන්විම හා ඔවුනගේ මූල්‍ය අවශ්‍යතා සංතෘප්ත කිරිම මගින් ආදායම් වර්ධනය කිරිම සඳහා මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාගැනිමේ මූලික පරමාර්ථ ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතිය තුලින් සිදුකෙරේ. මෙම පද්ධතියට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය, ප්‍රාදේශිය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 331ක් සහ දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 ක් අයත් වේ.

ඒ අනුව පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හා ප්‍රජාමූල බැංකු සමිතිවල ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය බවට ක්ෂුද්‍ර මූල්‍ය අංශය පත්වූ අතර, ඉහත සඳහන් අරමුණු කරා එම ආයතන මෙහෙයවීම ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ වගකීම සහ කාර්ය භාරය බවට පත්විය.

**දර්ශනය**

**"ශ්‍රී ලංකාව තුළ වඩාත් නවීකරණය වූ ප්‍රබල හා ජනහිතකාමී වූ තිරසාර ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියක් බවට සමෘද්ධි බැංකු ජාලය පත් කිරීම"**

**මෙහෙවර**

**දුගී බවින් තොර සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීමේ උදාර අරමුණින්, දිළිඳු ප්‍රජාව යැපුම් මානසිකත්වයෙන් තොරව, සවිබල ගැන්වීම තුළින් ඔවුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා ඔප් නංවමින් ආර්ථික හා සාමාජීය වශයෙන් ස්වශක්තියෙන් නැගී සිටීම සඳහා ක්ෂුද්‍රමූල්‍යකරණ හා මූල්‍ය සාක්ෂරතාවය වෙත ළඟා කරවීම.**

## 14.2 ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කාර්යභාරය

1. බැංකු පද්ධතිය සඳහා නව ණයක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියලු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියලුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව විදුලි අත්වැල ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
13. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
14. ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය හා ව්‍යවසාය සංවර්ධනඅංශය මගින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් වලදී ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කරවීම.

**මේ අනුව ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය දෙයාකාරවේ.**

1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති වැඩසටහනට දායකත්වය ලබාදීම.
2. ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළ ක්‍රියාකාරීත්වය.

## 14.3 සමෘද්ධි ප්‍රජාමූල බැංකු වැඩසටහන

සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ආරම්භය අදියර 07 කින් ක්‍රියාත්මක වූ අතර 2018.12.31 දින වන විට උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක ඇතුලුව දිවයින පුරා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,073 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 331ක් ක්‍රියාත්මක වේ.

මේ අනුව බලන විට සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලෙස ආරම්භ වූ ශාඛා ජාලය මෙරට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ දීපව්‍යාප්තව විහිදී ඇති විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට කෙටි කාලයක් තුළදී පත්වී ඇති අතර සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ජාත්‍යන්තර මට්ටමින් ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුල කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇත. සුළු මූල්‍යකරණයේ දැවැන්තයින් අතර, කැපී පෙනෙන

ස්ථානයක් හිමි කරගෙන සිටින සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය, දිළිඳුකම පිටු දැකීමේ අරමුණුවලට අනුගත වෙමින් තැන්පතු ඒකරාශිකරණය අතින් විශේෂත්වයක් හිමි කරගෙන සිටින අතර, අඩු ආදායම් ප්‍රජාවගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා කුඩා ව්‍යාපාර සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවය ලබාදී ඇත. එසේම නව බැංකු තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණක ගත කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු හා අනුගතවෙමින් ක්ෂුද්‍රමූල්‍යකරණය තුළින් අඩුආදායම්ලාභී ප්‍රජාව සවිබලගැන්වීමේ මහඟු කර්තව්‍ය ඉටුකිරීමේ දී එහි පාදක ව්‍යුහය වශයෙන් “සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඉවහල් කරගනු ලබයි.

මෙම කාර්යය ඉටුකිරීම තුළින් ලඟාකරගත් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

## 14.3.1 බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභින් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවෙන අතර, ඒ තුලින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

**සංඛ්‍යා සටහන 14.1**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය -(2000-2018)**

| වර්ෂය | ගැහැණු | පිරිමි | එකතුව | පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය | වර්ධනය අනුපාතය % |
|---|---|---|---|---|---|
| 2000 | 943,142 | 628,094 | 1,571,236 | 326,300 | 26 |
| 2001 | 1,042,158 | 663,905 | 1,706,063 | 134,827 | 9 |
| 2002 | 1,149,226 | 716,833 | 1,866,059 | 159,996 | 9 |
| 2003 | 1,275,273 | 777,222 | 2,052,495 | 186,436 | 10 |
| 2004 | 1,351,769 | 806,470 | 2,158,239 | 105,744 | 5 |
| 2005 | 1,428,848 | 824,846 | 2,253,694 | 95,455 | 4 |
| 2006 | 1,516,985 | 853,604 | 2,370,589 | 116,895 | 5 |
| 2007 | 1,575,509 | 872,490 | 2,447,999 | 77,410 | 3 |
| 2008 | 1,641,872 | 859,900 | 2,501,772 | 53,773 | 2 |
| 2009 | 1,691,112 | 896,947 | 2,588,059 | 86,287 | 3 |
| 2010 | 1,830,840 | 970,693 | 2,801,533 | 213,475 | 8 |
| 2011 | 1,881,808 | 987,740 | 2,869,548 | 68,015 | 2 |
| 2012 | 2,079,173 | 1,078,546 | 3,157,719 | 288,171 | 9 |
| 2013 | 2,199,135 | 1,121,833 | 3,320,968 | 163,249 | 5 |
| 2014 | 2,389,133 | 1,214,461 | 3,603,594 | 282,626 | 8 |
| 2015 | 2,503,840 | 1,253,016 | 3,756,856 | 153,262 | 4 |
| 2016 | 2,543,403 | 1,248,042 | 3,791,445 | 34,589 | 1 |
| 2017 | 2,624,784 | 1,266,833 | 3,891,617 | 100,172 | 3 |
| 2018 | 2,680,394 | 1,276,500 | 3,956,894 | 65,277 | 2 |

